20 වන කාණ්ඩය
11 වන කලාපය

බදාදා
1982 ජුලි 7

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

මැදවච්චියේ මන්ත්‍රීතුමා සහ තවත් තිදෙනකු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නෙරපන ලදයි යන්න පිළිබඳ විශේෂ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

වාර්ෂික වාර්තා

පරිපූරක මුදල්

ජනාවාස (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත :

අවසර දෙන ලදුව පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්නා ලදී.

කල් තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 20
இல. 11

புதன்கிழமை
7 ஜூலை 1982

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

மதவாச்சிய அங்கத்தவரையும் ஏனையோர் மூவரையும் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியிலிருந்து நீக்கியதாகக் கூறப்படுவது பற்றிய தெரிகுழு அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ஆண்டறிக்கை

குறைநிரப்புத் தொகை

மக்கள் குடியிருப்பு (நீக்கல்) சட்டமூலம் :
சட்டமூலம் அனுமதியுடன் வாபஸ்பெறப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை

---

Volume 20
No. 11

Wednesday
7th July 1982

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT

**(Uncorrected)**

PRINCIPAL CONTENTS

REPORT OF SELECT COMMITTEE ON ALLEGED EXPULSION OF MEMBER FOR MEDAWACHCHIYA AND THREE OTHERS FROM THE SRI LANKA FREEDOM PARTY
ORAL ANSWERS TO QUESTIONS
ANNUAL REPORT
SUPPLEMENTARY SUPPLY
JANAWASA (REPEAL) BILL
Bill, by leave, withdrawn
ADJOURNMENT MOTION

2 — A 64318 — 2,975 (82/07)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව

பாராளுமன்றம்

# PARLIAMENT

1982 ජූලි 7 වන බදාදා

புதன்கிழமை, 7 ஜூலை 1982

*Wednesday, 7th July 1982*

අ. භා. 3 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [අල් හාජ් එම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி. ப. 3 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [அல்ஹாஜ் எம். அப்துல் பாகீர் மாகார்] தலைமை வகித்தார்கள்.

*The Parliament met at 3 p.m.,* MR. SPEAKER (AL HAJ M. ABDUL BAKEER MARKAR) *in the Chair.*

---

## මැදවච්චියේ මන්ත්‍රීතුමා සහ තවත් තිදෙනකු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නෙරපන ලදැයි යන්න පිළිබඳ විශෙෂ කාරක සභාව

மதவாச்சிய அங்கத்தவர் திரு. மைத்திரிபால சேனநாயக்க அவர்களும் ஏனைய மூவரும் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியிலிருந்து வெளியேற்றப்பட்டது பற்றி விசாரித்து அறிக்கை செய்ய நியமிக்கப்பட்ட தெரி குழுவினது அறிக்கை

## REPORT OF SELECT COMMITTEE ON ALLEGED EXPULSION OF MEMBER FOR MEDAWACHCHIYA AND THREE OTHERS FROM THE SRI LANKA FREEDOM PARTY

**ලලිත් ඇතුලත් මුදලි මහතා (වෙළඳ හා නාවුක කටයුතු ඇමතිතුමා)**

*(திரு. லலித் அத்துலத்முதலி—வர்த்தக, கப்பற்சேவை அமைச்சர்)*

(Mr. Lalith Athulath Mudali—Minister of Trade & Shipping)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රීපාල සේනානායක මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. පී. විජේසිරි මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. හලීම් ඉෂාක් මහතා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පහ කරනු ලැබූ බව පිළිබඳව විභාග කොට වාර්තා කිරීම සඳහා පත් කරන ලද විශෙෂ කාරක සභාව නිකුත් කළ විශෙෂ කාරක සභාවේ කටයුතු හා සාක්ෂ්‍ය සටහන් අන්තර්ගත වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ඩී. ඊ. තිලකරත්න මහතා (වැඩබලන පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා)**

*(திரு. டீ. ஈ. திலகரத்ன—பதில் பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சர்)*

(Mr. D. E. Tillekeratne—Acting Minister of Parliamentary Affairs & Sports)

On behalf of the Leader of the House of Parliament, I move,

"That the Report of the Select Committee appointed to inquire into and report on the alleged expulsion of Mr. Maithripala Senanayake, Mr. Anura Bandaranaike, Mr. R. P. Wijesiri and Mr. A. M. Haleem Ishak, Members of Parliament, from the Sri Lanka Freedom Party, be printed and a copy placed in the Library."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*Ordered that the Report be printed.*

## පෙත්සම්

மனுக்கள்

## PETITIONS

**එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා (නැගෙනහිර කොළඹ—නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

*(திரு. எட்மன்ட் சமரவிக்ரம—கொழும்பு கிழக்கு உப குழுத் தலைவர்)*

(Mr. Edmund Samarawickrema—Colombo East—Deputy Chairman of Committees)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම ඉදිරිපත් කරමි. (i) කොළඹ 5, පොල්හේන්ගොඩ පාරේ, අංක 22/246 හි පදිංචි ඩී. එස්. කරන්නාගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද 1982. 3. 25 දින දරණ පෙත්සම.

(ii) දෙහිවල, ගල්වල පාරේ අංක 182 හි පදිංචි එම්. පී. ෆ්‍රනාන්ඩෝ මහතා විසින් ඉදිරිපත් කරන ලද 1982. 5. 17 දින දරණ පෙත්සම.

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා** (අවිස්සාවේල්ල)

*(திரு. எம். டீ. பிரேமரத்ன—அவிசாவலை)*

(Mr. M. D. Premaratne—Avissawella)

ගරු කථානායකතුමනි, හංවැල්ල, දිද්දෙනියේ අංක 109 හි පදිංචි ජී. ඩී. ලිවේරිස් මහතා විසින් ඉදිරිපත් කරන ලද 1982. 5. 23 දින දරණ පෙත්සම මම ඉදිරිපත් කරමි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ගාල්ල)

*(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)*

(Dr. W. Dahanayake—Galle)

I present a petition from Mr. R. A. Razik of No. 48, Sir Razik Fareed Mawatha, Negombo, dated 24.5.1982.

මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

*பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Ordered to be referred to the Public Petitions Committee.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ඩබ්ලිව්. ගුරුසිංහ මහතා, සතොස ගබඩා පාලක : යළි සේවයට පමුණුවීම
*திரு. டபிள்யு. குருசிங்க, களஞ்சியப் பொறுப்பாளர், கூ. மொ. நிதி : திரும்ப வேலைக்கமர்த்தல்*

**MR. W. GURUSINGHE, STOREKEEPER, CWE : REINSTATEMENT**

104/82 (2)

**4. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)*
**(Dr. W. Dahanayake—Galle)**

වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) අවුරුදු 20 ක කාලයක් සතොස ගබඩා පාලකයකුව සිටි ගාල්ලේ හිරිඹුර හරස් පාරේ අංක 76/1ඒ දරන නිවසේ පදිංචි ඩබ්ලිව්. ගුරුසිංහ මහතා, භාණ්ඩ අඩුවීමක් උඩ 1981 ජනවාරි 9 වැනි දින වැඩ තහනමට යටත් කරනු ලැබූ බැව් එතුමා දන්නේද? (ආ) මේ පිළිබඳව පරීක්ෂණයක් නොපැවැත්වූයේ මන්ද? ගුරුසිංහ මහතාට චෝදනා පත්‍රයක් භාර නොදුන්නේ මන්ද? (ඇ) ඔහු අවුරුද්දකටත් අධික කාලයක් වැටුප් රහිතව තබා ඇත්තේ මන්ද? (ඈ) (i) සියලුම හිඟ වැටුප් ආදිය සහිතව ගුරුසිංහ මහතා යළි සේවයට පමුණුවීමට එතුමා පියවර ගන්නේද? (ii) පියවර නොගන්නේ නම්, ඒ මන්ද?

*வர்த்தக, கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா: (அ) பொருள்கள் குறைவுபாடுகளின் காரணமான குற்றச் சாட்டின் பேரில் 1981 ஜனவரி 9 ஆந் தேதி கூ. மொ. ஸ்தாபனத்தில் 20 வருடங்கள் களஞ்சியப் பொறுப்பாளராகச் சேவையாற்றிய காலி, ஹிரிம்புர குறுக்கு ரோட் 76/1ஏ இலக்கத்தில் வசிக்கும் திரு. டபிள்யு. குருசிங்க என்பவர் வேலை இடைநிறுத்தம் செய்யப்பட்டுள்ளார் என்பதை அவர் அறிவாரா? (ஆ) ஏன் இதுகுறித்து விசாரணை நடாத்தவில்லை? திரு. குருசிங்கவுக்கு ஏன் குற்றப்பத்திரிகை கொடுக்கவில்லை? (இ) ஒரு வருடத்திற்கு மேலாக ஏன் அவர் சம்பளமில்லாமல் வைக்கப்பட்டுள்ளார்? (ஈ) (i) திரு. குருசிங்கவை சகல சம்பள பாக்கிகளுடன் திரும்பவும் வேலைக்கமர்த்த அவர் நடவடிக்கை எடுப்பாரா? (ii) இல்லையேல், ஏன்?*

asked the Minister of Trade and Shipping : (*a*) Is he aware that Mr. W. Gurusinghe of 76/1 A. Hirimbura Inn Road., Galle, who has been a storekeeper in the C.W.E. for 20 years, had been interdicted on 9th January 1981 on account of an alleged shortage of goods ? (*b*) Why has no inquiry been held, and why has no charge sheet been given to Mr. Gurusinghe ? (*c*) Why has he been placed for over a year on no-pay ? (*d*) (i) Will he take steps to reinstate Mr. Gurusinghe with full arrears of pay, etc. ? (ii) If not, why ?

**ලලිත් ඇතුලත් මුදලි මහතා**
*(திரு. லலித் அத்துலத்முதலி)*
(Mr. Lalith Athulath Mudali)

(අ) ඔව්. (ආ) මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඇත. ඒ අනුව ඔහුට රු. 3,613.45 ක අධිභාරයක් පණවා ඇති අතර එම තීරණයට විරුද්ධව ගුරුසිංහ මහතා අභියාචනයක් ඉදිරිපත් කර ඇත. චෝදනා පත්‍රයක් භාර දෙනුයේ මෙම අධිභාරය ගෙවීමට අපොහොසත් වුවහොත් පමණි. (ඇ) සතොස තොග අඩුමානයක් සම්බන්ධව බලපැවැත්වෙන විනය නීතිරීති අනුව වැඩ තහනම් කිරීමකට ලක්වූ සේවකයෙකුට වැඩ තහනම්ව සිටින කාලසීමාව තුළදී වැටුප් ගෙවනු නොලැබේ. (ඈ) (i) ඉහත සඳහන් (ආ) අනුව පැන නොනගී. (ii) පැන නොනගී.

### එච්. වී. ජී. ගුණසේන මහතා : අර්ථසාධක මුදල්
*திரு. எச். வி. ஜீ. குணசேன : ஊழியர் சேம நிதி*

**MR. H. V. G. GUNASENA : EPF DUES**

113/82/ (2)

**5. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
**(Dr. W. Dahanayake)**

කම්කරු ඇමතිතුමාගේ ඇසූ ප්‍රශ්නය : (අ) ගාල්ලේ සර්කියුලර් පාරේ අංක 122/ඒ දරන නිවසේ පදිංචි එච්. වී. ජී. ගුණසේන මහතාට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (අංකය : 102/ජී/1117) ගෙවීමට එතුමා පියවර ගන්නේද? (ආ) පියවර නොගන්නේ නම්, ඒ මන්ද?

*தொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) 102/ஜி/1117 இலக்கம் கொண்டவரும் 122/ஏ சேர்க்குலர் ரோட், காலி என்ற முகவரியினருமாகிய திரு. எச். வி. ஜீ. குணசேன என்பவருக்குரிய ஊழியர் சேமலாப நிதியைக் கொடுப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஆ) இல்லையேல் ஏன்?*

asked the Minister of Labour : (*a*) Will he take steps to pay the E.P.F. due to Mr. H. V. G. Gunasena, 122/A, Circular Road, Galle, No. 102/G/1117 ? (*b*) If not, why ?

**එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (නියෝජ්‍ය කම්කරු ඇමතිතුමා)**
*(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா—தொழில் பிரதி அமைச்சர்)*
(Mr. M. Joseph Michael Perera—Deputy Minister of Labour)

(අ) අංක 102/ජී/1117 දරන එච්. වී. ජී. ගුණසේන මහතාට හිමි සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ දැනට මත් ගෙවා ඇත. (ආ) පැන නොනගී.

### එච්. ඒ. සයිමන් මහතා : යළි සේවයට පැමිණවීම
*திரு. எச். ஏ. சைமன் : ஓய்வு பெறல்*

**MR. H. A. SIMON : RETIREMENT**

116/82 (2)

**6. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Mr. W. Dahanayake)

සෞඛ්‍ය ඇමතිතුමාගේ ඇසූ ප්‍රශ්නය : (අ) (i) දෙපාර්තමේන්තු ප්‍රධානියා කියන පරිදි සයිමන් මහතාගේ දෙපාර්තමේන්තු ලිපිගොනුව සොයා ගැනීමට නොමැති බැවින් පෝද්දල "සම්පත්" නිවසේ පදිංචි එච්. ඒ. සයිමන් මහතා අවුරුදු 57 ක් වයස් ගතවී ඇතද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔහු දරන ගාල්ලේ රෝහලේ කම්කරු තනතුරෙන් ඔහුට විශ්‍රාම ගැනිමට අවසර නොදෙන බවත් ; (ii) අදාළ ලිපි ගොනුව අවුරුදු පහකටත් වැඩි කාලයක් තිස්සේ සොයා ගැනිමට නොමැති බවත් ; එතුමා දන්නේද? (ආ) එසේ නම්, අවුරුදු 5 ට වැඩි කාලයක් මුළුල්ලේ අලුත් ලිපිගොනුවක් විවෘත නොකළේ මන්ද? (ඇ) අවුරුදු 5 ට වැඩි කාලයක් තුළ ඔහුගේ වැටුප් වර්ධක ඔහුට ගෙවා නොමැති බැව් එතුමා දන්නේද? (ඈ) (i) මේ කරුණ තවත් ප්‍රමාද නොකර තිම්කර සයිමන් මහතාට සහනය සලසන ලෙසට එතුමා අධ්‍යක්ෂට නියෝග කරන්නේද? (ii) නියෝග නොකරන්නේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) 'சம்பத்', போத்தலை என்ற முகவரியினராகிய திரு. எச். எ. சைமன் என்பவர் 57 வயதாகியும் திணைக்களத் தலைவரின்படி திரு. சைமனின் திணைக்களக் கோவை தவறிவிட்டபடியால் காலி ஆசுப்பத்திரியில் ஒரு தொழிலாளி என்ற பதவியிலிருந்து ஓய்வு பெற அவர் அனுமதிக்கப்படவில்லை என்பதையும்; (ii) ஐந்து ஆண்டுகளுக்கு அதிகமான காலமாகவே இக்கோவை தவறிவிட்டதாகத் தெரிகிறதென்பதையும்; அவர் அறிவாரா? (ஆ) அவ்வாறாயின் 5 ஆண்டுகளுக்கும் மேலாக அவருக்கான புதிய கோவை ஒன்று ஏன் வழங்கப்படவில்லை? (இ) 5 ஆண்டுகளுக்கும் மேலாக அவரது சம்பள உயர்வுகள் வழங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (ஈ) (i) மேலும் தாமதமின்றி இவ்விடயத்தை முடிவுபடுத்தித் திரு. சைமனுக்கு உரிய நிவிர்த்தி வழங்கும்படி பணிப்பாளருக்குக் கட்டளையிடுவாரா? (ii) இல்லையேல், ஏன்?*

asked the Minister of Health : (*a*) Is he aware (i) that Mr. H. A. Simon of " Sampath ", Poddala, is not allowed to retire from his post as labourer, Galle Hospital, although he is 57 years of age, because, according to the head of the department, Mr. Simon's departmental file is missing ; (ii) that the file was found to be missing over five years ago ? (*b*) If so, why was not a new file made for him for over 5 years ? (*c*) Is he aware that his increments have not been given to him for over 5 years ? (*d*) (i) Will he order the Director to finalize this matter and grant Mr. Simon due redress without further delay ? (ii) If not, why ?

.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු (සෞඛ්‍ය ඇමතිතුමා)**
*(டாக்டர் ரஞ்சித் அத்தபத்து—சுகாதார அமைச்சர்)*
(Dr. Ranjith Atapattu—Minister of Health)

(*a*) (i) No. (ii) Yes. (*b*) Instructions have been issued to open a new personal file. (*c*) Yes. (*d*) (i) Yes. (ii) Does not arise.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 9.

**හරින්ද කොරයා මහතා (නියෝජ්‍ය රාජ්‍ය පරිපාලන ඇමතිතුමා)**
*(திரு. ஹரிந்திர கொறயா—பதில் பொது நிர்வாக அமைச்சர்)*
(Mr. Harindra Corea—Acting Minister of Public Administration)

I ask for two weeks' time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනක දී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 11.

**හරින්ද කොරයා මහතා**
*திரு. ஹரிந்திர கொறயா)*
(Mr. Harindra Corea)

I ask for one month's time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනක දී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
***Question ordered to stand down.***

**ස්වයං රැකියා යෝජනා ක්‍රම**
*சுயதொழில் வாய்ப்புத் திட்டம்*
**SELF-EMPLOYMENT PROJECTS**

75/82 (2)

1. **අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන ලක්ෂ්මන් ජයකොඩි මහතා—අත්තනගල්ල—වෙනුවට)
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலிய-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்—திரு. லக்ஷமன் ஜயக்கொடி—அத்தனகல்ல சார்பாக)*
(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya on behalf of Mr. Lakshman Jayakody—Attanagalla)

යෞවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය විසින් ස්වයං රැකියා ලබාදීම පිණිස ක්‍රියාත්මක කෙරෙන වැඩ පිළිවෙල සම්බන්ධව පහත සඳහන් විස්තර සපයනවාද? (i) ආරම්භ කර ඇති යෝජනා ක්‍රම සහ ආරම්භ කළ දිනයන්, (ii) එම යෝජනා ක්‍රම සඳහා රැකීරක්ෂා විරහිත අයවලුන් බඳවා ගන්නා ක්‍රමය, (iii) එම යෝජනා ක්‍රම සඳහා තරුණයින් සහභාගි කරවාගන්නා ක්‍රමය, (ආ) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද?

*இளைஞர் அலுவல்கள், தொழில்வசதி அமைச்சரும் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) இளைஞர் அலுவல்கள், தொழில்வசதி அமைச்சு மூலம் சுயதொழில் வாய்ப்பினைப் பெற்றுக்கொடுப்பதற்காகச் செயற்படுத்தப்படும் திட்டம் தொடர்பாகக் கீழ்க்காணும் விபரங்களைக் கூறுவாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(i) தொடங்கப்பட்டுள்ள திட்டங்களும் இவை தொடங்கிய திகதிகளும், (ii) இத்திட்டங்களில் தொழில்வசதியற்றவர்களை சேர்த்துக்கொள்ளும் வழிவகை; (iii) இத்திட்டங்களில் இளைஞர்களை ஈடுபடுத்தும் வழிவகை, (ஆ) இல்லையேல், ஏன்?

asked the Minister of Youth Affairs and Employment and Minister of Education: (*a*) Will he furnish the following particulars in regard to the self-employment programme that is being implemented by the Ministry of Youth Affairs and Employment: (i) the projects so far commenced and their dates of commencement; (ii) the method adopted for the recruiting of unemployed persons for these projects; (iii) the method of obtaining the participation of youth for these programmes? (*b*) If not, why?

**ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යෞවන කටයුතු හා රැකිරක්ෂා ඇමතිතුමා)**

*(திரு. காமினி அத்துக்கோறள—இளைஞர் அலுவல்கள், தொழில்வாய்ப்புப் பிரதி அமைச்சர்)*

**(Mr. Gamini Atukorale—Deputy Minister of Youth Affairs & Employment)**

(අ) (i) 1. සංචාරක සිගරැට් කරත්ත ව්‍යාපෘතිය—1978 ජූලි මාසය; 2. ස්වයං රැකියා වෙත යොමු කිරීමේ ප්‍රාදේශීය වැඩ සටහන—1979 මැයි; 3. ග්‍රාමීය හස්ත කර්මාන්ත සංවර්ධන වැඩ සටහන්—1980 ජූලි; 4. වෘත්තීය පුහුණු වැඩ සටහන—1980 සැප්තැම්බර්; 5. ට්‍රයිසිකල් රික්ෂෝ වැඩ සටහන—1980 ජූනි (දැනට ව්‍යාප්ත නොකෙරේ) 6. ස්වයං රැකියා නිලධාරි සම්බන්ධීකරණ දිස්ත්‍රික් මට්ටමේ සම්මන්ත්‍රණ 1980 ජූනි; 7. සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සමුපකාරය—1981 ජූලි; (ii) ජාතික සේවා ව්‍යාපාර සහභාගිකයින්, යෞවන සමාජ සහ ශිෂ්‍ය සමාජ සාමාජිකයින් සහ මෙම වැඩ සටහන් සඳහා සෘජුව අයදුම් කරන වයස 17-29 ඛණ්ඩයේ අවිවාහක තරුණ තරුණියන්, සම්මුඛ පරීක්ෂණයකින් පසු දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරීන් මගින් බඳවා ගනු ලැබේ. (iii) පුහුණු මධ්‍යස්ථාන සහ ප්‍රාදේශික මට්ටමින් පැවැත්වෙන පුහුණු වැඩ සටහන් සහ සම්මන්ත්‍රණ ආශ්‍රයෙන් ද ණය පහසුකම්, අලෙවි පහසුකම්, උපදේශක සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල සේවය ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය ලබා දීමෙන් ද, වැඩ සටහනට තරුණ තරුණියන් සහභාගි කෙරේ. (ආ) පැන නොනඟී.

### සමුපකාර සභාපතිවරු සහ අධ්‍යක්ෂවරු : ඉවත් කිරීම හෝ අස් කිරීම

*கூட்டுறவுத் தலைவர், பணிப்பாளர் : நீக்கப்பட்டோர், விலக்கப்பட்டோர்*

### CHAIRMEN AND DIRECTORS OF CO-OPERATIVES REMOVED FROM OFFICE OR DISMISSED

79/82 (2)

2. **අනුර බණ්ඩාරනායක මහතා** (ලක්ෂ්මන් ජයකොඩි මහතා වෙනුවට)

*(திரு. அனுர பண்டாரநாயக்க—திரு. லக்ஷ்மன் ஜயக்கொடி சார்பாக)*

**(Mr. Anura Bandaranaike—on behalf of Mr. Lakshman Jayakody)**

**ආහාර හා සමුපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය:** (අ) 1979 ජනවාරි 01 දින සිට 1981 ඔක්තෝබර් 31 වෙනිදා දක්වා වූ කාලය තුළදී සමුපකාර සභාපතිවරු හා අධ්‍යක්ෂවරු කී දෙනෙක් ඉවත් කර හෝ අස් කර ඇත්ද? (ආ) (i) එසේ අස් කිරීමට හේතු සහ ඔවුන්ට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍ර වෙන වෙනම ඉදිරිපත් කරනවාද? (ii) නොඑසේ නම්, ඒ මන්ද? (ඉ) (i) එසේ අස්කළ සභාපතිවරුන් හෝ අධ්‍යක්ෂවරුන් අස් කිරීමට තුඩු දුන් හේතුන් සම්බන්ධව පරීක්ෂා කර ඇත්නම් ඒවායේ වාර්තා ඉදිරිපත් කරනවාද? (ii) නොඑසේ නම්, ඒ මන්ද? (ඊ) එම අයට දී ඇති දඬුවම් මොනවාද? (උ) එම අය අයිතිවන මැතිවරණ කොට්ඨාශ මොනවාද?

*உணவு, கூட்டுறவு அமைச்சரைக் கேட்ட வினா: (அ) 1979 ஜனவரி 01 ஆந் திகதி முதல் 1981 ஒக்ரோபர் 31 ஆந் திகதி வரையிலான காலப்பகுதியில் பதவியிலிருந்து நீக்கப்பட்ட அல்லது விலக்கப்பட்ட கூட்டுறவுச் சங்கத்தலைவர்களினதும் பணிப்பாளர்களினதும் எண்ணிக்கை யாது? (ஆ) (i) இவர்கள் விலக்கப்பட்டதற்கான காரணங்களையும் இவர்களுக்கெதிராக சுமத்தப்பட்டுள்ள குற்றப் பத்திரிகைகளையும் வெவ்வேறாகச் சமர்ப்பிப்பாரா? (ii) இன்றேல், ஏன்? (இ) (i) இவ்வாறாக கூட்டுறவுச் சங்கத் தலைவர்களும் பணிப்பாளர்களும் விலக்கப்பட்டதற்கான காரணங்கள் தொடர்பான விசாரணை நடத்தப்பட்டிருப்பின் அதன் அறிக்கைகளை அவர் சமர்ப்பிப்பாரா? (ii) இன்றேல், ஏன்? (ஈ) இவர்களுக்கு வழங்கப்பட்டுள்ள தண்டனை என்ன? (உ) இவர்கள் எந்தத் தேர்தல் தொகுதிகளைச் சேர்ந்தவர்கள்?*

asked the Minister of Food and Co-operatives: (*a*) How many chairmen or directors of co-operatives have been removed or dismissed during the period 01st January 1979 to 31st October 1981? (*b*) (i) Will he table separately the reasons for their dismissal and the charge sheets issued against them? (ii) If not, why? (*c*) (i) if the reasons for the dismissal of these chairmen or directors have been inquired into, will he table the relevant inquiry reports? (ii) If not why? (*d*) What were the punishments given them? (*e*) To which electorate do they belong?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (වැඩ බලන ආහාර හා සමුපකාර ඇමතිතුමා)**

*(திரு. சரத்சந்திர ராஜகருணா—பதில் உணவு, கூட்டுறவு அமைச்சர்)*

**(Mr. Sarathchandra Rajakaruna—Acting Minister of Food & Co-operatives)**

As the Answer is a long one, I am tabling it, Sir.

සභාමේසය මත තබන ලද පිළිතුර:

*சபாபீடத்தில் வைக்கப்பட்ட மறுமொழி :*

***Answer tabled :***

(*a*) 14 presidents and 18 directors of co-opertive societies were removed from office. (*b*) (i) The charge sheets are separately annexed* and the reasons for their removal are contained in the charge sheets. However, the Vice - President of Colombo North Co - operative Society had filed action in the Appeal Court, and as the file containing the charge sheet had been forwarded to the courts, his charge sheet cannot be annexed. (ii) Does not arise. (*c*) (i) No. (ii) The charges have been framed according to the findings of the investigations but

---

* හැන්සාඩ් කාර්යාලයේ ඇත.

* ஹன்சாட் அலுவலகத்தில் வைக்கப்பட்டுளது.

*Filed in Hansard Office.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

certain matters such as losses to societies which have to be recovered will be subject to arbitration and thereafter appeal. The relevant reports are required for the completion of those inquiries, and they cannot therefore be tabled in Parliament. (*d*) The presidents and the directors were removed from their respective offices. Action is being pursued to recover the losses and other dues from the persons concerned. 35 cases have already been referred for arbitraties. (*e*) Devinuwara, Teldeniya, Colombo Central, Katana, Matale, Kalutara, Beruwala, Wellawaya, Kalawewa, Batticaloa, Kayts, Paddiruppu, Mannar, Negombo and Kalkudah.

## මහවැලි සංවර්ධන කඩිනම් වැඩ පිළිවෙල: පරිසරය අධ්‍යයනය

*மகாவலி அபிவிருத்தித் திட்டம்: சூழல் பற்றிய ஆய்வு*

## ACCELERATED MAHAWELI DEVELOPMENT SCHEME: ENVIROMENTAL STUDY

83/82 (2)

3. අනුර බණ්ඩාරනායක මහතා (ලක්ෂ්මන් ජයකොඩි මහතා වෙනුවට)

*(திரு. அனுர பண்டாரநாயக்க—திரு. லக்ஷ்மன் ஜயக்கொடி சார்பாக)*

(Mr. Anura Bandaranaike—on behalf of Mr. Lakshman Jayakody)

ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබද ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මහවැලි සංවර්ධන කඩිනම් වැඩ පිළිවෙලේ පරිසරය කෙරෙහි වන බලපෑම් සම්බන්ධව අධ්‍යයනය කරන ලද ඇමෙරිකානු සමාගම කුමක්ද? (ආ) මෙම අධ්‍යයනය සඳහා යම්කිසි මුදලක් ගෙවන ලද්දේ නම් ඒ කා විසින් ද? මුදල කීයද? (ඉ)(i) එම වාර්තාව සභාගත කරන වාද? (ii) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද?

*காணி, காணி அபிவிருத்தி அமைச்சரும், மகாவலி அபிவிருத்தி அமைச்சரும் ஆனவரைக் கேட்ட வினா: (அ) மகாவலி அபிவிருத்தித் திட்டம் சூழலைப் பாதிப்பது தொடர்பாக ஆய்வு நடத்திய அமெரிக்க கம்பெனியின் பெயர் என்ன? (ஆ) இந்த ஆய்வுக்கு ஏதாவது பணம் கொடுக்கப்பட்டதாயின் இப்பணத்தைக் கொடுத்தவர் யார்? தொகை என்ன? (இ) (i) இந்த அறிக்கையைச் சபையில் சமர்ப்பிப்பாரா? (ii) இன்றேல், ஏன்?*

asked the Minister of Lands and Land Development and Minister of Mahaweli Development: (*a*) What was the American Company that made a study of the influences that the Accelerated Mahaweli Development Scheme would have on the environment? (*b*) If a payment had been made for this study, who paid it and how much? (*c*) (i) Will the report be tabled? (ii) If not, why?

**ගාමිණී දිසානායක මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබද ඇමතිතුමා)**

*(திரு. காமினி திசாநாயக்க—காணி, காணி அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி அமைச்சரும்)*

(Mr. Gamini Dissanayake—Minister of Lands & Land Development and Minister of Mahaweli Development).

A study was carried out by Tibbets-Abbett-McCarthy-Stratton under a contract with US AID who financed the study under the Technical Assistance Grant.

I do not know the payments made by the US AID as it was entirely an external payment.

A copy of the report has been made available to the Parliament Library and can be referred to by any Member of Parliament. The hon. Member for Attanagalla should go to the Parliament Library once in a way and read it.

## දුම්රිය බලපත්‍ර පාවිච්චි කරමින් දුම්රියෙන් සහ පෞද්ගලික කෝච්රථවලින් ගමනාගමනය

*புகையிரதம்—தனியார் பஸ் பிரயாணத்துக்கு புகையிரத இலவசப் பிரயாண ஆணைச் சீட்டுக்கள்*

## RAIL – CUM – PRIVATE COACH TRAVEL ON RAILWAY WARRANTS

93/82 (2)

7. පී. ගනේෂලිංගම් මහතා (පදිරිප්පු)—වී. ආනන්ද සන්ගරී මහතා —(කිලිනොච්චි—වෙනුවට)

*(திரு. பி. கணேசலிங்கம்—பட்டிருப்பு—திரு. வி. ஆனந்த சங்கரி—கிளிநொச்சி சார்பாக)*

(Mr. P. Ganeshalingam—Paddiruppu—on behalf of Mr. V. Anandasangary—Kilinochchi)

ප්‍රවාහන කටයුතු පිළිබද ඇමතිතුමා සහ ගමනාගමන මණ්ඩල පිළිබද ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබද ඇතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දුම්රිය බලපත්‍ර පාවිච්චි කළ හැක්කේ දුම්රියෙන් පමණක් ගමන් කිරීමට බැව් එතුමා දන්නේද? (ආ) (i) දුම්රිය මාර්ග නොමැති ප්‍රදේශවල දුම්රිය බලපත්‍ර පාවිච්චි කර සම්පූර්ණ ගමනක් හෝ යම්කිසි ගමනක කොටසක් පුද්ගලික කෝච් රථවලින් යාමට අවසර දීමට එතුමා ක්‍රියා කරන්නේද (ii) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද?

*போக்குவரத்து அமைச்சரும், போக்குவரத்துச் சபைகள் அமைச்சரும், தனியார் பஸ் போக்குவரத்து அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) புகையிரத இலவசப் பிரயாண ஆணைச்சீட்டுகளை புகையிரதப் பிரயாணங்களுக்கு மட்டும் தான் பாவிக்கமுடியுமென்பதை அவர் அறிவாரா? (ஆ) (i) புகையிரதத்தின் மூலம் முழுதாகவோ, பகுதியாகவோ பிரயாணம் பண்ணமுடியாத இடங்களுக்கு, புகையிரத இலவசப் பிரயாண ஆணைச்சீட்டுகளைப் பாவித்துத் தனியார் பஸ்மூலம் பிரயாணம் செய்ய அனுமதிப்பாரா? (ii) இன்றேல், ஏன்?*

asked the Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport: (*a*) Is he aware that railway warrants could be used only for travel by train? (*b*) (i) Will he take steps to permit travel by private coaches with railway warrants for a full journey or part of any journey not covered by railway? (ii) If not, why?

**එච්. කුලරත්න මහතා (ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. எச். குலரத்ன—போக்குவரத்து பிரதி அமைச்சர்)*

(Mr. H. Kularatne—Deputy Minister of Transport)

(*a*) Yes. (*b*) (i) A railway warrant entitles its holder to travel by train only. Private bus operators cannot be compelled to grant travel concessions to any section of the community. (ii) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රාජකාරි දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම: කොටුව දුම්රිය ස්ථානයෙහි වෙනම ඒකකයක්**

*கடமைக்கான பயணச்சீட்டு: கோட்டைப் புகையிரத நிலையத்தில் தனிக்கூறு*

**DUTY TRAVEL TICKETS: SEPARATE UNIT AT FORT RAILWAY STATION**

94/82 (2)

**8. පී. ගනේෂලිංගම් මහතා—(වී. ආනන්දසන්ගරී** මහතා වෙනුවට)

*(திரு. பீ. கணேசலிங்கம்—திரு. வீ. ஆனந்தசங்கரி சார்பாக)*

(Mr. P. Ganeshalingam—on behalf of Mr. V. Anandasangary)

ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රාජකාරි දුම්රිය ප්‍රවේශපත් ලබා ගැනීම පිණිස වෙනමම ඒකකයක් කොටුව දුම්රිය ස්ථානයේ නොමැති බැව් එතුමා දන්නේද? (ආ) රාජ්‍ය සේවකයින් සම්බන්ධයෙන් රාජකාරි දුම්රිය ප්‍රවේශපත් කල් ඇතිව වෙන් කර ගැනීමට සහ නිකුත් කිරීමට වෙනමම ඒකකයක් ඇති කිරීමට එතුමා පියවර ගන්නේද?

*போக்குவரத்து அமைச்சரும், போக்குவரத்துச் சபைகள் அமைச்சரும், தனியார் பஸ் போக்குவரத்து அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) கடமைக்கான பிரயாணத்திற்குரிய பயணச் சீட்டுக்களை வாங்க கோட்டைப் புகையிரத நிலையத்தில் தனியான கூறு இல்லையென்பதை அவர் அறிவாரா? (ஆ) அரசாங்க ஊழியர்கள் கடமைக்கான பிரயாணப் பயணச் சீட்டை பதிவு செய்யவும் வழங்கவும் தனிக் கூறு ஒன்றை அமைக்க நடவடிக்கை எடுப்பாரா?*

**asked the Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport: (*a*) Is he aware that there is no separate unit at the Fort Railway Station to obtain duty travel tickets? (*b*) Will he take steps to have a separate unit to book and issue duty travel tickets to public servants?**

**එච්. කුලරත්න මහතා**

*( திரு. எச். குலரத்ன)*

(Mr. H. Kularatne)

**(*a*) There is a separate counter at the Fort Railway Station for issue of tickets to warrant holders. Persons travelling on duty are also warrant holders. (*b*) Does not arise in view of answer at (*a*) .**

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

**Question No. 10.**

**ගාමිණී අතුකෝරල මහතා**

*(திரு. காமினி அத்துகோறள)*

(Mr. Gamini Atukorale)

**I want one month's time to answer this Question.**

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

***Qustion ordered to stand down.***

**ලෙච්චිමි වත්ත: අත්පත් කැර ගැනුමට එරෙහිව වූ අභියාචනය**

*இலட்சுமித் தோட்டம்: அரசாங்கம் எடுத்தமைக்கெதிரான முறையீடு*

**LETCHIMI ESTATE: APPEAL AGAINST ACQUISITION**

222/82 (2)

**12. කේ. තුරෙයිරත්නම් මහතා** (පේදුරුතුඩුව)

*(திரு. கே. துரைரத்தினம்—பருத்தித்துறை)*

(Mr. K. Thurairatnam—Point Pedro)

ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) හතර ලියද්දේ කොටිකඹේ ලෙච්චිමි වත්තේ. පදිංචිව සිට නැසී ගිය ජේ. කේ. ලෝටන් මහතා විසින් පසුගිය රජය විසින් තම වත්ත රජයට පවරාගනු ලැබීම පිළිබඳව (අමාත්‍යාංශයේ යොමු අංකය: 03/75 එල්. 105 වීඊ) ඉදිරිපත් කරන ලද ආයාචනය සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විශේෂ උපදේශක මණ්ඩලය (ඉඩම් අත්කර ගැනීම) ඉදිරිපත් කළ නිර්දේශ එතුමා සභාගත කරන්නේද? (ii) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද? (ආ) විශේෂ උපදේශක මණ්ඩලය විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම පමාවීමට හේතුව කුමක්ද? (ඇ) තමන්ගේ පවුලේ **අය අප්‍රමාණ දුක් ගැහැට විඳිමින් සිටින බැවින් මේ පිළිබඳ සහනයක් කඩිනමින් සලසා දෙන ලෙස ඉල්ලා නැසිගිය ලෝටන් මහතා සහ ඔහුගේ පුත්‍රයා අමාත්‍යාංශයට ලිපි ගණනාවක් ඉදිරිපත් කළ බැව් එතුමා දන්නේද? (ඈ) විශේෂ උපදේශක මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එතුමා වහා පියවර ගන්නේද?**

*காணி, காணியபிவிருத்தி அமைச்சரும் மகாவலியபிவிருத்தி அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) (i) இலட்சுமித் தோட்டம், கொட்டிகாம்பை, ஹாட்டாறலியாட்டை என்ற முகவரியிலிருந்து காலஞ்சென்றவரான திரு. ஜே. கே. லோட்டன் என்பாருடைய தோட்டத்தை முன்னுள் அரசாங்கம் எடுத்தது தொடர்பில் அன்னார் செய்த மேன்முறையீடு (அமைச்சுத் தொடர்பிலக்கம் 03/75* **L** *105* **VE***) தொடர்பாக காணிச்சீர்திருத்த ஆணைக்குழுவின் (காணி பொறுப்பேற்றல் விடயம் தொடர்பான) விசேட மதியுரைச் சபையின் விதப்புரையை அவர் சமர்ப்பிப்பாரா? (ii) இல்லையேல் ஏன்? (ஆ) விசேட மதியுரைச் சபையின் விதப்புரையைச் செயற்படுத்துவதில் தாமதத்துக்குக் காரணம் என்ன? (இ) தமது குடும்பம் சொல்லொணுக் கஷ்டம் அனுபவிப்பதினுல் இது தொடர்பில் துரிதமான நிவாரணம் அளிக்குமாறு கோரிக் காலஞ்சென்ற திரு. லோட்டனும் மகனும் பல முறை அமைச்சுக்கு வேண்டுகோள் விடுத்துள்ளனர் என்பதை அவர் அறிவாரா? (ஈ) விசேட மதியுரைச் சபையின் விதப்புரையைச் செயற்படுத்த அவர் உடனடி நடவடிக்கை எடுப்பாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Lands and Land Development and Minister of Mahaweli Development : (*a*) (i) Will he table the recommendation of the Special Advisory Board (Land Acquisition) of the Land Reform Commission in respect of the appeal made by the late Mr. J. K. Lawton of Letchimi Estate, Kotikambe, Hataraliyadde, regarding the acquisition of his estate by the previous Government (Ministry Ref. 03/75. L. 105 VE) ? (ii) If not, why ? (*b*) What is the reason for the delay in implementing the recommendation made by the Special Advisory Board ? (*c*) Is he aware that the late Mr. Lawton and his son made numerous appeals to the Ministry requesting speedy redress in this regard as their family is undergoing untold hardship ? (*d*) Will he take immediate steps to implement the recommendation of the Special Advisory Board ?

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

(*a*) (i) No. (ii) This document cannot be tabled as it is not in my custody. (*b*) The recommendations of the Special Advisory Board cannot be implemented as the land has been alienated among allottees. (*c*) Yes. (*d*) Does not arise in view of (*b*) above.

**කේ. තුරෙයිරත්නම් මහතා**
*(திரு. கே. துரைரத்தினம்)*
(Mr. K. Thurairatnam)

Sir, may I ask a supplementary question ? In whose custody is this document, and will he make all attempts to procure it ?

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

It is in the custody of the Special Advisory Board on Land Acquisition, which is a judicial body.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 13.

**ගාමිණී අතුකෝරල මහතා**
*(திரு. காமினி அத்துகோறள)*
(Mr. Gamini Atukorale)

I ask for one month's time.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**
**வினவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.**
*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Item No.1—Minister of Industries and Scientific affairs.—(Pause) Nobody is present to move it. The item will stand down.

## නූරානි උළු කම්හල : වාර්ෂික වාර්තාව
### நூரானி ஓட்டுத் தொழிற்சாலை : ஆண்டறிக்கை
## NOORANI TILE WORKS : ANNUAL REPORT

**ඩී. ඊ. තිලකරත්න මහතා (වැඩබලන පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා)**
*(திரு. டி. ஈ. திலகரத்ன—பதில் பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சர்)*
(Mr. D. E. Tillekeratne—Acting Minister of Parliamentary Affairs & Sports)

On behalf of the Minister of Industries and Scientific Affairs, I move,

"That in terms of section 14 (3) of the Finance Act, No. 38 of 1971, the Annual Report and Statement of Accounts of the Government Owned Business Undertaking of Noorani Tile Works, being report incorporating the Auditor-General's observations for the year ended 31st December, 1979, which was presented on 6th July 1982, be approved".

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**
*Question put, and agreed to.*

## පරිපූරක මුදල : රාජ්‍ය පරිපාලනය
### குறைநிரப்புத் தொகை : பொது நிருவாகம்
## SUPPLEMENTARY SUPPLY : PUBLIC ADMINISTRATION

**හරින්ද්‍ර කොරයා මහතා (වැඩබලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමා)**
*(திரு. ஹரிந்திர கொறயா—பதில் பொது நிர்வாக அமைச்சர்)*
(Mr. Harindra Corea—Acting Minister of Public Administration)

I move,

"That a supplementary sum not exceeding Rupees Eleven million nine hundred and ninety thousand (Rs. 11,990,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka or any other fund or moneys of or, at the disposal of, the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the Service of the financial year beginning on 1st January, 1982 and ending on 31st December, 1982, and that the sum of money may be expended as specified in the Schedule hereto :

Schedule

| | Rs. |
|---|---|
| Head : 84—Minister of Public Administration | |
| Programme : 2—Public Administration | 11,990,000" |

I would like to state that this is not a supplementary. No additional funds are required. Under the provision given to the Ministry of Public Administration in the last Budget the savings have been frozen, and it is out of these savings that this money is asked for.

**ප්‍රශ්නය යථාභිමුඛ කරන ලදී.**
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.14

**කා. පො. ඉරත්තිනම් මහතා (කයිට්ස්)**
*(திரு. கா. பொ. இரத்தினம்—ஊர்காவற்றுறை)*
(Mr. K. P. Ratnam—Kayts)

சபாநாயகர் அவர்களே, அரசாங்க நிர்வாக அமைச்சுத்தான் தமிழ் மொழி உரிமைகளை நடைமுறைப் படுத்துவதற்கும் தமிழ் அரசாங்க உத்தியோகத்தர்களின் சிங்களத் தகைமை பற்றிய பிரச்சினையைத் தீர்ப்பதற்கும் பொறுப்பான அமைச்சாகும். பெயரளவில்தான் தமிழ் மொழி உரிமைகளை நடைமுறைப்படுத்துவதற்கு ஓர் அமைச்சு உருவாக்கப்பட்டிருக்கின்றது. இந்த அமைச்சுக்குப் பொறுப்பான அமைச்சரிடம் நான் இந்தச் சபையிற் பல முறை கேள்விகளைக் கேட்டிருக்கின்றேன். கடைசியாக அமைச்சர் எனக்களித்த மறுமொழியில், தாங்கள் தயாரித்துள்ள சுற்றறிக்கையை அரசாங்க நிர்வாக அமைச்சின் அங்கீகாரத்துக்கு அனுப்பியிருப்பதாகக் கூறினர். ஆனால், மாதக் கணக்காக இன்னும் எதுவும் நடைபெறவில்லையென்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இந்த அரசாங்கம் தமிழ் மொழியைத் தேசிய மொழியாக ஆக்கிவிட்டதாக கூறுகின்றது. உண்மைத்தான். அதுபற்றி அரசியலமைப்புச் சட்டத்தில் எழுதப்பட்டுத்தான் இருக்கின்றது. ஆனால், இந்த அரசாங்கம் அதை ஏட்டுச் சுரைக்காயாக ஆக்கிவிட்டதென்று நான் பல முறையும் எடுத்துக் கூறினேன். இன்னும் கூறுகிறேன்; இனிமேலும் கூறிக்கொண்டுதான் இருப்பேன். இது ஓர் ஏமாற்றுத் தந்திரமேயென்று நான் இந்தச் சபையிற் கூறுகிறேன். இதை யாரேனும் எதிர்க்க விரும்பினல் சவால் விட விரும்பினல் அதைச் செய்யலாமென்று சொல்கின்றேன்.

தேசிய மொழியாகத் தமிழை ஆக்கிவைத்திருப்பதனல் எந்தவிதமான பயனுமில்லை. அதற்குரிய சுற்றறிக்கை வெளியிடப்படல் வேண்டும். அந்தச் சுற்றறிக்கையை வெளியிட வேண்டுமென்று நான் பல முறை சனதிபதி அவர்களுக்கும் எழுதினேன். தமிழ் மொழியை நடைமுறைப்படுத்துவதற்காக ஓர் அமைச்சு உருவாக்கப்பட்டிருக்கின்றதென்று அவர் கூறினர். அந்த அமைச்சுடன் நான் பல முறை தொடர்பு கொண்டேன்; ஆனல், எந்தவிதமான உரிமையையும் பெற முடியவில்லை. தமிழ் மொழி உரிமைகளை நடைமுறைப் படுத்துவதற்கான சுற்றறிக்கையை வெளியிடுமாறு இந்தச் சபையில் நான் அமைச்சரை 6.8.80 முதல் ஐந்து முறைகள் கேட்டேன். ஐந்தாவது முறை கேட்டபொழுது, 6.11.81 இல் பிரதேச அபிவிருத்தி அமைச்சரான அவர் எனக்கு அளித்த மறுமொழியில் “கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி வினவிய சுற்றுநிருபம் அநேகமாக அடுத்த ஓரிரு வாரங்களுக்குள்ளாக அமைச்சரவையின் அங்கீகாரத்தைப் பெற்று நடைமுறைப்படுத்தப்படும் என்ற கடைசி வாக்குறுதியை உங்களுக்கு இந்தச் சபையில் அளிக்கிறேன்” என்று கூறினர். இன்று ஏறக்குறைய ஓராண்டு காலமாகப் போகின்றது. அந்தச் சுற்றறிக்கை இன்னும் வெளிவரவில்லை. அவர் கடைசியாக எனக்குத் தந்திமூலம் அறிவித்தபொழுது, அந்தச் சுற்றறிக்கை அரசாங்க நிர்வாக அமைச்சின் அங்கீகாரத்துக்கு அனுப்பப்பட்டிருப்பதாகத் தெரிவித்தார். அதன் பின் என்ன நடந்ததோ தெரியவில்லை.

நான் கேட்டுக் கேட்டுக் களைத்துவிட்டேன். நம்பிக்கையில்லாத் தீர்மானமொன்றைக் கொண்டு வருவேன் என்றும் சொல்லிவிட்டேன். அதைத் தவிர எனக்கு வேறு வழியில்லை. எனது கட்சி விரும்பினலென்ன, விரும்பாவிட்டாலென்ன, அதைத் கொண்டுவருவேன். இந்த அரசாங்கத்தின் காலம் முடியும்வரை இப்படித்தான் இழுப்பார்கள் என்று எனது மனச்சாட்சி சொல்லுகிறது. மிக விரைவில் அரசாங்க நிர்வாக அமைச்சு இந்தச் சுற்றறிக்கையை வெளியிடாது விட்டால் எங்களுக்கு வேறு எந்த வழியும் கிடையாது. எங்கள் மனச்சாட்சிக்கேற்ப அதற்குப் பொறுப்பான அமைச்சர் மீது நம்பிக்கையில்லாத் தீர்மானத்தைக் கொண்டுவருவதைத் தவிர, ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற முறையில்—அரசாங்கம் தேசிய மொழியாக ஆக்கிய தமிழ் மொழியின உரிமைகளைக் கொடுங்கள் என்று போராடுகின்ற ஒரு கட்சியைச் சேர்ந்தவன் என்ற முறையில்—ஒரு நம்பிக்கையில்லாத் தீர்மானத்தைக் கொண்டுவருவதைத் தவிர வேறு எந்த வழியுமில்லை.

அடுத்ததாகத் தமிழ் அரசாங்க ஊழியர்களுக்கு சிங்கள மொழித் தேர்விலிருந்து விலக்களித்தல் பற்றிக் கூறவேண்டும். “கிராம சேவையாளர்களுக்கு பிரித்தானிய அரசாங்க காலத்தில் ஆங்கிலம் தேவையில்லாமலிருந்தது. அதே போல், இப்பொழுது சிங்கள மொழித் தேர்ச்சியும் தேவையில்லாமல் செய்வதேன்” என்று உள்நாட்டலுவல்கள் அமைச்சர் இரண்டு முறை கூறினர். ஐக்கிய தேசியக் கட்சியிலிருக்கின்ற ஒரு தமிழ் அமைச்சர் அவ்வாறு சொன்னர். ஆனல், அவரால் அதை இன்னமும் செய்ய முடியாமலிருக்கின்றது. செய்ய முடியாது என்று அவர் சொல்லாமற் சொல்லி விட்டார். இந்த அமைச்சுக்கு ஒரு செயலாளர் இருக்கின்றார். அவரை நான் தனிப்பட்ட முறையில் குற்றம் சொல்லவில்லை. பிரதானமாக ஓய்வு பெற்றவர்களை அமைச்சுக்களின் செயலாளர்களாக நியமிப்பதனல் அவர்கள் யாருக்கும் கடமைப்பட்டவர்களாக இருக்கின்றார்களில்லை. சிங்கள மொழித் தேர்ச்சியிலிருந்து தமிழ் உத்தியோகத்தர்களுக்கு விலக்களிப்பதிற் கூட அவ்வாறானவர்கள் தாம் தடைகல்லாக இருக்கின்றார்கள் என்பது எனகுத் தெரியும்.

ஆகவே, அதிகாரிகளின் எண்ணப்படி நடவாமல், தமிழ்ப் பகுதிகளில் கடமையாற்றும் தமிழ் உத்தியோகத்தர்கள் அத்தனை பேருக்கும் சிங்களத் தேர்ச்சி தேவையில்லாமற் செய்ய வேண்டும். இதை அரசாங்கம் ஓரளவுக்கு ஏற்றுக்கொண்டிருக்கிறது. அதை நடைமுறைப் படுத்தத் தயங்கக்கூடாது. அதைக் கட்டாயமாக நடைமுறைப்படுத்த வேண்டும். அவருக்கு உங்கள் அமைச்சரவையிலே மதிப்பு இல்லாமலிருக்கலாம். ஆனல், அவர் இந்தப் பாராளுமன்றத்திலே ஒரு பாராளுமன்ற உறுப்பினருக்குத் இரண்டு முறைகள் ஆத்திரத்தோடு வாக்களித்ததைச் செய்யாவிட்டால் இந்தப் பாராளுமன்றத்துக்குக் கௌரவமாகாது. பாராளுமன்றத்தின் கௌரவத்தை நோக்கியாவது கிராம சேவகர்களுக்கு சிங்களத் தேர்ச்சியிலிருந்து விலக்களிக்க வேண்டும் என்றும் அது போல தமிழ்ப் பகுதிகளில் கடமையாற்றும் தமிழ் உத்தியோகத்தர்கள் எல்லாருக்கும் சிங்களத் தேர்ச்சியிலிருந்து விலக்களிக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்ளுகின்றேன். இவற்றைச் செய்யாவிட்டால் இந்த அரசாங்கமே அதைத் தட்டிக் கழித்துக் கொண்டு போகின்றது என்றுதான் எல்லோரும் எண்ணுவார்கள் என்று தெரிவித்துக் கொள்கிறேன். இந்த அரசாங்கமே தமிழ் மொழிக்கு தேசிய மொழி என்ற அளவுக்கு அந்தஸ்தை அளிப்பதாகக் கூறிவிட்டு இதனைத் தட்-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

டிக் கழித்தால் அரசியலமைப்பை வெறும் எட்டுச்சுரைக்காயாக வைத்துத் தமிழினத்தை ஏமாற்றிய ஒரு பெரிய கைங்கரியத்தைத்தான் இந்த அரசாங்கம் செய்தது என்றே கணிக்கப்படும். அவ்வாறே தமிழ் மக்கள் இப்பொழுது எண்ணுகிறார்கள். ஆதலால், இனியும் காலம் தாழ்த்தாமல் இவ்விரு பிரச்சினைகளையும் விரைவில் தீர்த்து வைக்க வேண்டும். இங்கே பொறுப்பு வாய்ந்த அமைச்சர்கள் இருக்கிறார்கள். முதல் அமைச்சர் இருக்கிறார். அவர்களது கவனத்துக்கு நான் இவ்விரு பிரச்சினைகளையும் சமர்ப்பிக்கின்றேன்.

உண்மையிலேயே இந்த குறைநிரப்பு மதிப்பீட்டுக்கு வாக்களிக்க வேண்டுமா? என்னுடைய துக்கமும் என்னுடைய வெறுப்பும் என்னுடைய வேதனையும் இதற்கு மாறாக வாக்களிக்க வேண்டுமா? என்று எனது உள்ளத்தைத் துடிதுடிக்கச் செய்து கொண்டிருக்கிறது என்று எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

අ. භා. 3.21

**ආර්. පී. විජේසිරි මහතා (හාරිස්පත්තුව දෙවන)**
*(திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்)*
**(Mr. R. P. Wijesiri—Second Harispattuwa)**

කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පරිපූරක මුදලක් පිළිබඳ යෝජනාවක් සාකච්ඡා කෙරෙන මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ අවධානය යොමු කරවිය යුතු විශේෂ දෙයක් තිබෙනවා. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා 1979 දී පැවැත්වුණු සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල ගැන පසුගිය අවුරුදු දෙක තුළ විටින්-විට මා මේ ගරු සභාවේදී ප්‍රශ්න කළා. එසේ ප්‍රශ්න කෙරුණු හැම අවස්ථාවකදීම ආණ්ඩුවෙන් කෙරුණේ ඊට හරියාකාරව උත්තර නොදී ප්‍රශ්නයෙන් මගහැරීමයි. එම නිසා ඒ සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියට පවා යන්න මට සිදු වුණා. මන්ත්‍රීවරයෙක් හැටියට එසේ අධිකරණය ඉදිරියට පවා යන්න මට සිදු වුණේ මේ හේතුව නිසයි:

මා කලින් සඳහන් කළ පරිපාලන සේවා සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලැබූ 53 දෙනාට පත්වීම් කඩදාසි තැපැල් කළත්, ඒවා තැපෑලේදී හොර කම් කෙරුණා. ඒ විධියට කටයුතු කොට, එම 53 දෙනාගේ පත්වීම් නැත්නම් උසස්වීම් නැති කළා. එම නිසයි, අධිකරණය ඉදිරියට යන්න මට සිදු වුණේ. අධිකරණයෙන් ලැබුණු තීන්දුව අනුව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ කාරණය:

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතුන්ගෙන් ඉදිරිපත් වුණු ඇතැම් කරුණු අධිකරණය නොපිළිගත් නිසයි, මට ඒ නඩුව දිගටම ගෙන යන්න අවස්ථාව ලැබුණේ. මූලික වශයෙන් දිසා අධිකරණයත්, අභියාචනා අධිකරණයත් ගාස්තුවටත් යටත් කර මගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමින් තීන්දු දුන්නත්, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ 'ගාස්තුවට යටත් කිරීම' ඉවත් කර තීන්දුව දුන් බවත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ විධියට, පසුව වෙනත් පිරිසකට උසස්වීම් දුන්නේ කැබිනට් මණ්ඩලයේ තීරණයක් අනුව නිසා මගේ ඉල්ලීම අධිකරණයෙන් ප්‍රතික්ෂේප වුණු බවයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවෙන් පෙනෙන්නේ.

එම නිසා වැඩබලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරන්න මට සිදු වී තිබෙනවා. මා ඒ ඉල්ලීම කරන්නේ මේ නිසයි: 1979 පැවැත්වුණු ඒ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයට උසස්වීම් ලැබීම සඳහා 53 දෙනෙක් තෝරා ගනු ලැබුවා. ජනාධිපතිතුමාත්, එවකට හිටපු අධ්‍යාපන ඇමතිතුමාත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිතුමාත් යන සියලු දෙනාගේම අදහස වී තිබුණේ, ඒ විභාගය සාධාරණ විධියට පැවැත්වුණාය, එහිදී කිසිම දූෂණයක් සිදු වුණේ නැත කියන එකයි. එහෙත් ඒ විභාගයේ ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගත් 53 දෙනාට පත්වීම් ලිපි නිකුත් කළාටත් පසුව ඒ අය අත්හැර, විභාග ප්‍රතිඵල අනුව 54 වැන්නාගේ සිට අලුතින් වෙනත් 53 දෙනකුට පත්වීම් දී තිබෙනවා. එසේ වෙනත් 53 දෙනකට පත්වීම් නැත්නම් උසස්වීම් දීම නිසා—අදාළ විභාගයේ වැඩිම ලකුණු ගත් 53 දෙනා අත්හැරීම නිසා—විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. එම නිසා, අර දක්ෂතම 53 දෙනාට එම උසස්වීම් ලැබීමේ අයිතිය අහිමි වී තිබෙන බව මතක් කරන්නේ කණගාටුවෙන්.

ඒ අසාධාරණය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, රාජ්‍ය පරිපාලන ඇමතිතුමාටත් මා ලියා යවා තිබෙනවා. මගේ දැනගැනීමේ හැටියට ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් වාර්තා පවා ඉල්ලා තිබෙනවා. 'දක්ෂතම 53 දෙනා එළියට දමලයි, අලුතින් 53 දෙනකුට ඒ උසස්වීම් දුන්නේ' කියා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් වාර්තා කර තිබෙන බවයි, මට දැනගන්න ලැබී තිබෙන්නේ. මා කළ ඒ ප්‍රකාශය වැරදි නම් කරුණාකර හොයා බලන්න, ඇත්ත තත්ත්වය මොකක්ද කියා.

මේ සම්බන්ධයෙන් මා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමාත් හමු වුණා. අර දක්ෂතම 53 දෙනාට උසස්වීම් නොදී ඊළඟට සිටි 53 දෙනාට උසස්වීම් දී තිබෙන නිසා එතුමාගේ අදහසත්, අර දක්ෂතම 53 දෙනාට—මුලින් තෝරාගත් 53 දෙනාට—උසස්වීම් දීම සාධාරණ බවයි. ඒ කෙසේ වෙතත් දැන් ඒ උසස්වීම් ලැබී තිබෙන්නේ වෙනත් 53 දෙනකුටයි.

තමුත් 1980 සහ 1981 පුරප්පාඩු තවම තිබෙනවා. ඒ සඳහා විභාග පවත්වා නැහැ. ඒ නිසා මම විශේෂයෙන් ගරු අගමැතිතුමාගෙන් සහ වැඩබලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ 1980 වර්ෂයේත්, 1981 වර්ෂයේත් (මෙම විභාගය පැවැත්තුවේ නැති නිසා, මේ කාල තුළ ඇතිවූ පුරප්පාඩු පිරෙව්වේ නැති නිසා අර මුලින් තේරුණු 53 දෙනා, මේ අවුරුදු දෙකේ ඇති වූ පුරප්ප ඩුවලටවත් පත් කරන ලෙසයි. ඒ 53 දෙනාගෙනුත් දැන් 40 දෙනෙකුට වඩා ඉතිරිව ඇතැයි මා හිතන්නෙ නැහැ. මොකද? මේ වෙච්ච අසාධාරණය නිසා රාජ්‍ය පරිපාලන සේවයම එපා වෙලා එයින් හත්-අට දෙනෙක් වෙනත් රටවලට ගිහින් සිටිනවා.

පසුව දෙවෙනි වරට දෙගොල්ලටම එක විභාගයක් පැවැත්වූ අවස්ථාවේදී මුල් විභාගයෙන් සමත් වූ අයගෙන් විභාගයට පෙනී සිටි පස් දෙනාම ඒ දෙවෙනි විභාගයෙනුත් සමත් වුණා. ඒකෙන්ම පෙනී යනවා, ඒ 53 දෙනා ඉතාම දක්ෂයන් බව. ඒ නිසා වැඩබලන රාජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. පී. විජේසිරි මහතා]

පරිපාලන ඇමතිතුමාගෙන් මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, දැනට ඉතිරිවෙලා ඉන්න හතළිස් ගණන 1980 වර්ෂයේ සහ 1981 වර්ෂයේ ඇති වූ පුරප්පාඩුවලට පත් කර ගැනීම කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කියා.

අ. භා. 3.25

**සරත් මුත්තෙට්ටුවේගම මහතා** (කලවාන)
*(திரு. சரத் முத்தெட்டுவேகம—கலவான)*
**(Mr. Sarath Muttetuwegama—Kalawana)**

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් වී තිබෙන මේ අවස්ථාවේදී මේ ඇස්තමේන්තුවට අදාළ නොවුණත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අදාළ කාරණයක් ගැන වචන ස්වල්පයක් කථා කරන්නට මම තමුන්නාන්සේගෙන් අවසර ඉල්ලා සිටිනවා. මම මේ මතක් කරන්නට අදහස් කරන කාරණය සම්බන්ධයෙන් අද සභාව කල් තබන අවස්ථාවේදී ගරු අගමැතිතුමාගෙනුත් ගරු කම්කරු ඇමතිතුමාගෙනුත් ප්‍රශ්න දෙකක් ඇසීමට කල් දී තිබෙන බවත් ඒ සමගම මතක් කරන්ට කැමතියි. අද ජූලි මාසෙ 7 වෙනිදා 1980 වැඩ වර්ජනය ඇති වුණේ ජූලි මාසයේ 17 වෙනිදායි. මේ මාසෙ 17 වෙනිදාට ඒ වැඩ වර්ජනය පවත්වා දැවුරුද්දක් සම්පූර්ණ වෙනවා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නොයෙක් සේවාවලට සම්බන්ධ සෑහෙන සේවක සංඛ්‍යාවක් ඒ වැඩ වර්ජනයට සහභාගි වුණා. අත්‍යවශ්‍ය සේවා නියෝගය නිකුත් කළාට පසුව ඒ අය සේවයට නොපැමිණියාය කියන හේතුව උඩ ඔවුන්ගේ රැකියාවන් අහිමි වුණා. මේ අය ආපසු වැඩට ගන්නා ලෙස නොයෙක් ඇවිටිලි නොයෙක් උද්ඝෝෂණ, නොයෙක් මාදිලියේ ඉල්ලීම් පසුගිය අවුරුදු දෙක තුළදී සිදු වුණා. පසුගිය අවුරුද්දෙ අවසාන කාලයේදී ගරු ජනාධිපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් කර තිබුණු ප්‍රකාශයකට ප්‍රවෘත්ති පත්‍රවලින් විශාල ප්‍රසිද්ධියක් ලැබුණා. එයින් කියවුණේ ඒ වැඩ වර්ජනයට සම්බන්ධ වීම නිසා රැකියාව අහිමි වුණු සේවකයන් නැවත සේවයට බඳවා ගැනීමට අදාළ අමාත්‍යාංශවලට ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙන බවයි.

ඊට පසුවත් මේ ප්‍රශ්නය ගැන විටින් විට නොයෙක් ස්ථානවල ප්‍රශ්න කළාම අපට දැනගන්නට ලැබුණේ රාජ්‍ය සේවයට අයිති ඒ වැඩ වර්ජකයන්ගේ ලැයිස්තු රාජ්‍යපරිපාලන අංශයට ලැබී ඇති බවයි. මේ රාජ්‍ය සේවකයන්ගෙන් වැඩි දෙනෙක් නැවත සේවයෙහි යොදවා ගැනීමේ වගකීම පැවරී තිබෙන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයටයි. මේ අවුරුදු දෙක ඇතුළත දී රජයේ දෙපාර්තමේන්තුවල නොයෙක් තනතුරුවල පුරප්පාඩු ඇතිවී තිබෙනවා. අපි සිතමු, කලින් සේවය අතහැර ගියාය කියන උදවිය වෙනුවෙන් අළුතෙන් සේවකයන් බඳවා ගත්තාය කියා. 1980 අත්‍යවශ්‍ය සේවා නියෝගය නොතකා වැඩට නොපැමිණි උදවියගෙන් හිස්වූ තනතුරු සියල්ලම පිරෙව්වා වුණත්, ඉන් පසුව ඇතිවුණු පුරප්පාඩුවලට මේ රැකියා අහිමි වූ උදවිය කැඳවීම පිළිබඳව අඩු තරමින් ඒ දක්වාවත්—රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දරන මතය මොකක්ද කියා අපි දැනගන්න කැමතියි.

මට මතකයි, දැනට අවුරුදු 1 1/2 කට විතර උඩදී මම අමාත්‍යාංශ ගණනාවකින් මේ වැඩ වර්ජනය ගැන ප්‍රශ්න කීපයක් ඇසුවා. මම ඒ වෙලාවෙ පාවිච්චි කළේ "1980 වැඩ වර්ජනය" යන වචනයි. එතකොට ගරු ඇමතිවරුන් කීප දෙනෙකුගේ ස්ථාවරය වුයේ "1980 වැඩ වර්ජනයක් තිබුණේ නැත" යන්නයි. ඒ අනුව ප්‍රශ්නයට උත්තර දීම පැන නොනගිනවාය කියන ස්ථාවරය මත ඒ ඇමතිවරු හිටිය.

මා දැන් අසන ප්‍රශ්නය මෙයයි: වැඩ වර්ජනය කියන වචන පාවිච්චි කළත් නොකළත් 1980 අත්‍යවශ්‍ය සේවා නියෝගය නොතකා වැඩට නොපැමිණීම නිසා ඒ උදවියට යන කලදසාව ගැන රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගේ තත්ත්වය මොකක්ද? මේ පිළිබඳව රජයේ නොයෙකුත් අමාත්‍යාංශවල විවිධ ස්ථාවරයන් තිබෙන බව අපට පෙනෙනවා. දැන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇමතිතුමා මාරුවී ඉන්නවා. ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ. 1980 අවසාන වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ වර්ජකයන් සියයට 90 ක් පමණ ආපසු වැඩට අරගෙන තිබුණා. මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් මුදල් ඇමතිතුමා දවසක් මේ සභාවේදී—අපි අනික් ස්ථානයේ ඉන්න කොට—වැඩ වර්ජනයක් තිබුණාය කියා පිළිගත්තා පමණක් නොවෙයි එතුමාගේ අමාත්‍යාංශයේ සියයට 75 ක් ආපසු අරගෙන තිබෙනවාය කියලත් අපට කිව්වා. සමහර ඇමතිවරු කිව්වා වැඩ වර්ජනයක් තිබුණේ නැත කියල. අධිකරණ අමාත්‍යාංශය කිව්වා සියයට 90 ක් ආපසු අරගෙන තිබෙනවාය කියල. මේ රජයේ එක ඇමතිවරයකු වැඩ වර්ජකයන් ගන්නත් තව ඇමතිවරයකු නොගන්නත් මොකක්ද මේ ප්‍රතිපත්තිය කියන එක රට දැනගන්න ඕනෑය කියන එකයි මා කියන්නේ. ඒ ගැන වැඩ බලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි.

අනික් කාරණය, ආපසු වැඩට ගත් උදවිය පිළිබඳවත් එක හා සමාන ක්‍රියා පිළිවෙළක් නැහැ. වැඩ වර්ජනයට මූලික වූ සමහර උදවිය—වුවමනා නම් මට නම් කියන්නට පුළුවනි—කිසිම වෙලාවක ඔවුන් වැඩ වර්ජනය කළේ නැහැයි කියන්නේ නැහැ. වැඩ වර්ජනයට අනික් අයත් පොළඹවපු සමහර උදවිය ආපසු වැඩට අරන් තිබෙනවා. සමහර අමාත්‍යාංශවල ඔවුන්ට හිඟ පඩිත් දී තිබෙනවා. සමහරුන්ට රක්ෂාව දී තිබෙන අතර හිඟ වැටුප් දී නැහැ. සමහරුන් රක්ෂාවට ආපසු අරගෙන නැහැ. මෙතැන වර්ග තුනක් තිබෙනවා. එම නිසා මේකට හුඟක් වගකිවයුතු ඇමතිතුමා වන රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා වැඩ වර්ජනයේ දෙවන සංවත්සරය වන අද දින මේකට මොකක් හරි සතුටුදායක පිළිතුරක් දෙන ලෙස.

ගරු කථානායකතුමනි, මම කලින් කිව්වා වාගේ මේ ප්‍රශ්නය පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය පැහැදිලි කරවා ගන්නට සභාව කල් තැබීමේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාගෙන් අසන්නට මා වෙනම ප්‍රශ්නයක් කල් දී තිබෙනවා. ඒවාගේම පෞද්ගලික අංශය පිළිබඳවත් අපේ කම්කරු ඇමතිතුමාගෙන් ඇසීමට මා වෙනම ප්‍රශ්නයක් ගැන කල් දී තිබෙනවා. ඒවා තිබියදී දැන් මා කළේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මේකට බොහොම තදින්ම මැදහත් වන අමාත්‍යාංශයක් වන නිසා මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමක් බව අවසාන වශයෙන් සඳහන් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා** (හපුතලේ)
*(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார—ஹப்புத்தளை)*
(Mr. W. J. M. Lokubandara—Haputale)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන වැඩ සටහන යටතේ මේ මුදල අනුමත කළයුතු බවට කිසිම සැකයක් නැහැ. පළමුවෙන්ම මා ඒක අනුමත කරන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. දෙවනුව, මේ රටේ රාජ්‍ය පරිපාලන ඇමතිවරයා යටතේ ඇති නොයෙක් දෙපාර්තමේන්තු අතුරෙන් ඉතාම වැදගත් දෙපාර්තමේන්තුවක් වශයෙන් සලකන්නට පුළුවනි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව. මේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පිළිබඳව ගරු ඇමතිවරයාගේ කාරුණික අවධානය යොමු කළ යුතු කරුණු කීපයක් තිබෙනවා. අපට මතකයි පසුගිය රජය කාලයේදී රාජ්‍ය පරිපාලන ඇමතිවරයා වශයෙන් හිටපු පීලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇමතිතුමා ගැන. එතුමා මේ අමාත්‍යාංශය භාර ගෙන වැඩි කාලයක් ගියේ නැහැ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව නැති කළා; රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දිය කළා. ක්‍රමානුකූලව ස්වාභාවික මරණයක් ඇති වන විධියට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දිය කළා. අන්තිමට ඒක අංශයක් බවට පත් කළා. දෙපාර්තමේන්තුව නැති කළා. කොමසාරිස්වරයා නැති කළා. ඉන්පසු—මා ස්තුතිවන්ත වෙනවා අපේ රාජ්‍ය පරිපාලන ඇමතිතුමාට—අපේ රජය බලයට පත් වුණාට පසු යළිත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ඇති කළා.

රාජ්‍ය භාෂා ප්‍රශ්නය හුදෙක් දේශපාලන ප්‍රශ්නයක් පමණක් නොවෙයි. මේ හා බැඳුණු සාමාජික, ආර්ථික ආදී නොයෙකුත් ප්‍රශ්නත් තිබෙනවා. මෙය විශේෂයෙන් පන්ති ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනවා. මේ රට පාලනය කළ අධිරාජ්‍ය වාදීන්ගේ භාෂාව වන ඉංග්‍රීසිය තුරන් දන් කොට ඒ වෙනුවට රාජ්‍ය භාෂාව භාවිතයට ගැනීමේ මේ රට බලාපොරොත්තු වුණු සමාජ විපර්යාශයක තිබෙනවා. ගරු ජනාධිපති උතුමාණන් පළමු වතාවට එබඳු යෝජනාවක් ගෙනාවේ ඒ අදහස ඇතුවයි. සමහර විට ලඟි-ලඟියේ එය ක්‍රියාත්මක කළ නිසා හෝ වේවා, වෙනත් ඓතිහාසික හේතු සාධක නිසා හෝ වේවා, මේ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමේ මුවාවෙන් ගත් යම් යම් පියවර නිසා පුදුමාකාර විධියට මේ රටේ ඉංග්‍රීසි භාෂාව එක්තරා පන්තියකට පමණක් සීමා වන්නට, දුප්පත් පන්තියට, ග්‍රාමීය ජනතාවට ඉංග්‍රීසි භාෂාව නැත්තටම නැති වන්නට, ධනය ඇති අයට, මුදල් ඇති අයට, එක් එක් පවුල් බල ඇති අයට පමණක් ඉංග්‍රීසිය සීමා වන්නට යන තත්ත්වයක් ඇති වන බව අපට පෙනී යනවා. එය කිසි සේත් රාජ්‍ය භාෂා පනතේ වරදක් නිසා ඇති වන තත්ත්වයක් නොවෙයි. එය ක්‍රියාත්මක කළ ආකාරයේ වරදයි.

මේ නිසා, උසස් අධ්‍යාපනය ලබන අහිංසක දූ දරුයන්ට සිය බසින් පතපොත නැති නිසා ඒ උසස් අධ්‍යාපනය ලබා ගැනීමේදී අනන්ත අප්‍රමාණ කරදර පීඩාවලට ලක් වන්නට සිදු වුණා. එය ඉතා පැහැදිලි කරුණක්. මේ නිසා සිංහල මාධ්‍යයෙන් උපාධි ගත් අය හෙලාදකින තත්ත්වයක් ඇති වුණා. ඒක උපාධි අපේක්ෂකයන්ගේ වරදක් නිසා වුණු දෙයක් නොවෙයි. ඒ කාලයේ පිළිගත් අධ්‍යාපන ප්‍රතිපත්තිය, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසා ඒ තත්ත්වය ඇති වුණේ. ඒ නිසා, රාජ්‍ය සේවයට පිවිසෙන, පරිපාලන සේවයට පවා පිවිසෙන රජයේ සේවකයකු ඔහුගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් නැති කම නිසා යම් කිසි පීඩාවකට, හිරිහැරයකට, කරදරයකට ලක් වන තත්ත්වයක් ඇති නොවන්නට වග බලා ගැනීම රාජ්‍ය භාෂාව භාර ඇමතිතුමාගේ යුතුකමක්.

මේ සම්බන්ධයෙන් නිදර්ශන කීපයක් ඔබතුමාට ඉදිරිපත් කරන්නට මට පුළුවනි. වුවමනා නම්, එසේ හිරිහැරයට පත් වුණු අයගේ නම් පවා කියන්නට මට පුළුවනි. බොහෝ අවස්ථාවලදී සම්මුඛ පරීක්ෂණ සඳහා එන අයගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම ගැන විශේෂ අවධානය යොමු කිරීම නිසා, සිංහල භාෂාව පමණක් දන්නා, රාජ්‍ය භාෂාව පමණක් දන්නා අහිංසකයන්ට හිරිහැර සිදු වුණු අවස්ථා තිබෙනවා. මේකට ඉඩ දෙන්න හොඳ නැහැ. සිංහල භාෂා මාධ්‍යයෙන් උගත් අයගෙන් සම්මුඛ පරීක්ෂණවලදී බොහෝ කොට ඉංග්‍රීසියෙන් ප්‍රශ්න අසන තත්ත්වයක් තිබෙනවා. ඒ මගින් ඔවුන් තුළ හීන මානයක් ඇති කරනවා.

සමහර අවස්ථාවලදී, පරිපාලන සේවයේ සමහර දඩබ්බර ප්‍රතිපත්ති තිබෙනවා. පරිපාලන සේවයේ උසස් නිලධාරීනට සමහර විට ඉංග්‍රීසි දන්නා ප්‍රධාන ලිපිකරුගේ උපදෙස් මත කටයුතු කරන්නට සිදු වෙනවා. ලිපිගොනුවල ඉංග්‍රීසියෙන් සටහන් තැබීමේ නිහීන ප්‍රතිපත්තිය නිසා, රාජ්‍ය භාෂා විරෝධී, නීති විරෝධී ප්‍රතිපත්තිය නිසා, සිංහල පමණක් දන්නා අය අතරමං වෙනවා. ඒ නිසා, බරපතල විධියේ අසහනකාරී තත්ත්වයක් ඇති වෙනවා. මේ තත්ත්වය ගැන යළිත් සමාලෝචනයක් කිරීම රාජ්‍ය භාෂාව භාර රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගේ යුතුකමක්.

1956 සිට 1982 දක්වා කාලය අවුරුදු විසි හයක්. ශත වර්ෂ කාලක් දැන් මේ ප්‍රශ්නයට ගත වී තිබෙනවා. මේ කාලය තුළ රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක වුණේ කවර ආකාරයටද, මේ නිසා විශේෂයෙන් ගම්බද ජනතාවට වුණු හානිය කුමක්ද, මේ වැරදි නිවැරදි කරන්නට ඕනෑ කොහොමද යනාදි කරුණු පරීක්ෂා කිරීම රාජ්‍ය භාෂාව භාර ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු විය යුතු දෙයක්.

තවද, කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමාගේ (කා. පො. ඉරත්තිනම් මහතා) කතාවෙන් පෙනී ගියා, මේ සියල්ලම සිංහලයෙන් නම් කෙරෙනවාය, දෙමළ භාෂාවට තැනක් නැත කියන බවක්. අතිශයෙන්ම වැරදි ප්‍රකාශයක්. උතුරු පළාතට ගියොත් එහි සමහර දෙපාර්තමේන්තුවල නම් පවා තිබෙන්නේ දෙමළ භාෂාවෙන් පමණක් බව පෙනෙනවා. ඒවාට කවුද ඝෝෂා කරන්නේ ? බොහෝ අවස්ථාවල බස්වල නාම පුවරු පවා තිබෙන්නේ දෙමළ භාෂාවෙන් පමණක් බව මම දන්නවා. එහෙම නම් සැබවින්ම පීඩාවට ලක් වී සිටින්නේ වැඩි ජනතාව වන අපියි. රාජ්‍ය භාෂාව නීතිගත වී තිබියදීත් සැබවින්ම උතුරු නැගෙනහිර පළාත්වල දෙමළ නොදන්නා, සිංහල පමණක් දන්නා—රාජ්‍ය භාෂාව පමණක් දන්නා—අයගේ තත්ත්වය කුමක්ද? මේ නිසා, දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා මුළු රටේම රාජ්‍ය භාෂාව අකුරටම ක්‍රියාත්මක කරන්නට ගරු රාජ්‍ය පරිපාලන ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා.

මෙය ප්‍රමාද කරන එක බරපතල අයුක්තියක්, අපේ ව්‍යවස්ථාවට විරෝධී තත්ත්වයක් බව මා මීට කලිනුත් නොයෙක් අවස්ථාවලදී පෙන්වා දී තිබෙනවා. උතුරේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. ජ. මූ. ලොකුබණ්ඩාර මහතා]

උප දිසාපති කාර්යාලයක් විවෘත කර ඒ ප්‍රවෘත්තිය 'ඩේලි නිවුස්' පත්‍රයේ දමා තිබුණා. එය ඒ පත්‍රයේ දමා තිබුණු ආකාරය ගැන මා මීට කලිනුත් සභාව විසිර යන අවස්ථාවේදී ප්‍රශ්නයක් මතු කළා. මුලින්ම තිබෙන්නේ දෙමළෙන්, ඒ නම ගම. මොකටද ඒ තත්ත්වය? එහෙම කරන හේතුව මොකක්ද? එබඳු දෙයක් කිරීමෙන් බලාපොරොත්තුවන තත්ත්වය? රටේ ජාතික අසමගිය ඇති කිරීම මිස වෙන මොකක්ද? මා හිතනවා මේ තුන් සිංහලයේ කාටත් තිබෙනවාය කියා රාජ්‍ය භාෂාවෙන් කටයුතු කර ගැනීමේ අයිතිය. එය පළඳු වී ඇති අවස්ථා තිබුණා. එය සාධිවස් ගරු මන්ත්‍රීතුමාගේ (කා. පො. ඉරත්තිනම් මහතා) අවධානයට යොමු කරන්නේ එතුමාට එයින් හීන් සන්තෝෂයක් ලබන්නට පුළුවන් නිසයි.

තවත් කරුණක් තිබෙනවා ගරු කථානායකතුමනි. මට බොහෝ විට පෙනී යනවා නොයෙක් අවස්ථාවල රටේ උසස් නිලධාරීන් පමණක් නොවයි වගකිවයුතු වෙනත් අමාත්‍යාංශවලින් වුවත් ලියුම් එන විට ඉංග්‍රීසියෙන් පදමණක් එන බව. බොහොම ලජ්ජා විය යුතු තත්ත්වයක්. එපමණක් නොවෙයි රාජ්‍ය මුද්‍රාව ඉංග්‍රීසියෙන් ගසා යවනවා. මෙය මොන නීතියකට එකඟද කියා අපි ප්‍රශ්න කරනවා. ඇත්ත වශයෙන්ම නීතිපතිගෙන් මේ ගැන නිමියක් ගත යුතුයි. 'රාජ්‍ය සේවය පිණිසයි' කියන අකුරු යටතේ මුද්දර ගහන්නේ නැතිව නොමිලයේ එවන ලියුම්වල ඉංග්‍රීසියෙන් යම්කිසි නිලධරයකුගේ නම ගසා තිබෙනවා නම් එය හරිද? මා එය ගරු තැපැල් ඇමතිතුමාගෙන් අහනවා. එය නීති විරෝධි වැඩක්. ව්‍යවස්ථාව යටතේ කිසිම තත්ත්වයක් නැති ඉංග්‍රීසි භාෂාවෙන් කොහොමද ඒ විධියට මුද්‍රාව ගසා එවන්නේ? එංගලන්තයේ පුළුවන්කම් ඇති. තවමත් මෙය කුඩා එංගලන්තයක් වශයෙන්, සුදු අධිරාජ්‍යවාදීන්ට යටත් රටක් වශයෙන්, සලකන පිරිසක් සිටින බවයි, මට එයින් පෙනී යන්නේ. එම නිසා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ යුතුකමක් මේ ගැන සැලකිලිමත් වීම. රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා අවශ්‍ය ඒකටයි. රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා නිතරම අවදියෙන්ම සිටින්නට ඕනෑ, රාජ්‍ය භාෂා පනත සැබැවින්ම ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියන එක ගැන. [බාධා කිරීමක්] රාජ්‍ය භාෂා කොමසාරිස්වරයෙක් සිටිනවාද කියා ඌව-පරණගම ගරු මන්ත්‍රීතුමා (ආර්. එම්. කරුණාරත්න මහතා) මගෙන් අහනවා. එතුමාගේ දැනගැනීම පිණිස කියන්න කැමතියි, 1977 වන තුරු පැවති ඒ හීම සමයේදී නැති කළ ඒ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව නැවත ඇති කර අද එස්. ජී. සමරසිංහ කියා ඉතාම ජ්‍යෙෂ්ඨ පරිපාලන සේවකයෙක් සිටින බව එහි කොමසාරිස්වරයා වශයෙන්. නැහැ කියන්නේ නැහැ. ඉතින් මේ අමාත්‍යාංශයට පුළුල් බල තල තිබිය යුතුයි.

මා කණගාටු වෙනවා ඒ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයට සිදු වී තිබෙන තත්ත්වය ගැන. පුස්තකාලයක් නැතිව බැහැ, කථානායකතුමනි. රාජ්‍ය භාෂාව ගැන කල්පනා කරන විට අධිකරණ කටයුතු ගැන වේවා රාජ්‍ය තන්ත්‍රයේ වෙනත් වැදගත් හැම ප්‍රශ්නයකදීම වේවා වචනයක් ගැන, නිරුක්තියක් ගැන කල්පනා කරන විට, සමහර විට ඒ වචනය යොදා ඇති පද සම්බන්ධය ගැන කල්පනා කරන විට, රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක වන විට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් තමයි අපට අන්තිම වාක්‍යයය අන්තිම වචනය ගැන සාමාන්‍ය වශයෙන් ප්‍රකාශයක් ගන්නට තිබෙන්නේ. එවැනි ඒ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය ඉවරයි. පරිවර්තන අංශය නැත්තටම නැති වී දැන් වැදගත් පිරිසක්—ඉංග්‍රීසි භාෂාවෙනුත් සිංහල භාෂාවෙනුත් දෙමළ භාෂාවෙනුත් ප්‍රවීණතා ඇති පිරිසක්—නිකම්ම නිකම් කාලය ගත කරනවා. මේ අවස්ථාවේදී මට සිහි වෙනවා දෙමළ භාෂාවේ ප්‍රවීණතාවක් ඇති වජිරසේන මහතා වැනි පඬිවරු ගැන. ඒ අය නිකම්ම කාලය ගත කිරීම මොන අපරාධයක්ද? අඩු ගණනේ දෙමළ උගන්වන්නවත් පුළුවන්. ඒ වගේම සිංහල නොදන්නා අයට සිංහල උගන්වන්න පුළුවන්. ඉතාම දක්ෂ උගත් පිරිසක් එහි සිටිනවා. ඒ අය නිකම්ම කාලය ගත කරනවා. පුස්තකාලය විවෘත කර ගන්නට විධියක් නැහැ, ඉඩකඩ නැහැ. මේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට කළ අරියාදු තරම් අරියාදු කාටවත් කර නැහැ කියන්න පුළුවන්. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට සැබැවින්ම යුතුකමක් තිබෙනවා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට සුදුසු තැනක් දෙන්නට. විශ්ව විද්‍යාලය ආසන්නයේ කෞතුකාගාර පුස්තකාලය හා රාජකීය ඓතිහාසික සමාගමේ පුස්තකාලය ආශ්‍රිතව, විශ්ව විද්‍යාලයට අනුබද්ධව ඉතාම රමණීය ප්‍රදේශයක් මේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට තිබුණා. මේ අන්තිමට කාෂ්ටක විධියට, අව් කාෂ්ටකයේ ඉන්නට බැරි තැනකට, දැන් එය දමා තිබෙනවා. පර්යේෂණ නොවෙයි පරිවර්තන නොවයි කරන්නට පුළුවන්. එතන ඉන්නවත් බැහැ.

මේ ආණ්ඩුව ආවට පසු භාරිස්පත්තුවේ දෙවැනි ගරු මන්ත්‍රීතුමනි, අඩු ගණනේ අච්ච තිබියදී හෝ එය පවත්වාගෙන යනවා. එය නැත්තටම නැති කර බොටුව මිරිකුවේ කව්ද? තමුන්නාන්සේලා කවර විධියට පිළිගන්නවාද කියා මම දන්නෙ නැහැ. ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා රාජ්‍ය පරිපාලන ඇමතිවරයා වශයෙන් වැඩ කරන කාලයේදී බව මතක තබා ගන්න. [බාධා කිරීම්] ඔබතුමා දන්නා තරම් තමයි, එයින් පෙනෙන්නෙ. ඒ රාජ්‍ය පරිපාලන ඇමතිවරයාට, අධිකරණ ඇමතිවරයාට අභියෝග කොට, ඒ අවුරුදු 17 ක සේවාව තුච්ඡව කටවත් නොසලකා ඉල්ලා අස් වී ජනතා අධිකරණයට පැමිණි කෙනෙක් තමයි, මම. ඔබට හැකිද, මට අභියෝග කරන්න? හොඳට තේරුම් ගත යුතුයි. එම නිසා මේවා ගැන කියන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බොහොම අමාරු ඇති. ඒ යුගයේදී, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව අංශයක් කරන විට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිදාගෙන හිටියද, බුදියාගෙන හිටියද, විජේසිරි මහත්මයා කොහේ හිටියද කියල මම අහන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ විශේෂ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවන්න කැමතියි. මේ රටේ ඉංග්‍රීසියට නොයෙකුත් අංශ තිබෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවා ඉංග්‍රීසි භාෂා අංශ තිබෙනවා. ඉංග්‍රීසිය ගැන හැම තැනම වැලපෙනවා. නමුත් කොයි තරම් වැලපුනත් සිංහල භාෂාව ගැන පර්යේෂණ කරන අංශයක්වත් ඇත්තේ නැහැ. මේ නොබෝදා ආනන්ද විද්‍යාලයේ පැවති ඉතාම වැදගත් සාකච්ඡාවකදී මේ පිළිබඳව යම් තීරණයක් අරගෙන තිබෙනවා. රාජ්‍ය භාෂාව පිළිබඳව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පර්යේෂණ අංශයක් අවශ්‍ය බවට තීරණයක් අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම අපේ රාජ්‍ය භාෂාව භාර ගරු ඇමතිතුමාගේ විශේෂ වගකීමයි.

ගරු කථානායකතුමනි, මේ රුපියල් 1,19,90,000 ටම අනුමැතිය දීමට එක පාරටම අපි අත් ඔසවන්න සූදානම්. අපි මෙය අනුමත කරනවා. ඒ වගේම සිංහල භාෂාවට නියම තැන දීම සඳහා කටයුතු කරන්නට තව එක් කෝටි නොවෙයි දෙකෝටි නොවෙයි ඕනෑම ගණනක පරිපූරක ඇස්තමේන්තුවක් ගෙන එන්න. එය අපට අවශ්‍යයි. මේ අවස්ථාවේ දී මම ඉතාම ඕනෑකමින් සඳහන් කරනවා, එක් කාරණයක්. මාර්ග ආයතනයෙන් මාර්ග අටුවා නමැති පොතක් පළ කර තිබෙනවා. ඒ මාර්ග අටුවා නැමති පොතෙන් මෑතදී භාවිතයට පත්වුණු නොයෙක් විධියේ 'උද්ධමනය' වැනි වචන විස්තර කර තිබෙනවා. රාජ්‍ය භාෂාව භාවිතය නිසා මේ රටේ අලුත් වචන, අලුත් සංකල්පනා බිහි වුණා. මේවා තේරුම් ගන්න අමාරුයි. සමහර විට ප්‍රාචීන පාණ්ඩිත්‍යයෙන් අග තැන්පත් හාමුදුරු නමකටවත් තේරෙන්නෙ නැහැ, 'උද්ධමනය' වැනි වචන, සමහර විට 'වැය ශීර්ෂය' වැනි වචන. ඒ විධියේ අලුත් වචන ඇවිත් තිබෙනවා. මේ වචන තේරුම් කර දෙන්න ඕනෑ. ඒ සඳහා ඉතාම සුදුසු ආයතනය තමයි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට හොඳට වැඩ කරන්න හයිය, ශක්තිය, තල්ලුව දෙන්නය කියා. ඒ සඳහා ගරු ඇමතිතුමාගේ විශේෂ දැඩි අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. මේ වැය ශීර්ෂය අනුමත කරන්නා වාගේම අර වගේ කටයුත්තකට ඕනෑම පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කරන්නට විරුද්ධ පක්ෂය පවා සූදානම් බව ප්‍රකාශ කරමින් මා නවතිනවා.

**ඒ. එම්. ආලාලසුන්දරම් මහතා (කෝපායි)**
*(திரு. ஏ. எம். ஆலாலசுந்தரம்—கோப்பாய்)*
**(Mr. A. M. Alaalasundaram—Kopay)**

*கௌரவ சபாநாயகரவர்களே, வேலையிழந்த ஊழியர்களை மீண்டும் வேலைக்கு அமர்த்துவதில் இந்த அரசாங்கம் ஒரே மாதிரியான கொள்கையைக் கடைப்பிடிப்பதில்லை என்பதை கௌரவ கலவான பிரதிநிதி (திரு. சரத் முத்தெட்டுவேகம) அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டு வந்தார். அவர் கூறியதைப் போல சில அமைச்சர்கள் பொறுப்போடு பலருக்கு வேலையை மீள அளித்திருக்கிறார்கள்; சிலர் பகுதி பகுதியாக அளித்துக் கொண்டிருக்கிறார்கள். ஒரு சில அமைச்சுக்களில் அது பற்றிய கவனிப்பு மிகக் குறைவாகத் தான் இருக்கிறது.*

*வேலை மீளளிக்கப்பட்ட பல பேருக்கு வேலையில்லாக் காலத்துக்கான ஊதியம் வழங்கப்படுவதில் ஒரு தன்மையான கொள்கை கடைப்பிடிக்கப்படவில்லை என்பதும் இங்கு கவனத்துக்கு எடுக்கப்பட வேண்டும். நீண்ட நாட்களுக்குப் பின்பு—ஏறத்தாழ இரண்டு வருடங்களுக்குப் பின்பு—மீண்டும் அவர்களை வேலைக்கு அழைக்கும் பொழுது வேலையில்லாக் காலத்தில் அவர்களுக்கு ஏற்பட்ட மிகப் பெரிய பணச்சுமை, கடன்கள் ஆகியவற்றிலிருந்து ஓரளவுக்கு அவர்கள் விடுபடக் கூடிய நிலையில் இருந்தால் தான் அவர்கள் மீண்டும் தங்களுடைய சேவையைத் திருப்திகரமாகச் செய்ய முடியும் என்பதை அரசாங்கமும் சம்பந்தப்பட்ட அமைச்சுக்களும் உணர வேண்டும். சாதாரண வாழ்க்கையிலுள்ள நடைமுறை அனுபவத்தை உணர்ந்து அவர்களுக்கு வேலையில்லாக் காலத்துக்கான ஊழியத்தை வழங்குவதில் அமைச்சுக்களிடையே பாரபட்சமோ வேறுபட்ட கொள்கையோ இல்லாமல் மீண்டும் வேலை அளிக்கப்படுகின்ற அனைவருக்கும் உடனடியாக வேலையில்லாக் காலத்துக்கான சம்பள உயர்வை அளிப்பதற்கு இந்த அமைச்சு உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும்.*

*பல அமைச்சு அலுவலகங்களிலே காலியான இடங்கள், நிரப்பப்படக் கூடிய ஸ்தானங்கள் இருந்தும் அவை நிரப்பப்படாமல் இருப்பது மிகவும் கவலைக்குரியதாகும். ஆகவே, அந்தந்த அமைச்சுக்களில் சம்பந்தப்பட்டவர்கள் தயவு செய்து மனிதாபிமான அடிப்படையில்—மிகப் பெரிய குடும்பங்களோடு, பல குழந்தைகளோடு குடும்பத்தை நடத்த முடியாமல் தற்கொலையிலே வாழ்க்கையை முடித்துக் கொண்டவர்களுடைய கதைகளையாவது நினைவுபடுத்தி இனியும் பலர் அந்த மாதிரியான முடிவுக்கு வருவதைத் தடுப்பதற்கு—எவ்வளவு சீக்கிரமாக வேலை இழந்தவர்களுக்கு வேலையை வழங்க முடியுமோ அவ்வளவு சீக்கிரமாக வழங்க வேண்டும். அப்படி வேலை வழங்கப்பட்டவர்களுக்கு கடந்த இரண்டு வருட காலமாக ஏற்பட்ட தாங்க முடியாத நிதிக் கொடுமைப் பாரத்தைக் குறைப்பதற்கும் அவர்கள் மீண்டும் சாதாரண வாழ்க்கைக்குத் திரும்புவதற்கும் திரும்பி வந்து கடமை புரியும் போது வழமை போலத் தங்கள் திறமையினைக் காட்டிக் கடமையாற்றுவதற்கான வாய்ப்புக்களை உருவாக்குவதற்கும் வேண்டி வேலையில்லாக் காலத்துச் சம்பளத்தை அவர்களுக்கு வழங்குவதற்குவதற்கான நடவடிக்கையை எடுக்க வேண்டும் என்று மிகவும் தாழ்மையாகக் குறித்த அமைச்சர்களைக் கேட்டுக் கொள்கிறேன்.*

*எனக்கு முன் பேசிய கௌரவ ஹப்புதளைப் பிரதிநிதி (திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார) இந்த நாட்டிலே மொழிகளைப் பொறுத்த வரையிலே இந்த அமைச்சு எடுக்க வேண்டிய நடவடிக்கைகளைப் பற்றிக் குறிப்பிட்டார். இங்கு முன்பு பேசிய கௌரவ ஊர்காவற்றுறை பிரதிநிதி (திரு. கா. பொ. இரத்தினம்) அவர்கள், கௌரவ ஹப்புத்தளை பிரதிநிதி அவர்கள் குறிப்பிட்டதைப்போல, சிங்கள மொழிக்குக் கூடிய இடம் அளிக்கப்பட்டதென்று குறை கூறியதாக நான் கேட்கவில்லை. தமிழ் மொழி, இந்த நாட்டின் தேசிய மொழியாக ஏற்றுக் கொள்ளப்பட்ட பின்பும் அதற்கு உரிய இடம் அளிக்கப்படவில்லை; குறிப்பாக தமிழ் மொழியை அமுல் நடத்துவதற்கான விதிகள் நடைமுறைப்படுத்தப்பட, அவை பிரசுரப்படுத்தப்படவில்லை என்பதைப் பல தடவைகள் இந்தச் சபையின் கவனத்துக்குத்தாம் கொண்டு வந்துள்ளதாகத் தான் அவர் கூறினர். தமிழிலே சில அலுவல்களை மேற்கொள்வதற்கு சில அலுவலர்கள் முயன்றாலும் அவர்களுக்குச்சில கடிதப் போக்குவரத்துக்களைத் தமிழிலே செய்வதற்கான வாய்ப்புக்கள் இல்லாமலிருப்பதை நாங்கள் மறந்துவிட முடியாது. அலுவலகங்களிலே வேண்டிய தட்டச்சுக்களோ தட்டெழுத்தாளர்களோ இல்லை என்பது இந்த அமைச்சருடைய கவனத்திற்குக் கொண்டுவர வேண்டிய மிக முக்கியமான விடயங்களில் ஒன்றாகும். ஆகவே கௌரவ ஹப்புத்தளை அங்கத்தவர் கூறியது போல சிங்களத்திலும் சரி தமிழிலும் சரி கடமையாற்றும் ஆற்றல் உள்ளவர்கள் இருந்தாலும் அதற்கு வேண்டிய சாதனங்கள் இல்லாத குறை பல அலுவலகங்களில் சிங்களமும் தமிழும் செயல்படுவதைத் தடைப்படுத்துகின்றது; தாமதப் படுத்துகின்றது. குறிப்பாகத் தமிழ்ப் பிரதேசங்களிலே இருக்கும் பல்வேறு அலுவலகங்களிலே போதிய தமிழ்த் தட்டெ*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ඇලෑලසුන්දරම් මහතා]

மூத்துப் பொறிகள் இல்லை என்பதைக் கௌரவ அமைச்சர் கவனத்திற்கு எடுக்கவேண்டும். அத்துடன் போதிய தட்டெழுத்தாளர்களை நியமிக்க அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்கவேண்டியதும் மிகமிக அவசியம்.

இந்த அமைச்சைப் பொறுத்த அளவில் ஆங்கிலத்திற்குக் கூடுதலான இடம் கொடுக்கப்பட்டிருப்பதை இந்தச் சபையின் கவனத்திற்குக் கௌரவ ஹப்புத்தஜைப் பிரதிநிதி கொண்டு வந்தார். நாங்கள் விரும்பியோ விரும்பாமலோ இருபதாம் நூற்றாண்டின் கடைசிக் கூறில் இருக்கும் நாங்கள் ஆங்கிலத்தின் முக்கியத்துவத்தை முற்றுமுழுதாக ஒதுக்கிவிட்டு வாழக்கூடிய நிலையிலில்லை என்பதை நான் இச்சபையில் எடுத்துக் கூறவேண்டிய அவசியம் இல்லை. அதி உத்தம ஜனாதிபதி அவர்களே இந்த நாட்டிலே ஆங்கிலத்திற்கு அளிக்கப்பட வேண்டிய முக்கியத்துவம் பற்றி மிகத் தெளிவாக ஆற்றிய சில உரைகளைப் பத்திரிகைகளில் படிக்கக்கூடிய வாய்ப்பை நான் பெற்றேன். எது எப்படி இருப்பினும் நாளை இந்த நாட்டிலே வாழப்போகும் எதிர்காலச் சந்ததியினர் ஒன்றோ இரண்டோ மூன்றோ அல்லது அதற்கு மேற்படவோ பல மொழிகளைக் கற்பதன் மூலம் அவர்கள் அடையக்கூடிய பலாபலன்கள் பற்றிய விடயத்திலும், அவர்கள் உலக அரங்கில் மற்றைய நாட்டினரோடு சமனான அறிவு பெற்றவர்களாக இருப்பதற்கு உரிய வாய்ப்புப் பெற எந்த மொழிக் கல்வி அவசியம் என்பது பற்றிய விடயத்திலும் நான் நினைக்கிறேன் எங்களைவிடக் கல்விமான்கள் காணும் முடிவு நிச்சயம் உதவியாக இருக்கும். ஆகவே ஆங்கிலத்தைப் பொறுத்தவரையில் அதற்குரிய இடம் இந்த நாட்டில் எது என்பதை மிகவும் சீக்கிரம் தீர்மானித்து அதற்கு உரிய இடத்தை தாங்கள் கொடுக்கவேண்டும். ஆங்கிலத்திற்கு உரிய இடத்தைக் கொடுக்காத காரணத்தால் நமது இளம் சந்ததி இன்று பின் தங்கி இருக்கிறது. அதே நேரம் தேசிய மொழிகளுக்கு உரிய இடம் அளிக்கப்படாத ஒரு நிலையும் தொடர்ந்து இருக்கிறது. ஆகவே தேசிய மொழிகளின் நிலையையும் ஆங்கில மொழியின் நிலையையும் நாம் உடனடியாக வரையறுத்துக் கொண்டால் தேசிய மொழிகளும் ஆங்கில மொழியும் நமது மக்களுக்குப் பயன்படத்தக்க நிலையை நாம் உருவாக்க முடியும் என்பது எனது கருத்து. இந்த இரண்டு விடயங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் தமது கவனத்திற்கு எடுத்துக் கொள்ளவேண்டும்.

மேலும் வேலை நிறுத்தக்காரர்களுடைய பிரச்சினை இரண்டாவது ஆண்டு நிறைவை நெருங்கிக் கொண்டு இருக்கிறது. இந்த நாளிலாவது சம்பந்தப்பட்ட அமைச்சர்கள் இதுவரை வேலை வழங்காமல் இருப்பவர்களுக்கு உடனடியாக வேலை வழங்கவேண்டும்; கூடிய அளவு ஏற்கனவே அவர்கள் கடமையாற்றிய இடங்களில் அவர்களுக்குரிய வேலையை வழங்குவது பொருத்தமாக இருக்கும். இரண்டு வருடகாலம் உழைப்பு இன்றி ஆயிரக்கணக்கான ரூபாக்களைக் கடனாகப்பெற்று வாழ்ந்தவர்களைத் திடீரென்று மிகத் தூர இடத்திற்கு மாற்றிவிட்டால் அவர்கள் மேலும் சிரமப்பட்டு வாழவேண்டிய நிலைமை ஏற்படும். நாங்கள் எதிர்பார்க்கின்ற திறமையான சேவையை அரசாங்கமும் அவர்களிடமிருந்து பெற முடியாது. ஆகவே, அவர்கள் முன்னர் எந்தெந்த இடங்களில் கடமையாற்றினார்களோ அந்தந்த இடங்களில் அவர்கள் தொடர்ந்து கடமையாற்ற ஆவன செய்ய வேண்டியது இந்த அமைச்சருடைய கடமை என்று கூறி எனது உரையை முடித்துக்கொள்ளுகிறேன்.

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
*(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலை)*
**(Mr. Ananda Dasanayake)**

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් යන අමාත්‍යාංශ දෙකම අයිති මේ ඇමතිතුමාටයි. මම හිතන හැටියට රජය පසුගිය කාලයේදී ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත්ත තීරණ තමයි, පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම හැකිතාක් දුරට අඩු කිරීම.

**හරින්ද්‍ර කොරයා මහතා**
*(திரு. ஹரீந்திர கொறயா)*
**(Mr. Harindra Corea)**

I have made it clear that this is not a Supplementary Estimate. No money is asked for. What we have done is that on a certain date; we have frozen the savings and these savings are being used.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dasanayake)**

You have not explained.

**හරින්ද්‍ර කොරයා මහතා**
*(திரு. ஹரீந்திர கொறயா)*
**(Mr. Harindra Corea)**

It is all there. You know where your docket is. If you look in it you will find some papers, and everything explained in those papers. Do not waste the time of the House. Do not say it is a Supplementary Estimate. Say anything you want.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dasanayake)**

The Hon. Acting Minister can explain after my speech if I am wrong.

**හරින්ද්‍ර කොරයා මහතා**
*(திரு. ஹரீந்திர கொறயா)*
**(Mr. Harindra Corea)**

When I moved the Motion I said that it is not a Supplmentary Estimate.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dasanayake)**

Do not disturb me!

**හරින්ද්‍ර කොරයා මහතා**
*(திரு. ஹரீந்திர கொறயா)*
**(Mr. Harindra Corea)**

On a point of Order! The hon. Member is misleading the House. This is not a Supplementary Estimate. I mentioned it when I moved the Motion.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Acting Minister has already explained it.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dasanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයෙදි මා පළමුවෙන්ම පෙන්වා දෙන්න උත්සාහ කළේ, මෙම වැය ශීර්ෂයට, අරමුදල්වලින් හෝ ණයට ගත් මුදලකින් හෝ මොන යම් විධියකින් ලබා ගත් මුදලකින් හෝ යෙදුවත් මෙය පරිපූරක ඇස්තමේන්තුවක් වශයෙන් ඉදිරිපත් කර ඇති බවයි. මම හිතන හැටියට මොන දෙයක් සඳහා මේ මුදල යොදා ගන්නවාද කියා අපට පැහැදිලි කර දී නැහැ. රාජ්‍ය පරිපාලනයෙ මොනවාටද, මේ මුදල යොදා ගන්නෙ? අපි දන්නෙ නැහැ, මොන විධියෙ අමුතු රාජ්‍ය පරිපාලන යක් අවශ්‍ය වී තිබෙනවාද, මොනවාටද මේ මුදල් යොද වන්නෙ කියා. අපි බලාපොරොත්තු වෙනවා, වැඩ බලන ඇමතිතුමාගෙ පිළිතුරෙන් ඒ පිළිබඳ විස්තරයක්.

**හරින්ද්‍ර කොරයා මහතා**
*(திரு. ஹரிந்திர கொறயா)*
(Mr. Harindra Corea)

Already every hon. Member has been furnished with an explanation of this proposal. It is in their dockets. We are spending this money on the Sri Lanka Institute of Development Administration. The expenditure will be met with local funds as well as foreign aid.

**අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන)
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலியா-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*
(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)

How can you say it is not a Supplementary Estimate. You do not understand.

**හරින්ද්‍ර කොරයා මහතා**
*(திரு. ஹரிந்திர கொறயா)*
(Mr. Harindra Corea)

Supplementary Estimate means that we are asking the Treasury for extra money. We are not asking for any extra money. We do not want any money from the Treasury. It is not going to effect the Budget. All the details are given in the explanation provided to hon. Members.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dasanayake)

වැඩ බලන ඇමතිතුමා පොඩ්ඩක් ඉවසන්න. ඔය විධියට උඩ පැනල කැබිනට් මණ්ඩලයෙ වැඩ කරන්න බැහැ. ටිකක් ඉවසල කටයුතු කරන්න.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

There is no docket here.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

පොඩ්ඩක් ඉවසන්න. අපට අවස්ථාවක් තිබිය යුතුයි, යම්කිසි ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. එහෙම ඉදිරිපත් කළාට පස්සෙ වරදක් ඇත්නම් ඒ වරද නිවැරදි කිරීම හෝ එයට වැඩියෙන් එකතු කිරීම හෝ කපා දැමීම වැඩ බලන ඇමතිතුමාට අයිති වැඩක්. මෙය අනුමත කරන්නට පෙර එතුමාට තිබෙනවා. පිළිතුරු කතාව කරන්න. [බාධා කිරීමක්] අපට ඕනෑ කරන්නෙ මේ මුදල් මොන කාරණයක් සඳහා යොදවනවාද කියා දැනගන්නටයි. ඒක තමුන්නාන්සේ පැහැදිලි කළ යුතුයි. තමුන්නාන්සෙගෙ පිළිතුරු කතාවෙදි අපි ඒක බලාපොරොත්තු වෙනව.

ගරු කථානායකතුමනි, පසුගිය අයවැය ලේඛන විවාදයෙදිත්, ඊට ඉස්සර අවුරුද්දෙදිත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අදාළ මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කරුණු රාශියක්ම ඉදිරිපත් කළා. හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) ඉදිරිපත් කළ කාරණය මමත් ඉදිරිපත් කළා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන්, රජයෙන්ම පැවැත්වූ විභාගයකින් සමත් වූ අයට පත්වීම් නොදී වෙනත් පිරිසකට පත්වීම් දුන්නාය කියන කාරණය මමත් ඉදිරිපත් කළා. මේ වරද නිවැරදි කරන්නටය කියා කිප වතාවක්ම ඉල්ලා සිටියා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙ ඉතිහාසයටම කළ විශාල වරදක් ඒක. ඒ කියන්නෙ, සමත්වුණු අයට පත්වීම් නොදී වෙනත් අයට පත්වීම් දීම. ඒ අයට ඒ අවස්ථාවේ දී පත්වීම් නොදී මගහැරීම අපරාධයක්ය කියා මම හිතනවා. විභාගයට පෙනී ඉඳලා, සම්මුඛ පරීක්ෂණයටත් පෙනී ඉඳලා; ඒවායින් සමත් වී ඒ අනුව ඔවුන්ට ලියුම් ද තැපැල් කළාට පසුව ඒක අහෝසි කළා. කිසිම නීතියක් රීතියක් නැතිව එසේ කිරීමෙන් තමන්ට බලවත් අසාධාරණයක් කළාය කියන එකයි ඒ අයගේ හැඟීම. මේ නිසා පරිපාලන සේවාවේ සියලුම නිලධාරීන් අධෛර්යයට පත්වෙලා ඉන්නවා. විභාග පැවැත්වීමෙන් වැඩක් නැතැයි ඒ අය හිතනවා.

හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) මතක් කළා වාගේ මමත් නැවත වතාවක් බල කර කියනවා. අමාත්‍යාංශය කළ වරද පිළිගෙන, එය නිවරද කර, වෙනත් අයට විභාග පැවැත්වීමට පෙර, ඒ කලින් සමත් වූ අය සම්මුඛ පරීක්ෂණවලට කැඳවා ඔවුන්ට පත්වීම් දී, ඊළඟට තවත් ඇබෑර්තු තිබෙනවා නම්, අනික් අය සඳහා විභාග පවත්වා පරිපාලන සේවයට බඳවා ගන්නටය කියා. එහෙම කිරීම හොඳයි කියන එකයි මගේ හැඟීම.

අනෙක් කරුණ පෙන්ෂන්—විශ්‍රාම වැටුප්— සම්බන්ධවයි. ආණ්ඩු පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් කථා කළා මේ පෙන්ෂන් සම්බන්ධයෙන් සිදුවී තිබෙන අසාධාරණකම් ගැන. ඒකට හේතුවක් තිබෙනවා: 1978



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]
දෙසැම්බර් 31 වැනිදායින් පසුව පෙන්ෂන් ගිය අයට ඒකාබද්ධ වැටුප් මත පෙන්ෂන් දීමත්, ඊට කලින් අයට මූලික පඩිය අනුව පෙන්ෂන් දීමත් අතර තිබෙන වෙනස නිසයි මේ ප්‍රශ්නය ඇති වී තිබෙන්නෙ. මේ ප්‍රශ්නය නිරාකරණය කරන්න කොමිටි කිහිපයක් පත් කළා මට මතකයි. ගරු වැඩබලන ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් සෑහෙන උත්සාහයක් ගත් බවත් මම දන්නවා. නමුත් අපි තවම ඒවායේ ප්‍රතිඵල දන්නේ නැහැ. මේ බලන්න, මට දැන් ලිපියක් ලැබී තිබෙනවා. මේක ඒ අයම සකස් කරලා එවලා තිබෙන්නෙ. අපි මේ අපේම වුවමනාවට කෑ ගහනවා නොවෙයි, මේක මම ඇමතිතුමාට එවනවා-මේ පෙන්ෂන් ලබාපු පුද්ගලයෙක් ඔහුගේ දුක් ගැනවිල්ල ඉදිරිපත් කරනවා මේ විධියට-මේ විටින් විට යැවූ ලිපි ලේඛන හා පත්‍රවල පළවූ ලිපි.

ගරු වැඩබලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමා මේක විකක් කියවා බලන්න. එය කියවා බලා ඒ ගැන අවබෝධයක් ලබාගෙන, එය මට ආපසු එවන හැටියට මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] මේ පෙන්ෂන් සම්බන්ධයෙන් තිබෙන අර්බුදය විසඳන්නය කියා මා ඉල්ලා සිටිනවා. එක පිරිසකට-අළුතෙන් පෙන්ෂන් යන අයට-ඒකාබද්ධ වැටුප අනුව පෙන්ෂන් දීමත්, පසුගිය කාලයේ එම සේවයම කළ අයට-1978 ට කලින් පැන්ෂන් ගිය අයට-මූලික පඩිය අනුව, ඒකාබද්ධ වැටුපට එන ඵලවුන්ස් එකතු කරන්නේ නැතුව, සුළු පඩියකට සීමා කර පෙන්ෂන් දීමත් නවත්වලා මේ දෙගොල්ලටම ඒකාබද්ධ වැටුප් තලය මත පෙන්ෂන් දීමට වහාම කටයුතු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

මම හිතනවා කොමිටියකින් මේ සම්බන්ධව පරීක්ෂණ පැවැත්වූවාය කියා. විශේෂයෙන්ම ඒ සම්බන්ධව කට යුතු කළේ දැන් වැඩබලන ඇමතිතුමායි. එනිසා අපි ඒ සම්බන්ධව එතුමාට වැඩි වැඩියෙන් කරුණු කියන්න වුවමනාවක් නැහැ. ඉතා ඉක්මණින් ඒ සම්බන්ධව නීරණයක් ගන්න කියා මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම එසේ කියන්නේ ඒ පෙන්ෂන් ලැබූ අය ඒ සම්බන්ධව ඉතා විශාල බලාපොරොත්තුවකින් බලා සිටින නිසයි.

ඊළඟට මෙම අමාත්‍යාංශයේ උසස්වීම් හා ස්ථිර කිරීම් කෙරෙන ආකාරය පිළිබඳව අපට ලැබෙන පැමිණිලි අනුව නම් අපට සතුටු වෙන්නට පුළුවන්කමක් නැහැ. නියම විධියට උසස්වීම් දීමේ ක්‍රමයක් මෙම අමාත්‍යාංශයේ නැහැ. උසස්වීම් දීම තවමත් දේශපාලකයන්ගේ ඇඟිලි ගැසීම් උඩ සිදු වෙනවාය කියන එකයි මගේ නම් හැඟීම. මම එසේ කියන්නේ අපට ලැබෙන පැමිණිලි අනුවයි. බොහෝ අවස්ථාවලදී දේශපාලකයන්ගේ ඇඟිලි ගැසීමෙන්, ඒ අය ඒවාට "ඉන්ටර්ෆියර්" කරලා තමන්ට ඕනෑ එක්කෙනාට උසස්වීම් ලබා දෙනවා. නමුත් මෙන්න මේ ක්‍රමයටයි උසස්වීම් දෙන්නේ කියා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පොදු ප්‍රතිපත්තියක් තිබෙන්නට ඕනෑ. හැම අමාත්‍යාංශයකම කටයුතු ගැන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වගකීමක් තිබෙනවා. [බාධා කිරීමක්]

මම තමුන්නාන්සේට එකක් කියන්නම්. ඒ කාලයේ තොරතුරු දුන් ගමේ ගිහින් ඉවරයි. තමුන්නාන්සේලා දැන් කරන කටයුතු හරියට කරන්න. තංගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ජිනදාස වීරසිංහ මහතා) අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (එම්. ඩී. ප්‍රේමරත්න මහතා) පසුගිය කාලයේ තොරතුරු කියා නිදහස් වෙන්න බලාපොරොත්තු වෙනවා. මම විශේෂයෙන් කියන්නට කැමතියි, හැම රජයක්ම බලන්නේ පසුගිය ආණ්ඩුව පිට වැරදි පටවා තමන් කරන වැරදිවලින් බේරෙන්නටයි. [බාධා කිරීමක්] එහෙම කිව්වාට මේ රටේ මහජනතාව ඒවා පිළිගන්න සූදානම් නැහැ. පසුගිය ආණ්ඩුව මේ රටේ ජනතාව දඬුවම් දුන්නා. පසුගිය ආණ්ඩුව වැරදි කළ නිසා 1977 දී ඒ ආණ්ඩුව ඉවත් කර දඬුවමක් දුන්නා. දැන් තමුන්නාන්සේලාගෙ ආණ්ඩුවත් මහජනතාවගෙන් ඒ විධියේම දඬුවමක් බලාපොරොත්තු වෙනවාද ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ඒ දඬුවමම වෙයි.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

තවත් ඒ දඬුවමම ලබා ගන්න උත්සාහ කරනවාද? එහෙම කරනවා නම් මම හිතන්නේ කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම ගැන දන්නේ නැතුව කරන දෙයක්. කැබිනට් මණ්ඩලයේ එක් ඇමතිවරයෙක් හෝ කරන වරද මුළු කැබිනට් මණ්ඩලයම සාමූහිකව භාර ගන්නට ඕනෑ. බේරීමක් නැහැ. ඒ සියලු දෙනාටම දඬුවම ලැබෙනවා.

එම නිසා මම විශේෂයෙන් කියන්නට කැමතියි. කරුණාකර මේ උසස්වීම් දීම යම්කිසි ක්‍රමයකට සකස් කරන්න. කිසිම දේශපාලනඥයකුගේ ඇඟිලි ගැසීමක් නැතිව, ලැබෙන තොරතුරු අනුව, ඔවුන්ගේ කුසලතා අනුව, සුදුසුකම් අනුව නියමිත කාලයේදී උසස්වීම් දීමට කටයුතු කරනවා නම් මම හිතන හැටියට එය ඉතාමත් වැදගත් වෙනවා.

ඒ වාගේම ස්ථිර කිරීම් සම්බන්ධවත් කියන්නට තිබෙනවා. මේ ප්‍රශ්නය පිළිබඳව කීප වතාවක් මම මේ ගරු සභාවේ සඳහන් කර තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම පිළියමක් යෙදී නැහැ. රජයේ සේවයට බඳවා ගන්නා ආකාරය දෙස බැලුවාම කීප ආකාරයකින් එයට බඳවා ගන්නවා. අනියම් සේවකයන් හැටියට බඳවා ගන්නවා. ඒ විධියට බඳවාගත් සේවකයන් ලක්ෂ ගණනක් සිටිනවා. වෘත්තීය සමිති කටයුතුවල නිරත වී සිටින නිසා ඒ පිළිබඳව අපි හොඳින් දන්නවා. මේ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අපි හැමදාමත් කරුණු ඉදිරිපත් කරනවා. නමුත් ප්‍රතිඵලයක් නැහැ. මම හිතන හැටියට මේක පාරම්පරිකව එන දෙයක්. ඒ වාගේම තාවකාලික පදනම පිට තවත් සේවකයන් කොටසක් බඳවා ගන්නවා. "ටෙම්පරරි එම්ප්ලෝයිස්" කියා. ඒ තාවකාලික සේවක පිරිස දෙවනුවට ඉන්නවා. ඒ අයට කවදාවත් ස්ථිර තත්ත්වයට එන්නට ලැබෙන්නේ නැහැ. සමහර විට ඒ අනියම් සේවක ගණයට වැටෙන කොටසට අයත් උදවියට අවුරුදු තිස් පහ, හතළිහ සේවය කරලත් අනියම් සේවකයන් හැටියටම, රජයේ කිසිම වරප්‍රසාදයක් නැතිව රැකියාවෙන් ඉවතට යන්නට සිදුවෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම උදාහරණයක් කියන්නම්. ප්‍රේක්‍ෂාකර්ම ප්‍රදර්ශකයන් සහ ප්‍රදර්ශිකාවන් කියා කොටසක් සිටිනවා. ඒ අයට පෙන්ෂන් එකක් නැහැ. අර්ථසාධක මුදලක් නැහැ. මේ ගණයට වැටෙන සිය ගණනක් සිටිනවා. ඒ අය රාජකාරිය කරනවා. අවුරුදු 15, 20, 25 ආදී වශයෙන් මේ විධියට රාජකාරි කරනවා. නමුත් අර්ථසාධක අරමුදලට දායක වීමක් නැහැ. ඒ වාගේම පෙන්ෂන් එකටත් අයිතියක් නැහැ. නමුත් රජයේ සේවකයෙක්. අවුරුදු පහළොවක් විස්සක් තිස්සේ සේවයත් කරනවා. අන්තිමේ සේවය අත්හරින විටත් ඔවුන්ට විශ්‍රාම වැටුපක් නැහැ. අර්ථසාධක අරමුදලේ දායකත්වයත් නැහැ.

මෙන්න මේවා ගැන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සොයා බලන්නට ඕනෑ. සමීක්‍ෂණයක් කර මේවා සකස් කරන්නට ඕනෑ. කවුරු හෝ එය කරන්නට ඕනෑ. අපි බලාපොරොත්තු වන්නේ මින් ඉදිරියට පිහිටුවන රජයක් මේවා සකස් කරන්නට ඕනෑය කියන එක නොවෙයි. ඒ ප්‍රතිපත්තිය වැරදියි. ඒක ඒ දවස්වලට අපි බලාගමු. දැන් තිබෙන රජයෙන් ඒ රජයේ සේවකයන්ට සිදු වන හානියක් තිබෙනවා නම් ඒ හානිය නැති කළ යුතුයි; බාධාවක් තිබෙනවා නම් ඒ බාධාව නැති කළ යුතුයි. ඒ නැති කිරීමෙන් රජයට යම්කිසි පිරිසකගේ ළැදියාවක් ඇති කෙරෙනවා. අපි කියන්නේ ඒකයි. අපට ඒ අය නම්මගන්න කියනවා නොවෙයි. තමුන්නාන්සේලා ඒ අයට සාධාරණය ඉටු කළාම ඒ සඳහා කෘතගුණ සැලකීමක් තිබේවි. තමුන්නාන්සේලා ඒක ලබාගන්න. අපට කමක් නැහැ. මෙම අසාධාරණය නැති කරන්න.

ඔය ප්‍රේක්‍ෂකර්ම ප්‍රදශික ප්‍රදර්ශිකාවන් අවුරුදු 15, 20 සේවයේ යෙදී ඇතත් ඔවුන්ට අර්ථසාධක අරමුදලේ දායකත්වයක් නැහැ. ඒ වාගේම විශ්‍රාම වැටුප් හිමිකමකුත් නැහැ. මේ දෙකම නැත්නම් ඒ අය රජයේ සේවකයන් හැටියට සේවය කිරීමේ තේරුමක් තිබෙනවාද? තමන්ගේ සේවා කාලය ගත කර අවසාන කාලයේ ගෙදර යන විට ඔවුන්ට කිසිම හිමිකමක්-අයිතියක් නැහැ. නිකම්ම හිස් අතින් තමයි ගෙදර යන්න සිද්ධ වෙන්නෙ. එතකොට අර තමන් වෙනුවෙන් සිටින ළමා ළපටින් ඇති දැඩි කරන්නේ, බලාගන්නේ කොහොමද? එය කොතරම් අසාධාරණද?

ඒ වාගේම මම දන්නවා, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ තාවකාලික සේවකයන් 1,20,000 කට වැඩි සංඛ්‍යාවක් සිටිනවා. ඒ අය අවුරුදු 20, 25, 30 සේවය කළ අයයි. ඒ අය විශ්‍රාම යන වයසට පත් වන විට වැඩ දෙන්නෙ නැහැ. වයස සම්පූර්ණ වුණාම ඒ අයට වැඩ දෙන්න බැහැ කියනවා. ඒ වැඩ දෙන්නෙ නැති දවස වන තුරු ඔහු අනියම් සේවකයෙක්. හය මාසයෙන් හය මාසය සේවය අලුත් කරනවා. තමන්ගේ සේවා කාලය අත් සිටුවා නැවත පත්වීම අලුත් කරනවා. එක් ලක්‍ෂයට අධික ගණනක් ඒ විධියේ සේවකයන් ඉන්නවා. ඒ අනුව මුළු රාජ්‍ය තන්ත්‍රයේම ඔය විධියේ වරප්‍රසාද අහිමි ලක්‍ෂ දෙකක් දෙකහමාරක් පමණ සේවක පිරිසක් සිටිනවා. [බාධා කිරීම්]

Do not get excited for trivial matters. Why do you want to get excited?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

Order, please! Let there be no cross talks.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

ඔය විධියට අනියම් සේවකයන් ගැන සමීක්‍ෂණයක් ගන්න. තාවකාලික සේවකයන් ගැන සමීක්‍ෂණයක් ගන්න. අනික් අයට වාගේම ඒ අයටත් වරප්‍රසාද දෙන්න ඕනෑ. ඔවුන්ට තිබෙන දුක්ගැනවිලි විභාග කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයිති කාර්යයක්. තමුන්නාන්සේ වැඩ බලන ඇමතිවරයා වුණත්, තරුණ ඇමතිවරයෙක් වශයෙන් අපේ ඇමතිතුමාට උපදෙස් දෙන්න පුළුවන් කෙනෙක්. [බාධා කිරීම්] තරුණ ඇමතිවරයත් වයස ඇමතිවරයත් දෙන්නම නීතිය එක විධියට පිළිපැදිය යුතුයි. මොනවා වුණත් ගරු වැඩ බලන ඇමතිවරයාගෙන් මම විශේෂයෙන් ඉල්ලනවා, තමුන්නාන්සේගේ කාලයේදී ගරු ඇමතිතුමාගේ අවධානය මේ ප්‍රශ්නය කෙරෙහි යොමු කර මෙය විසඳීමට ක්‍රියා කරන්නය කියා.

ඊළඟට වැඩ අනහැරියාය කියන අය ගැන [බාධාකිරීම්.]. 'ස්ට්‍රයික්' නැත්නම් වැඩ වර්ජනය කළ අය හැඳින්වීම සඳහා ගරු අගමැතිතුමා අලුත් වචනයක් යොදා ගත්තා 'සේවය අත්හැර ගිය අය' කියා. නමුත් ඇත්ත වශයෙන් සිදු වුණේ 'ස්ට්‍රයික්' කිරීම නිසා ඒ අය සේවයෙන් දොට්ට දැම්මයි. ඒ කොහොම වුණත් මේ අවස්ථාවේදී අපට ඒ අලුත් වචනයෙන් වැඩක් නැහැ. ඒ අයට නැවත රක්ෂාව ලබා දිය යුතුය කියා රජය පිළිගෙන තිබෙනවා; ජනාධිපතිතුමා සාධාරණ තීරණයක් ගෙන තිබෙනවා. එම තීරණය අරගෙනත් දැන් අවුරුදු 1 1/2 කටත් වැඩියි. මම වතාවක්, එම තීරණයට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනත් ඉදිරිපත් කළා.

මම කියන්නේ නැහැ. ඒ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මහන්සි ගත්තේ නැත කියා. ඇත්ත වශයෙන්ම ඒ අය මහන්සි ගත්තා. ඒ අනුව වැඩ වර්ජකයන් නැවත සේවයට ගත් අමාත්‍යාංශවලට, ඇමතිතුමන්ලාට අපේ ස්තුතිය හිමි වෙනවා. ප්‍රවාහණ අමාත්‍යාංශයේ වැඩි දෙනෙක් නැවත සේවයට ගෙන තිබෙනවා. කම්කරු අමාත්‍යාංශයේත් වැඩ වර්ජකයන් සියලු දෙනාම වාගේ වැඩට ගෙන තිබෙනවා. අධිකරණ අමාත්‍යාංශයේ 90%ක් නොව 95%ක් ම වාගේ නැවත වැඩට ගෙන තිබෙන අතර, තව කීප දෙනෙක් පමණයි, එළියේ ඉන්නේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත් ඒ අය ආපසු වැඩට ගෙන තිබෙනවා. ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයත් ආපසු ඒ අයට වැඩ දී තිබෙනවා. වෙළෙඳ අමාත්‍යාංශයත් ඒ අය වැඩට අරගෙන තිබෙනවා. කීප දෙනකු පමණයි, අරගෙන නැත්තේ, ක්‍රීඩා අමාත්‍යාංශයත් ඒ අය ආපසු වැඩට ගෙන තිබෙනවා. ඒ වුණත් වැඩ වර්ජකයන් ඒ විධියට ආපසු වැඩට නොගත් අමාත්‍යාංශ කීපයක් තිබෙනවා. විශේෂයෙන්, ඒ විධියට වැඩ වර්ජකයන් ආපසු වැඩට නොගත්තේ ගරු අගමැතිතුමා යටතේ ඇති අමාත්‍යාංශයි. පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයත්, මහා මාර්ග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

අමාත්‍යාංශයත් ජනාධිපතිතුමාගේ තීරණය ක්‍රියාත්මක කර නැහැ ; වැඩ වර්ජකයන් ආපසු සේවයට අරගෙන නැහැ. ඒ අය 'සේවය අත්හැර ගියා' කියමින් තමයි, ඒ යුතුකම පැහැර හැර තිබෙන්නේ.

එපමණක් නොවෙයි. ගරු අගමැතිතුමා පළාත් පාලන ඇමති වශයෙන් විශේෂ පනත් කෙටුම්පතකුත් මේ ගරු සභාවට ඉදිරිපත් කොට සම්මත කර ගත්තා, වැඩ වර්ජනය කළ අය වෙනුවෙන් පත් කර ගත් සේවකයන් ස්ථිර කිරීම සඳහා. මා දන්නේ නැහැ. ඒ පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කළේ කැබිනට් මණ්ඩලයේ තීරණයක් අනුව ද කියා. මා එහෙම කියන්නේ මේ නිසයි :

එක පැත්තකින් ගරු ජනාධිපතිතුමා කියනවා, වැඩ වර්ජනය කළ සියලු දෙනාම නැවත සේවයට ගන්නය කියා. අනෙක් පැත්තෙන් ගරු අගමැතිතුමා ඊට පරස්පර විරෝධි අන්දමේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කොට සම්මත කර ගන්නව. ජනාධිපතිතුමා කියනවා, සාධාරණය ඉෂ්ට කරන්නය. ඒ අයට නැවත රැකියාව දෙන්නය, ඔවුන් නැවත සේවයේ පිහිටුවන්නය කියා. එය ප්‍රවෘත්ති පත්‍රවලත් පළ වුණා. ගුවන් විදුලියෙනුත් ප්‍රචාරය කෙරුණා. ජනාධිපතිතුමා 'ග්‍රෑප් මීටිංස්වලත්' නැත්නම් ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලත් ඒ බව ප්‍රකාශ කර තිබෙනවා. නමුත් අගමැතිතුමා යටතේ ඇති අමාත්‍යාංශවල ඒ තීරණය ක්‍රියාත්මක වී නැති බවයි, පෙනෙන්නේ.

මීට කලිනුත් මේ ගැන ප්‍රශ්න කළ කීප අවස්ථාවක දීම රජය අපට කීවේ, ඒ අයට නැවත වැඩ දීගෙන යන බවයි. නමුත් ගරු අගමැතිතුමා කියනවා, ඒ අයට නැවත රක්ෂාව දීම සඳහා 'වේකන්සීස්' නැත්නම් ඇබෑර්තු නැත, තිබුණු පුරප්පාඩු පුරවා තිබෙනවා කියා. මා කලින් සඳහන් කළ විධියට ගරු අගමැතිතුමා විශේෂ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කොට සම්මත කර ගනිමින් ඒ ඇබෑර්තු පිරවීම මඟිනුයි, වැඩ වර්ජකයන්ට නැවත සේවය දෙන්න බැරි තත්ත්වයක් ඇති කර තිබෙන්නේ. පුරප්පාඩු නැත' කියමින් තමා යටතේ ඇති අමාත්‍යාංශවල වැඩ වර්ජකයන් ආපසු සේවයට නොගැනීමෙන් එතුමා කරන්නේ අසාධාරණ වැඩක්. ඇත්ත වශයෙන්ම එය ගරු ජනාධිපතිතුමාගේ සාධාරණ තීරණයට පටහැනියි. ඒ අයට පත්වීම් දෙන්න නම අමාත්‍යාංශවල ඇබෑර්තු නැත්නම් ඒ අයට වෙනත් කොහේ හෝ පත්වීම් දෙන්න ඕනෑ.

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා** (අවිස්සාවේල්ල)
*(திரு. எம். டீ. பிரேமரத்ன—அவிசாவெல)*
(Mr. M. D. Premaratne—Avissawella)

පත්වීම් දී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

Mr. Speaker, I am being disturbed by the hon. Member for Avissawella (Mr. M. D. Premaratne) unnecessarily. He does not know the facts. I do not mind his disturbing me if he knows the facts.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Hon. Member for Avissawella, you should not disturb him when he is on his feet.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

That is very correct, Sir, (*Interruption*).

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා**
*(திரு. எம். டீ. பிரேமரத்ன)*
(Mr. M. D. Premaratne)

හැම අමාත්‍යාංශයකම ඒ තීරණය ක්‍රියාත්මක කර තිබෙනවා, වැඩ වර්ජකයන් නැවත සේවයට අරගෙන තිබෙනවා කියායි. මා කීවේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Allow him to wind up.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මේ ප්‍රශ්නය මේ විධියට නොවිසඳා තබන්න බැහැ. ඒ අයටත් ගරු ජනාධිපතිතුමාගේ සාධාරණ තීරණයේ ප්‍රතිඵල ලැබෙන්න ඕනෑ. ඒකට බාධාවක් තිබෙනවා නම් ඒ බාධාව නැති කර හෝ රැකියා අහිමි වූ අයට නැවත රැකියා ලබා දීමට, ඒ අය යළි සේවයේ පිහිටුවීමට ක්‍රියා කිරීමේ වගකීම රැඳී තිබෙන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයටයි. ඒ උදවිය නැවත රැකියාවේ පිහිටුවන තුරු අපට මේ කාරණය ඉදිරිපත් කරන්න සිද්ධ වෙනව. ඒ වගේම ඒ අය යළි සේවයෙහි පිහිටුවීමට රජය ගත් සාධාරණ තීරණය පවා මකා දමන්න යනව. ඒ තීරණයේ වටිනාකම, වැදගත්කම මේ ක්‍රියාමාර්ග නිසා සම්පූර්ණයෙන්ම බැහැර යනව.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

Order, please !

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

Sir, I do not know who the other Speaker is !

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I can hear the voices of certain Deputy Ministers. I do not want them to assume my place here.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මේ කරුණු ටික ගැන සලකා බලා ගරු වැඩබලන ඇමතිතුමාවත් මේ ප්‍රශ්න ටික විසඳීමට කටයුතු කරනවා ඇති කියා මා බලාපොරොත්තු වෙනව.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க—உயர் கல்விப் பிரதி அமைச்சர்)*
(Mr. A. M. R. B. Attanayake—Deputy Minister of Higher Education)

ගරු කථානායකතුමනි, වෙලාව ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනව. මම තමුන්නාන්සේට කියන්න හදන්නෙ එක කාරණයක්. මේ සභා ගර්භයේ දැන් අවුරුදු දෙකක් තිස්සේ සැලකිය යුතු මට්ටමකින් කලවාන පැත්තෙන් සද්දයක් ඇහෙනව. 'වැඩ වර්ජකයො ! වැඩ වර්ජකයො !! වැඩ වර්ජකයො !!!' කියල. ඒකම අනුමත කරනව, කොත් මල්ලේ පැත්තත්. මට මෙතැන සැකයක් ඇතිවෙලා තියෙනව—

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

මට වචනයක් කියන්න පුළුවන්ද? [බාධා කිරීම්]

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

කථානායකතුමනි, මමයි කථා කරන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! If he is not giving way I cannot help you. Yes, you can carry on.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

That is right.

මේ සත්‍යය මොකක්ද කියන එක තමුන්නාන්සේට පැහැදිලි කරල දෙන්න මට යුතුකමක් තියෙනව. මාසයක් නම් කමක් නැහැ ; දෙකක් නම් කමක් නැහැ ; අවුරුද්දක් නම් කමක් නැහැ. අවුරුදු 2 ක් තිස්සෙ 'වැඩ වර්ජන ! වැඩ වර්ජන !!' කියන සද්දයක් ඇහෙනව. වර්ජනය කියන්නෙ 'නතර කරනව' කියන එකයි. ශ්‍රී ලංකා ආණ්ඩුවේ, මේ ආණ්ඩුවේ අවුරුදු 5 ක රාජකාරි සේවය කිසි දවසක කිසි මොහොතක, කිසි පැයක වර්ජනය වෙලා නැහැ. හරියටම 1977 ජූලි මාසෙ 23 වෙනිදා සිට අද දක්වාම අපි මේ කථා කරන මොහොත දක්වාම, ක්‍රමානුකූලව අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් තමන්ගේ වගකීම් හරිහැටි ඉටු කරමින් රට පාලනය කර තිබෙනව. කිසි දවසක වර්ජනයක් ඇතිවෙලා නැහැ. කරන ලද වැඩ ප්‍රමාණය වැඩි වී තිබෙනව. සංවර්ධනය වර්ධනය වෙලා තිබෙනව. වර්ජනයක් නම් කවදාවත් වෙලා නැහැ. කළාය කියන වර්ජනයක් අපට පෙනෙන මානයකවත් නැහැ.

ගරු කථානායකතුමනි, 'ආයතන සංග්‍රහයේ' පැහැදිලිව සඳහන් වෙනව රජයේ සේවකයකුගේ රාජකාරිය, තනතුර අහෝසි වන ආකාරය. ඒ කරුණු මෙහෙමයි : යමෙකුට පිස්සු හැදුණොත් [බාධා කිරීමක්] යමෙකුගේ නියමිත වයස සීමාව පැන්නොත්, විධායක මට්ටමක සිටින නිලධාරියකු නම් වස්තු භංගත්වයකට මුහුණ පෑවොත්, යම් පුද්ගලයෙක් නොදන්වා රාජකාරියට නොපැමිණියහොත්, ඒ වගේම යමෙක් සේවා යෝජකයා ප්‍රිය මනාප වන පරිදි සන්තෝෂ වන පරිදි සේවා යෝජකයා සෑහීමට පත්වන පරිදි සේවය නොකළහොත්, ඒ අයගේ රාජකාරි අහෝසි වෙනවා. මේ අටවැනි ආණ්ඩුව දක්වාම ශ්‍රී ලංකා ඉතිහාසයේ කොයි ආණ්ඩු කාලයේ දීත්—ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු අටක් තිබුණා, මේ යන්නෙ අටවැනි ආණ්ඩුව—එහෙම සේවයට නොපැමිණි සේවා යෝජකයාගෙන් දඬුවම් ලැබූ පුද්ගලයින් අනන්තවත් ඉන්නවා. නමුත් කලවානේ ගරු මන්ත්‍රීතුමා මේ තරම් බොළඳ මට්ටමට කල්පනා කිරීම ගැන දැනුමක් නැති පුද්ගලයකු බවට පත්වීම ගැන මම කණගාටු වෙනවා. මට ඒ වචන පාවිච්චි කරන්නට සිද්ධ වෙනවා. එතුමාත් කෙරෙව්වා ආණ්ඩුවක් 1970 සිට 1977 දක්වා. ඒ කාලයේ බැංකු සේවකයන් වර්ජනයක කළා. මුදල් ඇමතිවරයා පිළිගත්තා වර්ජනයක් ඇති වුණාය කියල. වර්ජනය ගැන පෙළපාළි ගැන පැහැදිලිවම සඳහන් කළා. එක නැවිටෙක්වත් ගත්තද හදිසියකටවත් ; ආපසු ? එක නැවිටෙක්වත් ගත්තද ආපසු රක්ෂාවට ? ඒ අවස්ථාවෙ ඒ වැඩ වර්ජකයො ගැන අවුරුදු හතක් නිශ්ශබ්දව හිටපු මේ ඇත්තො අවුරුදු දෙකකට පෙර නොතිබුණු වර්ජනයක් ගැන, නොවූ සේවය අත්හිටුවීමක් ගැන අද කථා කරනවා.

සේවයට නොපැමිණි යම් සේවකයෙක් සේවා යෝජකයාගේ අප්‍රසාදය ලබා ගත්තා නම් ඔහුගේ රක්ෂාව අහිමිවීමත් සමගම ඔහුට නැවත රක්ෂාවක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිවරු—කැබිනට් මණ්ඩලය—සේවා යෝජකයන් හැටියට කල්පනා කරනවා ඇති. එසේ කල්පනා කර ඉඩ පහසු තිබෙන හැටියට ඒ තනතුරු දී තිබෙනවා. මෙතුමන්ලා කියන හැටියට අපට කරන්නට පුළුවන් කමක් නැහැ. වැඩ වර්ජනයක් ගැන කථා කරන මේ ඇත්තො ඒ පුද්ගලයන්ට වැඩට එන්න දුන්නෙ නැහැ. ඒකයි වුණු සිද්ධිය. "උඹල යන්න එපා, මුදියන්සෙ, උඹල හිටපල්ල ගෙදර ආණ්ඩුව පෙරළන්න" කිව්ව. "අපි ආණ්ඩුව ගත් හැටියෙ උඹ දිසාපති කරන් නම්" කිව්ව. ඒ අහිංසක මිනිස්සුන්ගෙ අඹු දරුවො බඩගින්නෙ නැවුණා. නමුත් ගරු ජනාධිපතිතුමාටත් ගරු අග්‍රාමාත්‍යතුමාටත් බුදු බව අත් වෙන්න අද ඒ මිනිස්සුන්ට ආපසු පඩින් ඒක්ක රක්ෂාව දී තිබෙනවා. මේ උදවියගෙ කීම අහල අමාරුවෙ වැටුණු මිනිස්සුන්ට යළිත් රක්ෂාව දී තිබෙනවා.

මේ උදවිය අවංක නිර්භීත නිහතමානී ඉදිරිගාමී දේශපාලනඥයො නම් කියන්න තිබුණෙ මොකක්ද? 1983 අගෝස්තු 4 වැනිදාට පසු ආණ්ඩුව විසුරුවා හරිනවාමයි. මහා මැතිවරණයක් පවත්වනවාමයි. අවංක නම් නිර්භීත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා]

නම් " මුදියන්සෙ, 1983 දී අපි ආණ්ඩුවක් පිහිටුවන්න බලාපොරොත්තු වෙනවා. අපි මේ ආණ්ඩුව පෙරළමු. ගන්න එපා මුන්ගෙ රක්ෂාව " කියල නේද තමන්ගෙ නැරවිකාරයන්ට පන්දම්කාරයන්ට කියන්න තිබුණෙ? එහෙම නේද කියන්නට ඕනෑ? ඇයි මේ අපට කෙදිරි ගාන්නෙ? (බාධා කිරීමක්) මම කථා කරන්නෙ නැහැ කිරිඇල්ලෙ අප්පොට. මම කථා කරන්නෙ සාමාන්‍ය මිනිහාට. මේ අය අවුරුදු 40 ක් තිස්සේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් පන්ති විඥනයක් ගොඩනැගුවා. මේ පන්ති විඥනයේ ප්‍රතිඵලයක් වශයෙන් අවුරුදු විස්සක් තිහක් රක්ෂාව කළ සමහර මිනිස්සු අද ගෙදර. අද ඔවුන්ගෙ අඹු දරුවො බඩගින්නෙ. මේ පන්ති විඥනයෙ ප්‍රතිඵල. ඒකයි, වෙලා තියෙන්නෙ. කවදාවත් නැගිටල මේවට උත්තර දෙන්නෙ නැහැ. පන්ති විඥනයට හෙණ ගහල තියෙනව ; කණ කොකා අඬල තියෙනව. මෙයා මෙතැනට ඇවිත් ඉන්නෙ මොකෙන්ද? පන්ති විඥන ධර්මයෙන්ද? කොමියුනිස්ට් පක්ෂයෙන්ද? නැහැ. කිරිඇල්ලෙ අප්පො වශයෙන්. මගේ යුතුකමක් තිබෙනවා, මේක පැහැදිලි කරන්නව. අවුරුදු දෙකක් තිස්සෙ වැඩ වර්ජනයක් ගැන කථා කළාට මේ රටේ වැඩ වර්ජනයක් තිබුණාද? මේ අවුරුදු පහ තුළ කිසිම දවසක මේ රටේ වැඩ වර්ජනයක් ගැන මේ උත්තරීතර සභාව රුස්වී සාකච්ඡාවක් කර තිබෙනවාද? මේ කාලය තුළ කවදාවත් එක අමාත්‍යාංශයක, එක දෙපාර්තමේන්තුවක, එක සංස්ථාවක, එක මණ්ඩලයක එක අධිකාරියක වැඩ වර්ජනයක් ගැන පැයකවත් සාකච්ඡාවක් කර තිබෙනවාද? නැහැ. එහෙම දෙයක් වෙලා නැහැ. එහෙම නම් මොන වද මේ කථා කරන්නෙ? තවමත් පන්ති විඥනයට පන්දම් අල්ලනව. පන්ති විඥනයට කෙළ වී හමාර බව අධිනීතිඥයකු වෙලත් තවමත් තේරුම් ගොස් නැහැ. ඒකයි, මට කණගාටු. මොකක්ද මේ ආරාධනය? මොන වද මේ කථා කරන්නෙ? නොදන්නා දෙයක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

Order, please. The sitting is suspended till 5 p.m.

**රුස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 5 ට නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி, அமர்வு பி. ப. 5 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 5 p.m. and then resumed,* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
**(Mr. A. M. R. B. Attanayake)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ පානය සඳහා රුස්වීම කල් තබන්නට කලින් මම කතා කරමින් සිටියේ මොකක්ද කියා තමුන්නාන්සේ දන්නවා ඇති. කලවානේ ගරු මන්ත්‍රීතුමාට (සරත් මුත්තෙට්ටුවේගම මහතා) අවුරුදු දෙකක් තිස්සේ ප්‍රශ්නයක් වී තිබෙන දේකට සාධාරණ පිළිතුරක්, නැවත වරක් ඒ ප්‍රශ්නය පැන නොනගින අන්දමේ උත්තරයක් ලබා දීම අපේ යුතුකමක්. අවුරුදු දෙකක් තිස්සේ මිනිසෙක් වේදනාවක් විඳීම ඉතාම බරපතල කාරණයක්. කාන්තාවක් බබෙක් හම්බ වෙන්නත් දුක් විඳින්නේ මාස නමයයි. කලවානේ ගරු මන්ත්‍රීතුමා අවුරුදු දෙකක් තිස්සේ එකම වේදනාවෙන් දුක් විඳිනවා. එකම වේදනාවක් දරමින් සිටිනවා. ඒක මහා ඛේදවාචකයක්. එපමණක් නොවෙයි. අවුරුදු 40 ක් තිස්සේ විළි නැති රුදාවකින් දුක් විඳින ජනතාවක් මේ රටේ සිටිනවා නම් ඒ මේ කලවානෙ ගරු මන්ත්‍රීතුමා ඇතුළු කල්ලියයි. එතුමාට නවත් වේදනාවක් අවුරුදු දෙකක් තිස්සේ තනියම විඳින්නට සිදු වී තිබෙනවා. මම ඒක පැහැදිලි කරන්නයි, මේ හදන්නේ.

ලංකාවේ මේක ඉතා වැදගත් ප්‍රශ්නයක්. මේ ඇත්තත් අවුරුදු 40 ක් තිස්සේ විඳින මේ වේදනාව හරිහැටි විග්‍රහ කොට, ඒකට නියම හැටියට බෙහෙතක් දෙන්නට යම් කෙනකුට පුළුවන් නම් ඒක ලොකු දෙයක් කලවානේ ගරු මන්ත්‍රීතුමා ඇතුළු කල්ලිය මේ වේදනාවෙන් මුදා ගන්න පුළුවන් නම් ලොකු දෙයක්. කලවානේ ගරු මන්ත්‍රීතුමා හැම තිස්සේම මේ 'වැඩ වර්ජනය. වැඩ වර්ජනය' යන වචන අවුරුදු දෙකක් තිස්සේම මතුරන්නේ මොකද කියා තමුන්නාන්සේ දන්නේ නැහැ. නොවුණු දෙයක්, නොවන දෙයක්, නොසිදුවුණු දෙයක් ගැන එතුමා කතා කරනවා. මොකද හේතුව? මේකයි, හේතුව: කාල් මාක්ස්ගේ 'දාස් කැපිටාල්' නමැති පොත කටපාඩම් කරන, වනපොත් කරන මේ වනපොත් කාරයෝ තමන්ගේ දර්ශනය දියත් කිරීම සඳහා මතුරන්න ඕනෑ ඒකම තමයි. එතැනයි, තුවාලය. කාල් මාක්ස් ඔහුගේ 'දාස් කැපිටාල්' පොතේ ' 'ද්විඝටන වාදය' යනුවෙන් සිද්ධියක් පෙන්නුම් කර තිබෙනවා. ඒකම. 'ඓතිහාසික නියති වාදය' වශයෙනුත් 'දයලෙක්තික වාදය' වශයෙනුත් හඳුන්වනවා. මේ තුනම එකිනෙකට පර්යාය වන කරුණු තුනක්. එක සමාන අර්ථ ඇති, එක සමාන තේරුම් ඇති වචන තුනක්. 'ද්විඝටන වාදය', 'දයලෙක්තික වාදය'—

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

උමතු වාදය.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
**(Mr. A. M. R. B. Attanayake)**

උමතු වාදය හැදී ඉන්න පිරිසක් ඒකෙන් බේරා ගන්නයි අපි හදන්නේ. අවුරුදු හතළිහක පිස්සෙක්, උමතු වාද කරයෙක් මේකේ ඉන්නේ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

අංගොඩ කොච්චර කල් හිටියද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

ඒක තමයි ප්‍රශ්නය. එහාටවත් ඇතුළු වෙන්න බැරි වෙලා තියෙනවා. එහාට නොයන්න, අපි මෙහේදීම බොහෙන් දීලා යවන්නයි හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය තමුන්නාන්සේට පැහැදිලි කරදීම මගේ යුතුකමක්. 'දාස් කැපිටාල්' නමැති ග්‍රන්ථයේ නිර්ධන පන්තියක් ගැන කරුණු පෙන්නුම් කර තිබෙනවා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

Sir, we have been witnessing a classic example of the violation of Standing Orders. Is this irrelevant rubbish to continue ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

එහෙම දෙයක් මෙතැන නැහැ. කිසිම 'රබිෂ්' එකක් නැහැ. තමුන්නාන්සේ ඔතැන ඉඳගෙන බලාගෙන ඉන්නවානේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

මේ යෝජනාව ගැන කතා කරන්න.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

මම යෝජනාව ගැනයි කතා කරන්නේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සඳහා මුදල් වගයක් පාස් කරන්න යනවා. එහිදී කලවානේ ගරු මන්ත්‍රීතුමා, වැඩ නතර කළ මිනිසුන්ට රක්ෂා නැහැ, වහාම ඒවා ලබා දෙන්න කියනවා. ඒක වැදගත් ප්‍රශ්නයක් එතුමා මේක එක් දවසක් නෙමෙයි, හැම දාමත් කියනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයක් ගෙනාවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයක් ගෙනාවත් මේක කියනවා. දෙවියනේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයක් ගෙනාවත් මේක කථා කරනවානේ, එක් කෙනෙක්වත් ස්ට්‍රයික් කරලා නොතිබියදීත්. එහෙම මිනිස්සු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නැහැ. ඒත් මේක මතු කරනවා.

මම මේ කියාගෙන ආවේ වැදගත් සිද්ධියක්. දාස් කැපිටාල් ග්‍රන්ථයේ කාල් මාක්ස් උන්නැහේ පෙන්වා දෙනවා, මුලු ධන වාදයත් නිර්ධන පන්තියත් දෙක අතර ඝට්ටනයක් ඇති කරන එක තමයි විප්ලවය කියන්නේ, එහෙම විප්ලවයක් ඇති කර තමයි සමාජවාදයක් ගොඩ නගන්නට පුළුවන් වන්නේ කියා. අන්න එතන පෙන්වන න්‍යාය තමයි, මේ කෑ ගහන්නේ. කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කෑගහනවා, නොවෙයි, දාස් කැපිටාල් ග්‍රන්ථයේ තිබෙන දයලෙක්තිකවාද න්‍යායය මෙහි කෑ ගහනවා, වැඩ වර්ජකයක් වශයෙන්. ඒකයි, මා පෙන්වන්නට යන්නේ. මොකක්ද මේ න්‍යායය? තමුන්නාන්සේ දන්නේ නැහැ. මම එය පැහැදිලි කර දෙන්නට ඕනෑ. මොකක්ද ද්විඝටන වාදය කියන්නේ? පීඩිත පන්තියේ ජනතාවත් එහෙම නැත්නම් නැති ඇත්තොත් ඇති ඇත්තොත් අතර ගට්ටනයක් ඇති කරන්නට ඕනෑ. ලේ හෙලා ගන්නා මරා ගන්නා ගට්ටනයක් ඇති කර පීඩිත පන්තිය ජයග්‍රහනය කරන්න ඕනෑ. ඊළඟට 1904 ලෙනින් උන්නැහේ කී හැටියට "What is to be done ?" කී න්‍යායේ හැටියට මධ්‍යම පන්තිය මේ පෙරකදෝරු උන්නැහේලා— [බාධා කිරීමක්] "What is to be done ?" මොකක්ද අපි කරන්න ඕනෑ කරන්නේ ?" ඒක පෙන්වා දුන්නා, 1904 ලෙනින් උන්නාන්සේ එංගලන්තයේදී පත්‍රයකට ලිපියක් ලියලා. එහි පෙන්වා දෙනවා පීඩිත පන්තිය ජයගෙන බලය අවශ්‍ය නම්—

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ලෙනින් හිටියේ එංගලන්තයේද ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

මේ පිළිබඳ විස්තරේ ඔක්කොම මගෙන් අහගන්න ඕනද? අවශ්‍ය නම් මුල සිට අග දක්වා කියන්නම්. මම මේ කියන්න යන්නේ අවශ්‍ය ටික පමණයි.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ඒ ටික කිව්වම ඇති.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතන පෙන්වා දෙනවා පීඩිත පන්තිය අල්ලා ගෙන විප්ලවය කර බලය ගන්නය කියලා මධ්‍යම පන්තියට, මෙන්න මධ්‍යම පන්තියේ කුරුල්ලෙක්, ඒ බලය ඉල්ලන. බලය ඉල්ලන ඇත්තො, මේ අප්පොලා. කවදාවත් කම්කරුවන් බලයට එන්නට නොවෙයි, කථා කරන්නේ.

මම මේ තමුන්නාන්සේට පෙන්වා දෙන්නට යන්නේ මේ 'දයලෙක්තික වාදය' 'ද්වි ඝටන' හා ඓතිහාසික නියති වාදය' කියන පර්යාය කරුණු තුන සම්බන්ධ කරන අදහස මේ කෑගහන්නේ, මෙයට ස්ට්‍රයික් එක සම්බන්ධ කරන්නේ කොහොමද කියන එකයි. මොකක්ද කරන්නට හදන්නේ ? කාල් මාක්ස් 'දාස් කැපිටාල්' ග්‍රන්ථයේ පෙන්වනවා, මේ ඝටන ඇති වන හැටි. ඒ ඝටන ඇති වුණාට පසුව ඇති ඇත්තෝ "වාදය" ; නැති ඇත්තෝ "ප්‍රතිවාදය" වාදය ප්‍රතිවාදය දෙක ඝැප්පුනාම එය තමයි, ද්විඝටනය කියන්නේ. එහි ප්‍රතිඵලය සහ වාදයයි. සහවාදය තමයි, සමාජවාදය. සමාජවාදය යනු කවදාවත් වෙනස් නොවන දෙයක්ලු. හරියට බුදුරජාණන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා]

වහන්සේ දේශනා කළ නිවන හා සමානයි කියලයි කියන්නේ. මෙය හරියට විග්‍රහ කරනවා නම් මැණික් ගලක් වගෙයි. මැණික් ගලක් කියන්නේ පාෂාණයන් අතර නොවෙනස් වන තත්ත්වයට පත් වූ ගලක්. ඒ වගේ සමාජවාදයත් නොවෙනස් වන සමාජ ධර්මයක් බවයි, මේ කට්ටිය දේශනා කරන්නේ. කාල් මාක්ස් දේශනා කළා ; මේ අය පාඩම් කරගෙන ඉන්නවා.

මම තමුන්නාන්සේට පෙන්වා දෙනවා, 'දයලෙක්තික වාදය', 'ඓතිහාසික නියති වාදය' සහ 'ද්විඝටන වාදය' කියන මේ කරුණු ක්‍රියාත්මක වෙලා සමාජ වාදය පිහිටවූ සමාජවාදී රටවලට අද වෙලා තිබෙන්නේ මොකක්ද කියා. අද පෝලන්තයේ නොවෙනස් වන තත්ත්වයක්ද තිබෙන්නේ ? සාමාන්‍ය ජනතාව ඡන්ද යක් ඉල්ලනවා. කොමියුනිස්ට්කාරයෝ දෙන්නේ නැහැ. වීදි ගානේ මිනිසුන්ට වෙඩි තබනවා, බල්ලන්ට කුක්කන්ට වාගේ. අද කියුබාවේ ආර්ථිකය හැරි නැගැ. කඩා වැටිලා. අද ඔවුන් මීගමුවට එනවා—අපේ නියෝජ්‍ය කම්කරු ඇමතිතුමාගේ ආසනයට එනවා —නිදහස් වෙළඳ කලාපය ගැන හදාරන්නට, කියුබාවෙන් පටන් ගන්නට. නොවෙනස් වෙලාද තිබෙන්නේ ? අද රුසියාවේ මොස්කව් පිලයි පීකිං පිලයි දෙක මොකද ? නොවෙනස් වෙලාද ? අද කොම්පැනි පිහිටුවනවා රුසියාවේත්. ආර්ථිකය වෙනස් වෙලා. රාජ්‍ය මූලධන වාදය මහජන මූලධන වාදයක් බවට අද රුසියාවේ පරිවර්තනය වේගන යනවා.

එද, මාඕසේතුං ඇදහුවා, දෙවියෙක් නැත්නම් ශාස්තෘ වරයෙක් වශයෙන්. බවලතා කිව්වා, 'මෙය හරි නැහැ, මේ කොමියුනිස්ට් ධර්මය වැරදියි' කියා. ඒවිට රෙඩිකල් වාදය, අනිධාවන වාදය කියා අන්න එයා රිමාන්ඩ් කර තිබෙනවා. මොකද මේ ? මොකක්ද තමුන්නාන්සේලාගේ දර්ශනයට වෙලා තිබෙන්නේ ? මොකක්ද කාල් මාක්ස් උන්නැහේට වෙලා තිබෙන්නේ ? මොකක්ද ගෝල යන්ට වෙලා තිබෙන්නේ ? මොකක්ද පොතට වෙලා තිබෙන්නේ ? සාර්ථක වී තිබෙනවාද ? අද අසාර්ථක වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අංශු මාත්‍රයක් පමණයි විග්‍රහ කරන්නෙ. විග්‍රහ කරනවා නම් දවස් ගණනක් මේ මිනිසුන්ගේ වැරදි අපට විග්‍රහ කරන්න පුළුවන්. මම එකක් කියන්නම්. කාල් මාක්ස් උන්නැහේ 'දස් කැපිටාල්' පොතෙන් පෙන්වනවා, ලෝකය කවදා හරි සමාජවාදී වෙනවාය, සියලුම රාජ්‍ය යන් සමාජවාදී වෙනවාය, විප්ලවයකින් විනාශ වී යනවාය, සියලුම ජනතාව එක සමාන වෙනවාය කියා. මම තමුන්නාන්සේට පෙන්වා දෙන්නම් 'දයලෙක්තික වාදය' යටතේ මොකද වෙන්නේ කියා. ලෝකයේ කවදා හරි සිදුවෙන්නෙ එහි අනික් පැත්තයි. උඩදුම්බර මන්ත්‍රීවරයා මැරුණත් මතක තබා ගන්න, තව අවුරුදු 50ක් යන්න පුළුමයෙන් ලෝකයේ ඇතිවන දේශපාලන තත්ත්වය ගැන මම තමුන්නාන්සේට විග්‍රහ කර පෙන්වන්නම්.

කාල් මාක්ස්ගේ දර්ශනය මත ඉදගෙනයි, මම මේ විග්‍රහය කරන්නෙ. කාල් මාක්ස්ගේ 'දස් කැපිටාල්' ග්‍රන්ථය ඉදිරිපත් කරන දේශපාලන දර්ශනය මත ඉද ගෙනයි, මම මේ විග්‍රහය කරන්නෙ. එතුමා—කාල් මාක්ස් උන්නැහේ—පැහැදිලිවම පෙන්වා දෙනවා, ද්විඝටන වාදය කියන්නෙ භෞතික වාදයය, ද්‍රව්‍ය වාදයය ; හැම ද්‍රව්‍යයක්ම එකට හැප්පීමෙන් සම්පූර්ණයෙන්ම ඇති වෙන ප්‍රතිඵලය, වාදයේ ප්‍රතිවාදයේ ඝට්ටනය, සහවාදය, සමාජවාදයය ; අන්න ඒ තත්ත්වය උදාවෙනවාය කියා. එය නැවත කවදාවත් වෙනස් වෙන්නෙ නැහැ කියා. රුසියාව දිහා බලන විට, චීනය දිහා බලන විට, පෝලන්තය දිහා බලන විට, බල්ගේරියාව දිහා බලන විට, හන්ගේරියාව දිහා බලන විට, කියුබාව දිහා බලන විට මට පේනවා, මෙය සම්පූර්ණයෙන්ම අනික් පැත්තට ගිහින් තිබෙන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ කල්පනා කරන්න ඕනෑ—

**නියෝජ්‍ය කථානායකතුමා,**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

**Order, please !**

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ඔය රටවල් ඔක්කොම දිහා බලන ගමන්ම මේ යෝජනාව දිහාත් ටිකක් බලනවා නම් හොඳයි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

යෝජනාව නොවෙයි, රජයක් දිහා බලලයි කතා කරන්නෙ, යෝජනාව අංශ මාත්‍රයක්, අපි රජයක් වශයෙන් යෝජනා දහස් ගණනක් ගේනවා. ඉස්සෙල්ල තේරුම් ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ද්විඝටන වාදය යටතේ—ද්විඝටන වාදයක් කියන්නෙ භෞතික වාදයක්—ද්‍රව්‍යයන් දෙකක් එකට හැප්පීමෙන් ඇති වෙන ප්‍රතිඵලය සහවාදයයි. සහවාදය යනු සමාජවාදයය කියා මෙතුමාට මම පෙන්වා දෙන්නම්. මේ පාර්ලිමේන්තුව ඉදිරිපිට තිබෙනවා වැවක්. වැවක් තිබෙනවා, පාර්ලිමේන්තුව ඉදිරියේ. සූර්ය රශ්මිය හොඳට වැටෙනවා. මේ වැවේ වතුරට මොකද වෙන්නෙ ? දවසකට සියයට 6ත් 10ත් අතර ප්‍රමාණයක් වතුර වාෂ්ප වෙනවා. කොහොමද වාෂ්ප වෙන්නෙ ? ජලය, වාදයයි. සූර්ය තාපය ප්‍රතිවාදයයි. මේ දෙක හැප්පුනාම වාෂ්ප ඇති වෙනවා. එහෙම නම් කාල් මාක්ස් සඳහන් කරන හැටියට ජලය, වාදය. ප්‍රතිවාදය, සූර්ය රශ්මිය. වාෂ්ප, සහවාදය සහ සමාජ වාදය. කාල් මාක්ස් කියන විධියට කවදාවත් වෙනස් වෙන්න බැහැ. වාෂ්ප ඒ තත්ත්වයෙන්ම සදාකාලිකවම තිබෙන්න ඕනෑ. හොඳයි වාෂ්ප, ප්‍රතිවාදයයි, වාදය, ශීතල සුළඟයි, එකට හැප්පුනාම මොකද වෙන්නෙ ? ආපසු වතුර බවට පත් වෙනවා. එහෙම නම් මගේ නිගමනය මේකයි : තව අවුරුදු 50ක් යන්න පුළුමයෙන් ලෝකයේ සියලුම සමාජවාදි—චීනයා සමාජවාදී—රාජ්‍යයන්හි සෑම ජන කොටසක්ම කෑගහයි, ජන සම්මතවාදී රජයක් අපට ඕනෑ කියා. අපේ කැමැත්තෙන් නායකයන් පත් කර ගන්න ඕනෑ කියා.

හරියට වැවේ වතුර වාෂ්ප වී ගොස් ආපසු වැහි වතුර වශයෙන් වැවට එකතු වෙනවා වගේම රුසියාව, චීනය, බල්ගේරියාව, හන්ගේරියාව, පෝලන්තය, කියුබාව, වගේ රටවල් ආපසු ජන සම්මත වාදයට පත්වෙනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි නිතරම සිංහල බෞද්ධ උරුමය ආරක්ෂා කරනවා. ඒ නිසා මම විශේෂයෙන් මේ ප්‍රශ්නය මතු කෙළේ 1982 ජූනි 8 වෙනිදායි. ඒ අවස්ථාවේදී මම ඉතා පැහැදිලිව මේ කාරණය පෙන්නුවා. "ඇත්ත" පත්‍රයෙන්මයි, මම මේක ගත්තෙ. ඒ මොකද "ඇත්ත" පත්‍රයේ වාර්තා වී තිබෙන නිසා. කාටවත් විරුද්ධ වෙන්න බැහැ, "ඇත්ත" පත්‍රයේම තිබෙනවා මේ වාක්‍යය. වෙනත් පත්‍ර ආණ්ඩුවට පක්ෂ පත්‍ර කියාවි කියල මම "ඇත්ත" පත්‍රයෙන්මයි ගත්තෙ. ඒ පත්‍රයේ එතුමා කියූ බවට වාර්තා කර තිබෙනවා "මා ද්‍රෝහියෙක් වශයෙන් හංවඩු ගැසුවාලු" යනුවෙන් "ලු" යන්නයි තිබෙන්නෙ "අප්‍රසිද්ධ වේශයෙන් දේශපාලනයට පිවිස" යනාදි වශයෙන් තිබෙනවා. ඒ අනුව එතුමා ඉතා පැහැදිලිව කියා තිබෙන්නේ, සිවුරු දරාගත්තේ අප්‍රසිද්ධියෙන් කියලා නොවෙයි, දේශපාලනයට පිවිසිලා තිබෙන්නේ අප්‍රසිද්ධියෙන් කියලයි. ඒ නිසා මගේ හිත කැළඹුණා.

අද පත්‍රයේ තිබෙනවා--"අද" කියන පත්‍රයේ නොවෙයි—අද දිනය වනාහී 1982 ජූලි 7 වෙනිදා. අද "ජන දින" පත්‍රයේ තිබෙනවා "සිරිධම්ම හිමියෝ තතු පහදති බුදුන් වඩින්නවත් ඉඩක් නෑ" කියා. අද ආයෙත් මගේ සිත කම්පාවට පත් වුණා. ඒ මොකද මේක භයානක දෙයක්. හරි භයානක තත්ත්වයක් මේ ධර්මද්වීපයේ බුදුන් වඩින්නවත් ඉඩක් නැත්නම්, ඒ පිළිබඳව මේ උත්තරීතර සභාවේ අවධානය වහාම යොමු විය යුතුව තිබෙනවා.

"ගැටඹේ රාජෝපවනාරාම විහාරය පවරාගෙන නැතැයි ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා කළ ප්‍රකාශය අසත්‍යයක් බවත් ඇසළ පුන් පොහෝ දිනයේ ගැටඹේ විහාරයේ ආගමික වතාවත් කිරීමටද රජය ඉඩ නොදීමෙන් ඒකාධිපති ස්වරූපය පැහැදිලි වී ඇතැයි ගැටඹේ රාජෝපවනාරාම විහාරාධිපති ආචාර්ය ලබුදූවේ සිරිධම්ම හිමියෝ ප්‍රකාශ කළහ"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික අතින් මේ වාගේ වැදගත් තවත් ප්‍රශ්නයක් තිබෙනවාද කියා මට හිතාගන්නවත් බැහැ. අපි ධර්මිෂ්ට සමාජයක් ඇති කරන්න දිවුරා පොරොන්දු වුණ පිරිසක්. එවන් පිරිසක් බලයේ සිටින කාලයක බුදුන් වඩින්නවත් ඉඩක් නැහැ කියන තත්ත්වයක් යම්කිසි විධියකින් තිබෙනවානම් ඒ ගැන අපි වහාම මේ සභාවෙන් විමසන්න ඕනෑ. මගේ සිත කම්පාවට පත් වී තිබෙනවා, මෙය ඇත්තද නැත්තද කියා.

මේ අතරේ තවත් වැදගත් කාරණයක් මම ඔබතුමාට පෙන්වන්න ඕනෑ. අද—1982 ජූලි 7 වැනිද--'ඇත්ත' පත්තරයේ කතු වැකියේ තිබෙනවා, මෙබඳු දෙයක් :

"ලබුදූවේ සිරිධම්ම හිමියන් හොරෙන් ශාසනයට ඇතුළු වූ කෙනෙකැයි මහා සංඝයාට කර ඇති නිගාවත්,"

මම ඉතාම හොඳින් පැහැදිලි කළා මේ වන විට, අප්‍රසිද්ධියේ දේශපාලනයට පිවිසි බවකැයි කියා තිබෙන්නේ. අනේ! මේ "හොරෙන් ශාසනයට ඇවිල්ල" කියා මේ විධියට වචන වැරදි විධියට අරගෙන කනපිට පෙරළා සිංහල බෞද්ධයන් අතරේ සමගිය නැති කරන්නට, යටි හිතේ නපුරු අදහස් ඇතිව දේශපාලනය වැනි තාවකාලික ලාභයක් උදෙසා අපේ මෙලොවට පමණක් නොව එළොවටත් බලපාන, ශාසනයක් පාලනයත් අතරේ ඇති සම්බන්ධය පළුදු කරන්නට තිබීන, අලජ්ජී විධියට උපක්‍රම යොදන එක ඉතාම භයානක දෙයක්. මෙය සිංහල බෞද්ධ උරුමය නැති කිරීමට ගත් කූට උපක්‍රමයක් වශයෙන් මට යළිත් පෙනී යන නිසයි, අද යළිත් මේ අදහස් මතු කරන්නේ මෙහි තිබෙනවා මේ විදියට :

"... හොරෙන් ශාසනයට ඇතුළු වූ කෙනෙකැයි මහා සංඝයාට කර ඇති නිගාවත් දේවානම්පියතිස්ස රජුගේ කාලයේ පටන් අද දක්වා වූ කාලය තුළ පළමු වතාවට පන්සලක් ඇවූ කම්බි ගැසීමෙන් ..."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට ඒක ඉතාම වැදගත්. පන්සලක කටු කම්බි ගැසූවාද? එය මට ඉතා වැදගත්.

**"... පන්සලක කටු කම්බි ගැසීමෙන් සම්බුද්ධ ශාසනයට කළ අපරාධයක් ජනාධිපතිගේ මැති ඇමතිවරුන්ම අනුමත නොකරන බව ඔවුන්ගේ නිහැඬියාවෙන් හා අගමැතිතුමාගේ කථාවෙන් දැන් ඔප්පු වී ඇත."**

මේ විධියට කියා තිබෙනවා. මේ ඇමතිවරුන් නිහඬව ඉන්නවාය කියන නිසා ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන් මේ කාරණය පිළිබඳව විශේෂයෙන්ම දැන ගන්නට කැමතියි. මා දන්නා විධියට එතුමා හුරුලු පරම්පරාවේ කෙනෙක්. හුරුලු පරම්පරාව කිව්වම මේ මහා බෝධිය ආරක්ෂා කරන බෝධිගුත්තික පරපුරේ ඇත්තෝ. ශාසනය ආරක්ෂා කරන එක ඒ අයගේ යුතුකමක්. එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සිටින නිසා මම හොඳාකාර පෞද්ගලිකව දන්නවා, වෙන කිසිම දවසකටත් වඩා භාෂාව සාහිත්‍ය වගේම ශාසනය වෙනුවෙන් ඇප කැප වී, තමන්ගේ සෞඛ්‍යය ගැනවත් නොතකා, එතුමා දිවා රෑ වෙහෙසී වැඩ කරන බව. එබඳු කෙනෙකුගෙන් මේ ප්‍රශ්නය පිළිබඳව ඇත්ත තත්ත්වය දැන ගන්නට ඕනෑ කියා මට සිතුණා. එම නිසා මම කෙලින්ම එතුමාගෙන් අහන්නේ. ඇත්තටම මේ විධියට බුදුන් වැඳගන්නටවත් තැනක් නැතිව, මේ ලබුදුවේ සිරිධම්ම හාමුදුරුවන්ට මේ ආණ්ඩුවෙන් මහා හානියක් කරලා තිබෙනවාද? එසේම කිසිම අනුග්‍රහයක් කරලා නැද්ද?

දෙවැනි කාරණය, පසුගිය වෙසක් පොහෝ දවසේත් මා සිල් සමාදන් වෙන්නට ගිය ඒ ස්ථානය මේසා හාස්කම් ඇති තැනක්. මම ඉතාමත් ආදරයෙන් විෂ්ණු දෙවියන්ට සලකනවා. මාස පහෙන් මගේ කොණ්ඩය කැපුවෙත් දිවුරුම්වෙල දේවාලයේදීයි. විෂ්ණු දෙවියන්ට උප්පල්වන් දෙවියන්ට—මගේ තිබෙන භක්තිය අනන්තයි. අප්‍රමාණයි. ඒ දෙවියන්ගේ නමින්මයි, වෙසක් පුන් පොහෝ දවසේ එතැන ගැටඹේ විහාරයට මා සිල් සමාදන් වෙන්නට ගියේ. ඒ උත්තරීතර ස්ථානයට මේ විධියට යම්කිසි හානියක් කරදරයක් වෙනවා නම් ඒක මගේ බලවත් චිත්ත කම්පනයට හේතු වන නිසා, සිත සසල කරවන නිසා ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන් මා විමසා සිටිනවා මේ විධියට හානියක් කරදරයක් අපරාධයක් වෙන තත්ත්වයක් ඇති කර තිබෙනවාද? කියා. මෙහි සැබෑ තත්ත්වය කුමක්ද කියා විශේෂයෙන් සිංහල බෞද්ධ ජනතාවට දැන ගැනීමට සලස්වන ලෙස මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මට දැන් පැහැදිලිව පෙනී යනවා 'ඇත්ත' පත්තරය වැනි පුවත්පත් අතිශය භයානක විධියට සත්‍යය විකෘති කරමින් අද දින එම පුවත් පතේ කතු වැකියේත් හොරෙන් ශාසනයට ඇතුළු වූ කෙනෙකැයි කියූ බවත් ප්‍රකාශ කර තිබෙනවා. එය අමූලික බොරුවක්. 'අප්‍රසිද්ධ වේශයෙන් දේශපාලනයට පිවිස' යන්නට 'හොරෙන් ශාසනයට ඇතුළු වුණාය' යන්නක් ආරෝපණය කරමින් බොරුවක් කරන නියාන් මේ පිළිබඳව ඇත්ත තත්ත්වය ප්‍රකාශ කරන මෙන් ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මේ කරුණු ස්වල්පය ඉදිරිපත් කරන්නට අවස්ථාව දීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

අ. භා. 6

**සරත් මුත්තෙට්ටුවේගම මහතා (කලවාන)**
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
**(Mr. Sarath Muttetuwegama—Kalawana)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්න කීපයක් අසන්නට මා කල් දී තිබෙනවා. එයින් එක් ප්‍රශ්නයක් අසන්නට තිබෙන්නේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙනුයි.

රජයේ සෞඛ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවාවේ නියුක්ත නිලධාරි මහත්වරු ඊයේත් පෙරේදාත් ඔවුන්ගේ ඉල්ලීම් කීපයක් දිනා ගැනීම සඳහා වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක යෙදී තිබෙනවා. මම හිතන විධියට ඒ වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයේ යෙදෙන්නට ඔවුන් බලාපොරොත්තු වන්නේ ඊයේත් පෙරේදාත් පමණයි. ඒ අයගේ ඉල්ලීම්වලින් එකක් වේතනය පිළිබඳව වුවත් අනික් එක දවස් පහේ සතියක් ඉල්ලන ඉල්ලීමක්. ඒ හැරුණු විට තවත් ඊට වඩා සුළු ඉල්ලීම් කීපයක් තිබෙනවා.

මට දැන ගන්නට ලැබී තිබෙන ආරංචි අනුව ජූනි මස 17 වැනිදාත් අතුරු වෛද්‍ය සේවාවේ වෘත්තීය සමිතියක් ගරු සෞඛ්‍ය ඇමතිතුමාට මේ කාරණය සම්බන්ධව දැනුම් දී තිබෙනවා. ඒ අතුරු වෛද්‍ය සේවාවේ නිලධාරි මහතුන් ඒ විධියට වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන විට සාමාන්‍ය ජනතාවට අසීරු තත්ත්වයකට මුහුණ පාන්න සිදු වන නිසා මෙයට මැදිහත් වී මේ ආරාවුල විසඳන්නට කටයුතු කරන මෙන් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අනෙක, අද හවස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පරිපූරක ඇස්තමේන්තුව සාකච්ඡා කෙරුණු අවස්ථාවේදීත් මා මතු කළ ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය කල් දෙන අවස්ථාවේදී මා බලාපොරොත්තු වුණේ නැහැ, එහි පරිපූරක ඇස්තමේන්තුව යටතේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න. අගමැතිතුමාගෙන් ඇසීම සඳහා මා කල් දී තිබෙන්නේ, සියලුම අමාත්‍යාංශවලට බලපාන ප්‍රශ්නයකුයි ඒ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ විවාදයේදීත් මා කී පරිදි 1980 ජූලි වැඩ වර්ජනයට දැන් අවුරුදු දෙකක් වෙනවා. ඒ අය වැඩ වර්ජනයන් නොවේය සේවයට නොපැමිණී නැත්නම් සේවය අත්හැර ගිය උදවියයයි කිව්වත්, ප්‍රශ්නය මෙයයි:

ඒ අය සම්බන්ධයෙන් ජනාධිපතිතුමා කළ ප්‍රකාශයක් ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණා. ඒ ප්‍රකාශය අනුව නම් සියලුම ඇමතිවරුන් හැකි තාක් ඉක්මනින් ඒ සේවකයන් ආපසු වැඩට කැඳවිය යුතුව තිබුණා. ඒ අයට නැවත සේවය ලබා දිය යුතු බවට ජනාධිපතිතුමා නියෝග කළාය කියා රජයේ පාලනය යටතේ තිබෙන ප්‍රවෘත්ති පත්‍රවල පවා පළ වුණා. ඒ අනුව සෑහෙන සංඛ්‍යාවක් ආපසු වැඩට ගෙන තිබෙනවා නමුත් තවත් සෑහෙන සංඛ්‍යාවක් තවමත් වැඩට ගෙන නැහැ.

මේ අය ආපසු වැඩට ගැනීම සම්බන්ධයෙන් රජය අනුගමනය කරන ක්‍රියා පිළිවෙළේ පරස්පර විරෝධතා දකින්න තිබෙනවා. මා ඒ සම්බන්ධයෙන් මතු කළ ප්‍රශ්නයට පරිපූරක ඇස්තමේන්තු පිළිබඳ විවාදයේදී වැඩබලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමා පිළිතුරු දුන්නේ නැහැ. ඒ පරස්පර විරෝධතා මේවායි: ඒ අයගෙන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවේගම මහතා]

සමහරුන්ට හිඟ වැටුප් සමඟ ආපසු සේවය ලබා දී තිබෙනවා. තවත් සමහරුන් හිඟ වැටුප් නැතිව වැඩට ගෙන තිබෙනවා. තවත් සමහරුන්ට කිසිම විධියකින් ආපසු වැඩ දී නැහැ. එම නිසා ආණ්ඩුව ස්ථිර ප්‍රකාශයක් කරන්න ඕනෑ, මේ අය සම්බන්ධයෙන්. එක්කෝ මේ ඉතිරි අයත් ආපසු වැඩට ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ අයට ආපසු රැකියාව දෙන්නේ නැතැයි කෙළින් ප්‍රකාශ කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් නිදර්ශන ඉදිරිපත් කරන්න මට පුළුවනි.

තවමත් ආපසු සේවයට කැඳවා නැති, වැඩ වර්ජනය කළ ගුරුවරුන් 300 ක් පමණ ඉන්නවා, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ. ගුරු වෘත්තීය සමිතියකින් ඒ ගැන විමසූ අවස්ථාවේදී කියා තිබෙනවා, ඔවුන් අතුරින් 48 දෙනකු පිළිබඳව, රහස් පොලීසියේ නැත්නම් 'සී. අයි. ඩී' එකේ වාර්තා ලැබෙන තුරු බලා ඉන්නවාය කියා. ඒ අයට නැවත රැකියාව දීම සඳහා පුරප්පාඩුත් තිබෙනවා. ඔවුන් ආපසු නැවත සේවයට ගන්න තීරණය කරලත් තිබෙනවා. නමුත් ඒ අය ආපසු වැඩට ගැනීම අනවශ්‍ය ලෙස පමා කරනවා. ප්‍රශ්නය තිබෙන්නේ 48 දෙනකු සම්බන්ධයෙන් පමණක් නම් අනෙක් අය වහාම වැඩට ගන්න පුළුවන් නේද? ඇයි, ඒ අයවත් වැඩට නොගන්නේ? මම තවත් නිදර්ශනයක් පෙන්වන්නම්:

ගමනාගමන මණ්ඩලයේ සියලුම ඩිපෝවල වැඩ වර්ජකයන් ආපසු සේවයට කැඳවා තිබෙනවා, ඩිපෝ තුනක හැරෙන්න. ඒ ඩිපෝ 3 නම් රත්නපුරය, ඇඹිලිපිටිය හා බලංගොඩයි. මම දවසක් ගමනාගමන මණ්ඩල සභාපතිතුමාගෙන් ඇසුවා, ඒ ඩිපෝ තුනේ වැඩ වර්ජකයන් ආපසු සේවයට නොකැඳවන්නේ ඇයි කියා. ඒ අවස්ථාවේදී සභාපතිතුමා මට කීවේ, ඒ නියෝගයේ තිබෙන මොකක්දෝ පටලැවිල්ලක් නිසා ඒ ඩිපෝ සම්බන්ධයෙන් එම නියෝගය ක්‍රියාත්මක වී නැත කියායි. ඒ විධියේ නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා.

මම කාටවත් පෞද්ගලිකව දොස් කියනවා නොවෙයි. ප්‍රශ්නය තිබෙන්නේ මේ ප්‍රශ්නය පිළිබඳ රජයේ ස්ථාවරය සම්බන්ධයෙනුයි. එම වැඩ වර්ජනයට දැන් අවුරුදු දෙකක් ගිහින් තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නයේ කෙළවරක් දකින්න නැහැ, තවමත්. [බාධා කිරීම්] මන්ත්‍රීතුමා තවම ඉන්නවාද? මම හිතුවා, ගිහින් ඇතිය කියා. යන ගමනුත් එතුමාට හුඟාක් වැඩ තිබෙනවාය නොවැ? අර ඉස්පිරිතාලයත් වහන්න කලින් ගියොත් හොඳයි. එදා මම එතුමාට කීවා මුල්ලේරියාවට යන්නය කියා. හැබැයි, බෙහෙත් අරගෙන ආපසු එන්න බලාගෙන ගියත් එන්න ලැබෙන්නේ නම් නැහැ. එන්න නොදී එතුමාන එහෙ තබා ගනීවි. [බාධා කිරීම්]

අනෙක් ප්‍රශ්නය කල් දී තිබෙන්නේ කම්කරු ඇමතිතුමාටයි. මා කලින් සඳහන් කළ වැඩ වර්ජන කාලයේ දී පෞද්ගලික අංශයේ නොයෙක් සමාගම්වල සේවයට නොපැමිණි සේවකයන්ගේ සේවය අත්හිටුවා තිබෙනවා. ඒ විධියේ කාර්මික ආරාවුලක් පෞද්ගලික අංශයේ සමාගම්වල උද්ගත වුණු අවස්ථාවල කම්කරු දෙපාර්තමේන්තුව ඊට මැදිහත් වී එය විසඳන්න උත්සාහ කිරීමේ සාමාන්‍ය සම්ප්‍රදායයක් තිබෙනවා. ඒ නිසා මම කම්කරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නෙ ඒ විධියට කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරල, ඒ තිබෙන කම්කරු ආරවුල් විසඳීමට ක්‍රියා කරන්න කියලයි. සමහර සමාගම් ගන්නව; සමහර සමාගම් ගන්නෙ නැහැ. නොගන්න සමාගම් පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ බලතල යොදාල ඒ ආරවුල් සමථයකට පත් කරන්නට මෙතෙක් දෙපාර්තමේන්තුව කිසිම උත්සාහයක් දරා නැහැ. කම්කරු දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් දක්වන උත්සාහය මෙහිදී දරා නැහැ. ඒ නිසා ඒක කරන්න කියා මම ඉල්ලා සිටිනව.

අ. භා. 6.7

**පී. බී. කවිරත්න මහතා** (රත්තොට)
(திரு. பீ. பி. கவிரத்ன—ரத்தோட்ட)
(Mr. P. B. Kaviratne—Rattota)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රත්නපුර මහජන මන්ත්‍රීතුමා (පී. ජී. පුංචිනිලමෙ මහතා) විසින් කල් දී තිබෙන ප්‍රශ්නය මම මේ අවස්ථාවෙදි ඉදිරිපත් කරන්ට අදහස් කරනව. 1982 ජූලි 4 වන ඉරිදා 'දිවයින ඉරිදා සංග්‍රහය' නමැති පුවත් පතේ මුල් පිටුවේ 'මැති ඇමැති 6 ක දූෂණ ගැන ජනාධිපතිට වාර්තාවක්' යන ශීර්ෂය යටතේ ප්‍රවෘත්තියක් පළ කර තිබෙනව. මේ වාර්තාවේ සත්‍යයක් ඇද්දැයි ගරු වැඩබලන ආහාර හා සමූපකාර කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමතියි. ඒ වාර්තාවේ සත්‍යයක් නොමැති නම් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නිවැරදි පුවත් පත් ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත් මම ඉල්ලා සිටිනව. මේ අදහස මන්ත්‍රීවරුන් වශයෙන් අපට ඉදිරිපත් කරන්නට සිදු වී තිබෙන්නෙ වරින් වර මේ ළඟ මෑත කාලයක ඉඳල සමහර ගරු මැති ඇමැතිවරුන් දූෂණවල යෙදෙන බවට වක්‍රෝක්තියෙන්, ඉඟියෙන් අඟවන්නට ඇතැම් පුවත්පත් ක්‍රියා කරගෙන යන නිසයි. මැති ඇමැති 6 ක දූෂණ ගැන ජනාධිපතිට වාර්තාවක්' යනුවෙන් දිවයින ඉරිදා සංග්‍රහයේ පළ වූ මේ වාර්තාවේ ඒ දූෂණවලට සම්බන්ධ වුණායයි කියන මැති ඇමතිවරුන්ගේ නම් සඳහන් කර නැතත් ඇතැම් ප්‍රදේශවල නම් එහි සඳහන් කර තිබෙන නිසා ඒ ප්‍රදේශවල සිටින නොයෙක් ගරු මැති ඇමතිවරුන්ට මේ චෝදනා එල්ල වෙනව.

ළඟ කාලයක ඉඳල සමහර පුවත් පත්—විශේෂයෙන් රජයට විරුද්ධ 'ඇත්ත' පත්‍රය වැනි පුවත්පත්—මැති ඇමතිවරුන්ගේ චරිත ඝාතනය කිරීමේ අදහස ඇතිව, රජයට මඩගැසීමේ අදහස ඇතිව නොයෙක් වාර්තා හා ශීර්ෂ පාඨ පළ කරන්නට පටන්ගෙන තිබෙනව. මැතිවරණය කිට්ටු වන නිසා මේක හිතා මතාම කරන ද්‍රෝහී ක්‍රියාවක් බව පැහැදිලියි. මේ මෑත කාලයට සිට 'ඇත්ත' පත්‍රය 'වෙළඳ විජ්ජා' කියන තීරුවක් ලියමින් වෙළඳ ඇමතිතුමාට මඩ ගහන්නට පටන් ගත්ත. පසුගියදා එතුමා පාර්ලිමේන්තුවේදී ඉතාමත් පැහැදිලිව ප්‍රකාශයක් කරමින් ඒ තමන්ට ගැසූ මඩ පහරවල් වැරදි ලෙස ගසන ලද ඒවා බව ඔප්පු කළායින් පසු ඒ පුවත්පත ඒ පිළිබඳව කිසිම ප්‍රකාශයක් කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොයෙක් පුවත් පත් මේ විධියට කටයුතු කරනවා නම් මැතිවරණය ආසන්න මේ කාලයේ විශාල අයහපතක් මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනතාව වෙනුවෙන් සේවය කරන මැති ඇමතිවරුන්ට, ජනතා නියෝජිතයන්ට සිද්ධ වන බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. මේ විධියේ ව්‍යාපාර දේශපාලන ඉතිහාසයේ හැමදාම සිද්ධ වුණා. අද ඊයෙ නොවෙයි, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ඇමතිතුමා ජාතික නිදහස් අධ්‍යාපන පනත ගෙනා වෙලාවෙත් සමහර පුවත් පත් ලැහැස්ති වුණා, එතුමා දේශපාලන භූමියෙන් විනාශ කර දමන්න. එපමණක් නොවෙයි, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමාට දේශපාලන වශයෙන් මරා දමන්න ලැහැස්ති වුණා, එතුමා ජාතියට හිතකර කටයුතු කීපයක් ආරම්භ කළ අවස්ථාවෙ. මේවා ඉතිහාසයේ පැහැදිලිව පෙනෙනවා. මට මතකයි, පිලිප් ගුණවර්ධන මැතිතුමාට විරුද්ධව, එතුමා මහජන එක්සත් පෙරමුණේ නායකයා වශයෙන් කටයුතු කළ වකවානුවේදී, මැතිවරණ කාලයේදී, ආගම පටලවා සමහර පුවත්පත් අභූත චෝදනා කළ බව. හපුතලේ ගරු මන්ත්‍රීතුමා දැන් ප්‍රශ්නයක් ඇහුවා. ඒ අදහසට මේ අදහස එකඟ වෙයි. මේ රටේ සමහර පුවත්පත් පිලිප් ගුණවර්ධන මැතිතුමා බෞද්ධ නිකාය කීපයක් සමග අසාධාරණ ලෙස හැප්පෙව්වා. එසේ හප්පවා ඔහුගේ දේශපාලන ජීවිතය මේ රටෙන් අතුගා දමන්නට කටයුතු කළා පුවත්පත්. අද මේ "දිවයින" පත්‍රයේ—

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

කවුද ඒකෙ අයිතිකාරය?

**පී. බී. කවිරත්න මහතා**
*(திரு. பி. பி. கவிரத்ன)*
(Mr. P. B. Kaviratne)

"දිවයින" පත්‍රයෙ අයිතිකාරයා මිල මුදල් තිබෙන ලොකු ධනවතෙක් වෙන්න පුළුවන්.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

යූ. එන්. පී. කාරයෙක් නේද?

**පී. බී. කවිරත්න මහතා**
*(திரு. பி. பி. கவிரத்ன)*
(Mr. P. B. Kaviratne)

ඔහු යූ. එන්. පී. කාරයෙක්ද ශ්‍රී ලංකාකාරයෙක්ද කියල මම දන්නෙ නැහැ. ඔහු වැඩියෙන් බර ඇති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

යූ. එන්. පී. එකේ මුදල් ඇමතිකම බාර ගන්න හදපු එක්කෙනා.

**පී. බී. කවිරත්න මහතා**
*(திரு. பி. பி. கவிரத்ன)*
(Mr. P. B. Kaviratne)

නොදැනුවත්ව එහෙම චෝදනාවක් කරන්න මම ලැස්ති නැහැ. කවුරු වුණත් කාගේ [illegible] වුණත්, කාගේ සල්ලි වුණත්, කාගේ බලතල වුණත් අපට මතක් කරන්නට සිද්ධ වෙනවා, මේ පුවත්පත හිතා මතාම එක්සත් ජාතික පක්ෂය තුළින් ස්වශක්තිය පදනම් කරගෙන මේ රටේ දේශපාලන වේදිකාවට පිවිසුණු තරුණ මැති ඇමතිවරුන් රාශියකගේ බෙල්ල අමු අමුවේ කපන්නට පියවර ගෙන තිබෙන බව.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

බෙල්ල කපනව නම් කමක් නැහැ. වෙන දෙයක් කපන්නෙ.

**පී. බී. කවිරත්න මහතා**
*(திரு. பி. பி. கவிரத்ன)*
(Mr. P. B. Kaviratne)

වෙන දෙයක් කපන්න ලේසියෙන් හම්බු වෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කල්පනා කරන්නෙ නැහැ මගේ අදහස හාස්‍යයට හෝ උපහාසයට හෝ ලක් කරන්නට. මේ පුවත්පත අපේ මැති ඇමතිවරුන් ගැන වගේම අනිත් උදවිය ගැනත් සාකච්ඡා කරනවා නම් බොහොම හොඳයි. යටගිය දේවල්, වර්තමාන දේවල් ඒ කොයි දේටත් එකාකාර ප්‍රසිද්ධියක් දෙනවා නම් වඩා සාධාරණය යනු මගේ පිළිගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා 1981 දෙසැම්බර් 9 වන දින මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා (එම්. හලීම් ඉෂාක් මහතා) මේ ගරු සභාවේදී කර තිබෙන කථාවකින් කොටසක් හැන්සාඩ් වාර්තාවෙන් කියවන්නට කැමතියි. 2170 වන තීරුවෙ: මෙසේ සඳහන් වෙනවා.

"ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් හැටියට මට කණගාටුයි, අපේ ආණ්ඩු කාලයේදී කෙරුණු ඇතැම් දේවල් පිළිබඳව කොළඹ දිසා ඇමතිතුමා කළ ප්‍රකාශය ගැන. විෂය භාර ඇමතිවරයා හැටියට ඉලංගරත්න මහතා කළ නියෝගයක් අනුව "මංගලා" කියන චිත්‍රපටිය නිපදවීම සඳහා රජයේ මුදල්වලින් රුපියල් එක් ලක්ෂ ගණනක් දීලා තිබෙනවා, ඒ මහතාගේ භාර්යාවත්—"

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

ඒ ගැන තමුන්නාන්සේලා මොකක්ද අද වන තෙක් කරල තියෙන්නෙ?

**පී. බී. කවිරත්න මහතා**
*(திரு. பி. பி. கவிரத்ன)*
(Mr. P. B. Kaviratne)

ඒක වැදගත් ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය අපිත් අහනවා. ඇමතිතුමාගෙනුත් අහනවා. වැඩ බලන ඇමතිතුමාගෙනුත් දැනුත් අහනවා.

......"ඒ මහතාගේ භාර්යාවත් හිටපු සමුපකාර හමිහියකට. ඒ මුදල් ආපසු රජයට අය කර ගන්න අද වන තුරු බැරි වී තිබෙනවා. මේ ඇත්තෝ තමයි රට වටේ ගිහින් සමාජවාදය ගැන කථා කරන්නේ. ඒ බව මම කණගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න කියා...

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. කවිරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දිවයින" පත්‍රයේ වාර්තාව සත්‍යයක් ද, මේ වාර්තාව පිළිබඳව නියම තත්ත්වය ගරු සභාවට එළිදරව් කරනවාද, එසේ නැත්නම් ඒ මන් ද යන ප්‍රශ්න අපි වැඩ බලන ආහාර හා සමුපකාර ඇමතිතුමාට යොමු කරනවා. ඒ සමගම, මැති ඇමතිවරුන් පිළිබඳව ආණ්ඩු පාර්ශ්වයේ හෝ වේවා විරුද්ධ පාර්ශ්වයේ හෝ වේවා මන්ත්‍රීවරුන්ට අසාධාරණ ලෙස මඩගැසීම්වලින් තොරව ඔවුනොවුන්ගේ දේශපාලන ජීවිත ගෙන යන්නට ආරක්ෂාව සැලසේවිය කියා අපි තමුන්නාන්සේගෙන් බලාපොරොත්තු වෙනවා. පුවත් පතේ නිදහස දඩමීමා කර ගන්නට නොදී පුවත්පත්වලට නිදහසේ ලියන්න අවස්ථාව දෙමින්ම ඔවුන්ගේ ආරක්ෂාව ඇති කරන්නය යන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ඒ. එම්. ආලාලසුන්දරම් මහතා**
*(திரு. ஏ. எம். ஆலாலசுந்தரம்)*
(Mr. A. M. Alaalasundaram)

Mr. Deputy Speaker, this question is addressed to the Hon. Minister of Lands and Land Development. My complaint is about the fine imposed on farmers at the rate of Rs. 1,500 per acre, for excess acreage cultivated by them during the Yala season at Kilinochchi. The Iranamadu Tank caters to the colonists as well as to the middle class allottees. I am sure the Hon. Minister knows well that the allottees who are middle class people get about 10, 15 or 20 acres of paddy land, whereas the colonists have only about 2, 3 or a maximum of about 4 acres of paddy land. Every year, during the Yala season, the distribution of water from the Iranamadu Tank is determined by the authorities concerned. The basis is decided in keeping with the volume of water that is available in the Iranamadu Tank. This year, quite unusually, after very many years, the Iranamadu Tank is full up with water and there is therefore no necessity at all for the authorities to determine the percentage of water that should be given to the colonists, for it to be reduced to 50 per cent ; that is water for only 50 per cent of the allotment to be given to them.

I understand that there are about 33 feet of water available even now at the Iranamadu Tank. But still for all, the poor colonists who live solely on their paddy lands, that is the 2 or 3 acres given to them, are made to cultivate only on half of that extent, either on one or one and a half acres and for anything more they have cultivated in excess of this basis they are fined Rs. 1,500 per acre. The Hon. Minister will agree with me that the middle class allottees who have 10, 15, 20 acres will be cultivating about 10 to 12 acres out of their full extent, whereas the colonists will cultivate only one or one and a half acres of the maximum extent of two acres, and if by reason of the fact that sufficient water is available and these colonists have cultivated half or even one acre more, they are asked to pay a fine of Rs. 1,500 per acre, which I think the Hon. Minister will agree, is too heavy a burden on these farmers.

Especially during last December, the Kilinochchi farmer had a very poor crop because of the unexpected floods and this time, it is also because of that that we have sufficient water in the Iranamadu Tank. Now we are in the month of July and by August we are going to have the seasonal rains and the water that is now available in the Iranamadu Tank will go up to spill level and thereby the water will run into the ocean. So, I do not know why the authorities have decided on this basis, that colonists should be allowed to cultivate 50 per cent of land during the Yala season. Therefore, I request the Hon. Minister to take immediate action to instruct the authorities concerned to at least waive the fine imposed on those poor colonists. Of course, the middle-class allottees who have 10, 15, 20 acres can afford to pay it because they cultivate about 10 to 15 acres unlike these poor colonists who depend on this tank alone. Furthermore, because of the fact that they cultivate during two seasons, they are deprived of their food stamps. So, the Hon. Minister will have to take immediate action to instruct the authorities concerned not to collect these fines from those poor colonists.

Secondly, there is a matter to be brought to the notice of the Hon. Minister of Health. I have received a complaint from the Arasanka Pothu Thathimar Uliyar Sangam, a trade union of the hospital employees, that a member of the District Development Council of Colombo, Mr. Noble Vedanayagam and three others had gone to the Mantivu Leprosy Hospital and abused and threatened the nursing staff there and ultimately assaulted a cook who was on duty at at that time. I am sure the Hon. Minister will agree with me that it is his duty to give protection and safeguard the employees who are in the departments under his Ministry. Anyway, it is a matter for the Hon. Minister to make further investigations, to find out what has happened. Of course, I do not know what has happened. In fact, I discussed this matter with the Hon. Minister at Adjournment time this evening, and he too had been informed of this incident by a telegram by this same trade union. Anyway, to prevent any further occurrences of this nature in future, I think the Hon. Minister will have to take suitable action to satisfy these employees that immediate action has been taken in the matter.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා** (ගම්පහ)
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාවනැල්ලේ, කෙරමිණියේ සමස්ථ ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය 1966 වර්ෂයේ පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයාධිපති පූජ්‍ය අලුත්නුවර අනෝමදස්සි හිමියන් විසින් ආරම්භ කරන ලදුව, උදාර සේවයක් ඉටු කරන, දෙමහල් මන්දිරයකින්, ඖෂධාලයකින්, රෝගීනට නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි වාට්ටු පේළි දෙකකින්, ශල්‍යාගාරයකින් හා ගිහි පැවිදි සිසුන් සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නේවාසිකාගාරයකින්ද යුත්, අනෙක් විද්‍යාලයවලට නොදෙවැනි තැනක් ගන්නා වෛද්‍ය විද්‍යාලයක් බව ඇමතිතුමා දන්නේද?

මේ ආයතනයට දැනට රජයෙන් රු. 15,000 ක ආධාර මුදලක් ලැබෙන නමුත් අද තත්ත්වය අනුව මේ මුදල දැනට සේවය කරන උපාධිධාරී ගුරු මණ්ඩලය ඇතුළු අනෙක් නිලධාරීනට පඩි ගෙවීමටවත් ප්‍රමාණවත් නොවන නිසා විදුහල්පතිතුමා ඉතාම අසීරු තත්ත්වයකට මුහුණ පා ඇති බව ඇමතිතුමා දන්නවාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! you have given notice of this question to the Hon. Minister of Finance and Planning, not to the Hon. Minister of Health.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Actually, Sir, the Hon. Minister of Health is here, so that he can submit this answer if necessary.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! This requires some sort of investigation before any reply could be given.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Mr. Deputy Speaker, the Hon. Prime Minister has also been to this hospital.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Maybe. But the question is whether he will be able to answer this question now.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

I do not want the answer now. I would like the Hon. Minister to discuss the matter with His Excellency because this is a very important matter.

1982 වර්ෂයේ මුල් භාගයේදී රජය පිළිගත් ආයතනයක් බවට රජයේ ලියාපදිංචිය ලබා ඇති මේ ආයතනයේ නඩත්තු කටයුතු කරගෙන යෑම සඳහා රු. 50,000 ක මුදලක් ලබා දීමට රජය කටයුතු යොදන්නේද? නො එසේ නම් ඒ මන්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! You can hand over that statement to him.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

I have handed over a copy to him.

විදුම්, පිළිස්සුම් ආදී පාරම්පරික වෛද්‍ය ක්‍රම ආරක්ෂා කරගෙන ඒවා දියුණුවට පත් කිරීමේ අභිලාෂයෙන් කට යුතු කරන මේ වෛද්‍ය පීඨයේ දියුණුවට රජය අත දෙන්නේද? මේ ප්‍රශ්න මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට සතුටුයි. මේ ප්‍රශ්න ගැන ඇත්ත වශයෙන්ම ගරු අගමැතිතුමාටත්, සෞඛ්‍ය ඇමතිතුමාටත්, අවශ්‍ය නම් අති ගරු ජනාධිපති උතුමාණන් වහන්සේටත් කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි. ආයුර්වේද ඇමතිතුමා දැන් මෙහි නැහැ. එතුමා. අපේ ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය විශ්ව විද්‍යාලයක් කිරීම සඳහා කටයුතු කරනවා වෙන්න ඇති. මම මේ කරුණු ඉදිරිපත් කරනවා.

I have given notice of a question to the Hon. Minister of Foreign Affairs—who is present here.

(1) Has the Government on behalf of the People of this country condemned the recent invasion of Lebanon by Israel?

(2) What action does the Hon. Minister propose to take to urgently discuss this invasion at a special session of the UNO?

(3) Will the Minister discuss with H. E. The President to make arrangements to send volunteers from Sinhala, Tamil and Muslim youths in Sri Lanka to fight for the Palestinian cause?

This has becone a very serious threat to world peace and I would like to ask the views of the Government on this matter.

**වී. එන්. නවරත්නම් මහතා (චාවකච්චේරි)**
*(திரு. வி. என். நவரத்தினம்—சாவகச்சேரி)*
(Mr. V. N. Navaratnam—Chavakachcheri)

Mr. Deputy Speaker, I have given notice of a question to the Hon. Minister of Foreign Affairs. The hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) has already referred to it. It relates to the situation in Lebanon, particularly to the Sri Lankans who are now resident in Lebanon, more particularly to the Sri Lankans who are alleged to have been taken as prisoners of war by the Israeli forces. The hon. Member for Gampaha wanted to know the position of the Government on this matter. Apparently, he does not see the 'Rupavahini'. Many of us have seen and listened on 'Rupavahini' to the comments made by our Hon. Minister of Foreign Affairs at the recent sessions of the United Nations on the Lebanese situation.

We of the Tamil United Liberation Front do not agree with the policies and politics of this Government on many matters, but there is one area in which we, and I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. එන්. නවරත්නම් මහතා]

daresay all political parties in the country, endorse and support the stand taken by the Government, particularly by the Hon. Minister of Foreign Affairs. This relates to the unequivocal support this Government is giving to the Palestinian people to establish a state of their own, and we are happy to note, particularly from the speeches made by the Hon. Minister of Foreign Affairs at the United Nations, that the Government of the people of this country endorse and support all steps taken by the Palestinians to establish a state of their own. We are particularly happy about this position because we know that a people fighting for liberation, fighting for the establishment of a state of their own, whether they be Palestinians or any other nation, should have the right to use all possible means to achieve their goal.

Mr. Deputy Speaker, you will appreciate that for us it is not merely an academic issue. We realize what it means for a nation which has no state to have a state of its own. There has been an invasion of Lebanon by Israeli forces and wanton destruction of lives and properties in that area. There are two categories of Sri Lankans who have been affected by this situation. We are all concerned about both categories, but I am particularly concerned aout the second category. The first category of Sri Lankans are those who have gone to Lebanon for employment. There are several hundreds of them. (*Interruption*) I will refer to them. There are several categories. They are now all without employment, without food, without shelter. We want to know from the Hon. Minister what assistance this Government is providing for these people. Do you have the statistics? What do you propose to do with them? May I suggest to the Hon. Minister that it is not desirable to bring them back to Sri Lanka. He should start discussions with the Foreign Employment division of the Ministry of Labour and make arrangements for these Sri Lankans who are now stranded in Lebanon to get employment in other states in this region.

It is the second category, Sir, to which the Hon. Minister of Cultural Affairs referred—those who have gone for training and war – that I am particularly interested in. It is the second category which we consider more important. They were Sri Lankans who apparently originally went to Lebanon for employment, but later decided to fight alongside the Palestinians in the war of liberation. We are proud that Sri Lankans, unlike people of other countries, do not give lip service to the Palestine war. Our youths have taken the noble and bold step of actively participating in this war. The whole country should be proud of them. They are national heroes in the true sense of the word— (*Interruption.*)

Yes. The tigers fighting for the liberation of Palestine. Tigers will fight for the liberation of every nation of the world which wants to establish a state of its own, whether it be Palestinians or the people of Eelam.—(*Interruption.*) We are not concerned with tigers, Sir, we are concerned with Sri Lankans who are fighting alongside Palestinians in their war of liberation.

Will the Hon. Minister find out who they are, try to get them released, and in the meantime support their families which are stranded there if we, the Government, the President and all of us, are sincere about the support we are giving to the cause of the Palestinian people. These young men—I do not know whether they are Sinhalese, Muslims or Tamils—are supposed to be Sri Lankans. The Hon. Minister will have details. Will he find out who they are, get them released and give them the necessary awards and medals?

අ. භා. 6.33

**ආර්. පී. විජේසිරි මහතා** (හාරිස්පත්තුව දෙවන)
(*திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்*)
**(Mr. R. P. Wijesiri—Second Harispattuwa)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ඊයේ ඇසීමටයි, කල් දී තිබුණේ. එහෙත් මට ඊයේ හදිසියේ යන්නට සිදු වූ නිසා අද එය අහන්නට මම බලාපොරොත්තු වෙනවා. හපුතලේ ගරු මන්ත්‍රීතුමා (වී. ජ. මූ. ලොකුබණ්ඩාර මහතා) මේ ප්‍රශ්නය මතු කළා. මම විශේෂයෙන්ම ඒ සම්බන්ධව කරුණු කීපයක් මතක් කිරීමට පමණයි, බලාපොරොත්තු වන්නේ.

පත්තර දෙකකින් කරුණු ගෙනහැර පාමින් ඒ ගරු මන්ත්‍රීතුමා පෙන් වූ ආකාරයට මම කියන්නට කැමතියි, ගැටඹේ රාජෝපවනාරාමයේ පෙරේදා දවස වන විට සැහෙන බාධක තිබුණු බව බෞද්ධයින්ට ඒ ස්ථානය වැඳ පුදා ගැනීමට. පෝය සීමාවට පවා ඇතුලු වන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතා ඒ ස්ථානයට ගොස් ඒ ස්ථානයේ ඇති වූ තත්ත්වය ඇසින් දැකලා දිසාපතිතුමාට, මහනුවර පොලිස් අධිකාරීතුමාට සහ ඒ ප්‍රදේශය භාර හමුදාවේ නිලධාරී මහත්වරුන්ට දැනුම් දීලා ඒ පෝය සීමාව වට කර ගසා තිබුණු වැට තාවකාලිකව ඉවත් කළා. එය ඉවත් කළ අවස්ථාවේ දිසාපතිතුමා දැනුම් දී තිබුණා ඊයේ උදේ හය වන විට නැවත වරක් කම්බි වැට ගහනවා කියා. අපි ගුවන් විදුලියෙන්, පත්‍රවලින් සහ රූපවාහිනියෙන් දැනගත්තා, එහි පාලනයේ අයිතිය විහාරාධිපති ස්වාමීන් වහන්සේගෙන් මහා නායක හාමුදුරුවන්ට පවරනවාය කියා. ඒ ගැන අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ මේ ස්ථානයේ ගරු ඇමතිතුමාත් සිටින නිසා මා මේ ඉල්ලීම කරනවා. එය විශාල බෞද්ධ ජනකායක් වැඳ පුදා ගන්නා ස්ථානයක් නිසා ඒ ස්ථානයේ අයිතිය කාට පැවරුණත් මගේ ඉල්ලීම අර කටුකම්බි වැට ඉවත් කර සිවිල් ඇඳුමින් සිටින ඒ හමුදා නිලධාරීනුත් එතැනින් ඉවත් කරන්නය කියන එකයි. එසේ කළොත් බලහත්කාරයෙන් ඇතුල් වීමක් හෝ වෙන යම් කරදරයක් හෝ එතන සිදු වන්නේ නැත කියා මම විශ්වාස කරනවා. මොකද එතන ඒ තරම්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සන්සුන්ව පවතින ස්ථානයක්. හමුදා නිලධාරීන් සිටීමත් එතන කටුකම්බි ගැසීමත් නිසා විශේෂයෙන්ම එය දැක බලා ගැනීමට විශාල වශයෙන් පිරිස රැස් වෙනවා. බෞද්ධයන් වශයෙන් අපට මදිකමක්, එවැනි ස්ථානයක් කටුකම්බි ගසා වෙන් කර තිබීම. අර අලුතින් ඉදිකරන ගොඩනැගිල්ල ඇතුළේ තමයි—ඒ සීමාවේ තමයි—පැරණි පෝය සීමා මාලකය තිබුණේ. මම හිතන විධියට රජයවත් නිලධාරීන්වත් එය නොදැන වෙන්නට ඇති කටුකම්බි ගසා වෙන් කර තිබෙන්නේ. පෙරේදා දවස වන විට ඒක තාවකාලිකව ඉවත් කළත් නැවත ඊයේ උදේ සිට වැට ගසනවා කියා දැනුම් දීලා තිබුණා.

මේ ප්‍රශ්නය ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම මම රජයෙන් ඉල්ලා සිටින්නේ, ඒ කටුකම්බි වැට ඉවත්කර එමෙන්ම හමුදා නිලධාරීනුත් එතනින් ඉවත් කරන ලෙසයි. අසිතිය කාට පැවරුණත් එය ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. එතන කිසිම ප්‍රශ්නයක් ඇති නොවන නිසා හමුදාව සහ කටුකම්බි වැට එතනින් ඉවත් කරන ලෙස මම රජයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.37

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)**

*(திரு. ஈ. எல். பி. ஹுருள்ளே — கலாசார அலுவல்கள் அமைச்சர்)*

**(Mr. E. L. B. Hurulle—Minister of Cultural Affairs)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා හපුතලේ ගරු මන්ත්‍රීතුමාටත් හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමාටත් ගැටඹේ විහාරස්ථානය ගැන ප්‍රශ්න දෙකක් මතු කිරීම ගැන. හපුතලේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ගිය මාසයේ 'ඇත්ත' පත්‍රයේ ප්‍රවෘත්තියක් කියවන්නට යෙදුණා. ගරු ජනාධිපතිතුමා ස්වාමීන් වහන්සේ නමකට අපහාස නොකළ බව එයින් හොඳටම ඔප්පු වෙනවා. මම විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි, අපේ ජනාධිපතිතුමාත් එතුමාගේ මැතිණියත්, 1962 දී කිසිම දේශපාලන පක්ෂයක නායකයෙක් කල්පනා නොකළ අවධියක, ඒ දෙපොළට අයිති ලක්ෂ ගණනක් වටිනා මානෙල් වතුයාය—අක්කර 42 ක් පමණ—වැලිවිට සංඝරාජ පරම්පරාවට පූජා කළ බව.

ඒ අවස්ථාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ නීති දමා තිබුණේ නැහැ. එතුමා ඒ නීතිවලින් බේරෙන්න නොවෙයි, එය කළේ. අවංකවම, බෞද්ධ ශාසනයේ දියුණුව පිණිස ඒ දේපොළ ඒ ඉඩම පූජා කළා. නමුත් සමහර දේශපාලන නායකයින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නීතිවලින් රිංගන්න ඕනෑ නිසා වන සත්ව උද්‍යාන අභයභූමි—සඳහා ඉඩම් පවරා දෙන බව ගැසට් මාර්ගයෙන් ප්‍රකාශයට පත් කළා. සමහර උදවිය ඉඩම් වික්කා. නමුත් අපේ අතිගරු ජනාධිපතිතුමා එහෙම දෙයක් කළේ නැහැ.

1962 කාලයේදී නීතියකට භයවෙන්න තත්ත්වයක් තිබුණේ නැහැ. මම මුලින් ප්‍රකාශ කළා වාගේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා නීති ඒ කාලයේ තිබුණේ නැහැ. බුද්ධ ශාසනයට විශිෂ්ඨ සේවයක් කළ වැලිවිට සංඝරාජ පරම්පරාවේ ස්වාමීන් වහන්සේලාට ඒ වටිනා ඉඩම පූජා කළේ අවංක සිතිනුයි. එපමණක් නොවෙයි. තමුන්නාන්සේලා හොඳාකාරවම දන්නා දෙයක් තමයි, ඉතිහාසය දෙස බලන විට පෙනෙන දෙයක් තමයි, මේ රට පාලනය කළ පක්ෂවලින් යම් පක්ෂයක් බුද්ධ ශාසනය දියුණු කරන්න කටයුතු කළා නම් හැමවිටම ඒ කළේ එක්සත් ජාතික පක්ෂය විසින් බව. නටබුන් වුණ ඒ සිද්ධස්ථාන සංරක්ෂණය කරන්නට ක්‍රියා කර තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. වෙන මොන පක්ෂයක්ද ඒ විධියට ක්‍රියා කර තිබෙන්නේ කියා මා තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තෙන්ම පුදුම විය යුතු කාරණයක් තිබෙනවා. ආගම අබිං වශයෙන් සැලකූ උදවියට, ඒ උදවියගේ පත්‍රවලට, මේ බුද්ධ ශාසනය ගැන අද ලොකු කැක්කුමක් ඇතිවී තිබෙනවා. ඒ උදවියගේ ඉතිහාසය දෙස ටිකක් කල්පනාව යොමු කළොත් තමුන්නාන්සේට මතක් කර දෙන්න පුළුවන් වේවි. ඒ උදවියගේ නායකයෙකු අනුරාධපුරයේ පවත්වන ලද දේශපාලන රැස්වීමකදී කළ කථාවක්. රුවන්වැලිසැයට ඇඟිල්ල දිගු කොට කිව්වා දුටුගැමුණු රජතුමා ගඩොල් මෝඩයෙක්ය, අපට බලය දුන්නොත් මේ ගඩොල් ටික අරගෙන තමුන්නාන්සේලාට, දුප්පත් ජනතාවට, වැසිකිළි සාදා දෙනවාය කියා. අන්න ඒ උදවිය තමයි, ඒ උදවියගේ පත්තර තමයි අද බුද්ධ ශාසනයේ ආරක්ෂකයන් වී සිටින්නෙ. මෙය පුදුමයක් නොවෙයි.

චීන මහජන ආණ්ඩුවේ ආරාධනයක් පිට, බෞද්ධ දූත පිරිසක් සමග එම රටට යන්න මට වාසනාව ලැබුණා. ඒ අවස්ථාවේදී, මාඕගේ විප්ලවය කාලයේ විනාශ කළ බෞද්ධ පිළිම, බෞද්ධ සිද්ධස්ථාන පෙන්වන්න අපිව එක්කරගෙන ගියා. වාසනාවකට මෙන් ඒ රටේ වර්තමාන රජය දැන් ඒවා නැවත සකස් කරගෙන යනවා. ඒ වගේම ඒ උදවිය මාක්ස්වාදී දර්ශනය දැන් ඈත් කර ගෙනයි ඉන්නෙ. ඒ රටේ උදවියට ආගමික නිදහස දීගෙන යනවා. පෞද්ගලික නිදහස ක්‍රම ක්‍රමයෙන් දීගෙන යනවා. නමුත් මේ රටේ ඔය මාක්ස්වාදය අනුගමනය කළ පිරිස අර පොතේ ගුරාල වෙලා ඉන්නවා. කවදාවත් එය වෙනස් කරන්නෙ නැහැ. අබිං කෑව වගේ උමතු වෙලයි ඉන්නෙ. තමන්ගෙ කල්පනාවේ හැටියට යම් තීරණයක් ගන්න බැහැ. පිට රටකින් අණක්, නියෝගයක් එන තුරු බලා ඉන්නවා. මේ රටට ගැළපෙන විධියට ප්‍රතිපත්තියක් සකස් කරන්න ඒ උදවියට ශක්තියක් නැහැ.

ඇත්තවශයෙන්ම ගරු මන්ත්‍රීවරුන් විසින් මේ කාරණය මේ සභාව තුළින් මේ රටේ මහජනතාවගේ සිත්වලට යොමු කරවන්න ඕනෑ. හේතුව, විශේෂයෙන්ම මහ මැතිවරණයක් ළඟ එන නිසයි. 1970 දීත්, 1969 අවසාන කාලයේදීත් මේ විධියේ දේවල් මේ විරුද්ධ පක්ෂයේ පත්‍රවලින් ප්‍රචාරය වුණා. ආගම් භේද අවුස්සන්න, ජාති භේද අවුස්සන්න, ඇමතිවරුන්ගෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එල්. බී. හුරුල්ලේ මහතා]

චරිත ඝාතනය කරන්න දැනටමත් පටන් ගෙන තිබෙනව. මා ගැනත් අසත්‍ය දේ ප්‍රකාශ කර තිබෙනව. ඒ සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීමට මම බලා පොරොත්තු වෙනව. [බාධාකිරීමක්] මන්ත්‍රීතුමා දන්න වනෙ ඒ පත්‍රය දැන් මුක්කු ගහන්නෙ සිරිමාට බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධ ශාසනය ආරක්ෂා කරන්නට, පෝෂණය කරන්නට මොන රජ යක්ද, මොන පක්ෂයක්ද ක්‍රියා කර තිබෙන්නෙ කියන කාරණය මහජනතාවට දැනගන්න ඕනෑ නිසයි ප්‍රථම යෙන්ම මම ඒ ගැන සඳහන් කළේ. 1977 සිට මේ දක්වා මගේ අමාත්‍යාංශයෙ මාර්ගයෙන් පමණක් නොවෙයි, අපේ ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමා ගෙත් උපදෙස් පරිදි, එතුමන්ලාගේ සහයෝගය ඇතුව බෞද්ධ ශාසනය දියුණු කරන්නට, පෝෂණය කරන්නට මේ රජය ක්‍රියාත්මක කර ඇති වැඩ පිළිවෙළ ගැන මහ ජනතාවට හොදාකාර දන්නව. ඒ හැරත් අපේ හපු තලේ මන්ත්‍රීතුමා (වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා) ප්‍රකාශ කළාත් මෙන් බෞද්ධ ශාසනයට පහරක් වදි නවා නම්, බෞද්ධ ශාසනය විනාශ කර දමන්න යම් කෙනෙක් ක්‍රියා කරනවා නම්, එහෙම නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂකයකු වශයෙන් මම තමයි පළමුවෙන්ම එයට විරුද්ධ වෙන්නට ඕනෑ කරන්නෙ. මෙයට වඩා ඒ ගැන මම කතා කරන්නට යන්නෙ නැහැ. මම මේවා ප්‍රකාශ කළේ පළමුවෙන්ම පාර්ලි මේන්තුවෙ මාර්ගයෙන් නියම තතු මහජනතාවට දැන ගන්නට සැලැස්විය යුතු නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලින් ප්‍රකාශ කළාක් මෙන් ප්‍රශ්නය මතු කළ මේ මන්ත්‍රීතුමන්ලා දෙපොළට මම ස්තුති වන්ත වෙනවා. අපේ මැදවච්චියෙ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) විසින් ගරුතර ජනාධිපති උතුමාණන් වෙත මේ මස 1 වන දින විදුලි පණිවුඩයක් එවනු ලැබුවා. ඒ විදුලි පණි වුඩයේ සඳහන් වුණේ මෙහෙමයි :

"මහනුවර ගැටඹේ රාජෝපවනාරාමය රජයට පවරා ගත් බව පුවත්පත් මගින් දැක ඉමහත් සේ කම්පාවට පත්වීමු. බුද්ධ ශාසනය ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දී ඇති ඔබ බෞද්ධයන්ගේ පූජනීය ස්ථානයක් මෙසේ පවරා ගැනීම ගැන අප්‍රසාදයත් කණගාටු වත් පළකරමු. මෙම ක්‍රියාව ගැන අප්‍රමාදව මැදහත් වී බෞද්ධ මහ ජනතාවගේ සතුටට හේතුවන පරිදි මෙම පවරා ගැනීම වහාම අව ලංගු කරන මෙන් රාමඤ්ඤ නිකායාරක්ෂක සභාවේ සභාපති හැටියට ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලමු.

මෛත්‍රීපාල සේනානායක, මැදවච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති."

ඒකට අපේ කොත්මලේ මන්ත්‍රීතුමා මොනවා කියයිද මම දන්නෙ නැහැ.

මෙම විදුලි පණිවුඩයට පිළිතුරු වශයෙන් ගරුතර ජනාධිපති උතුමාණන් විසින් පහත සඳහන් ලිපිය යවනු ලැබුවා :

"1982 ජූලි 02 වන දින,

කොළඹ දී ය.

මා ප්‍රිය මෛත්‍රී,

ඔබ විසින් මා වෙත එවන ලද විදුලි පණිවුඩය පිළිබඳව මේ ලිපිය ඔබ වෙත යොමු කරමි

මහනුවර ගැටඹේ රාජෝපවනාරාමය රජයට පවරා ගන්නා ලද බවට ඇතැම් පුවත්පත්වල පළ වූ ආරංචිය ගැන ඔබ විදුලි පුවතෙහි සඳහන් කරයි. ඔබට ලැබී තිබෙන ආරංචිය සාවද්‍යය.

එබඳු සිද්ධියක් සිදු වී නොමැත. ගැටඹේ කිසිම ආරාමයක් හෝ වෙනත් ඉඩමක් හෝ රජය පවරා ගෙන නැති අතර, එබන්දක් කිරීමට රජය බලාපොරොත්තුවක් ද නොමැත.

මම පහත සඳහන් නියෝග දෙක නිකුත් කෙළෙමි.

පළමුවැන්න නිකුත් කරන ලද්දේ මහනුවර දිසා ඇමතිතුමාගේ ලේකම්වරයාටය. මහනුවර මහ දිසාපති ද වන ඔහුට මා නියෝග කළේ ගැටඹේ තිබෙන රජයට අයිති කිසිවකු පදිංචි නැති ඉඩම් ආරක්ෂා කරන ලෙසය. මහජනයා ඒ ඉඩම්වලට මීට කලින් ආගමික හෝ වෙනත් කටයුතු සඳහා පිවිසුනේ නම් එම නිදහස දිගටම ආරක්ෂා කෙරේ. නීති විරෝධී අන්දමින් ඉඩම්වල පදිංචි වීමට හෝ ඒ ඉඩම්වලට බලහත්කාරයෙන් ඇතුලුවීමට පමණක් ඉඩ නොලැබේ. මේ නියෝගය ක්‍රියාත්මක කර ඇති අතර, මගේ දෙවැනි නියෝගය ක්‍රියාත්මක වන තුරු එය බලපවත්වනු ඇත.

මගේ දෙවැනි නියෝගය නිකුත් කරන ලද්දේ බෞද්ධ කටයුතු භාර කොමසාරිස්වරයාටයි. මා ඔහුට නියෝග කළේ රාමඤ්ඤ නිකායේ අති පූජ්‍ය මහානායක හිමියන් හමු වී, එම නිකායේ මහා නායක හිමියන් වශයෙන් රජයට අයිති ඉඩම් සඟ සතුකොට උන් වහන්සේට භාරදීමට ක්‍රියා කළ හැකි අන්දම කෙසේ දැයි සාකච්ඡා කරන ලෙසය අනාගතයේදී මේ දේපොලවල පාලනය පිළිබඳව උන්වහන්සේ දරන අදහස ද සැලකිල්ලට ගනු ලැබේ. මේ දෙවැනි නියෝගය ක්‍රියාත්මක වෙමින් පවතී.

ඔබ රාමඤ්ඤ නිකාය ආරක්ෂක සභාවේ සභාපති බව දන්වා ඇති හෙයින් මේ ගැන ඔබ සමඟ ද සාකච්ඡා කරන ලෙස මම බෞද්ධ කටයුතු භාර කොමසාරිස්වරයාට නියෝග කරමි.

මේ ඉඩම පවරා ගන්නා ලදැයි යන චෝදනාව ගැන ඔබ කණගාටු වට හා කම්පාවට පත්වූ බව මට පෙනී යයි. දැන් ඔබට මේ සැක සහ බිය ඉවත් කර ගැනීමට පුළුවන.

කෙසේ වුවද, පූජ්‍ය මාලේවන ඥානිස්සර. පූජ්‍ය දැවමොට්ටාවේ අමරවංශ සහ පූජ්‍ය මීටියාගොඩ ගුණරතන යන හිමිවරුන් කොළඹ සහ ගම්පහ ඇතුළු ප්‍රදේශවල, රජයෙන් උන්වහන්සේලාට පවරා දී තිබූ ඉඩම්වලින් බලහත්කාරයෙන් ඉවත් කරන ලද 1970-77 ඇමති මණ්ඩලයේ සාමාජිකයෙකුගෙන් මෙම ප්‍රකාශයන් නිකුත් වීම පුදුම සහගතය. උන්වහන්සේලා පන්සල්වලින් නෙරපන ලද්දේ බල හත්කාරයෙනි. මා මේ ගැන පාර්ලිමේන්තුවේදී කරුණු ඉදිරිපත් කළ විට ඔබගේ පක්ෂයේ මන්ත්‍රීවරු 'මාලේවනයා', 'දැවමොට්ටාවා' ආදී අපහාසාත්මක වචන කියමින් කෑගැසූ බව මෙහිලා සඳහන් කළ යුතුය.

1971 සමයේ භික්ෂූන් වහන්සේලා වෙඩි තබා මරා දමන ලද අතර, තවත් භික්ෂූන් කොටසක් නඩු විභාගයක් නොමැතිව සිරභාර යේ තබන ලදී.

දළදා මාලිගාව සතුව තිබූ මහ මළුව පවරා ගන්නා ලද්දේ ගැසට් නිවේදනයකිනි. මගේ රජය පළමුවෙන්ම කළ ක්‍රියාවලින් එකක් නම් එය ආපසු දළදා මාලිගාවට භාරදීමයි.

සිරිමා බණ්ඩාරනායක මහත්මිය මෙබඳු චෝදනාවන්ට වැරදිකාරිය වූ නිසා ජනාධිපති කොමිසම ඇගේ ප්‍රජා අයිතිය අහිමි කිරීමට නිර්දේශ කළේ ය. ඔබට මෙබඳු දඬුවමක් හිමි නොවීම ගැන ඔබ සන්තෝෂ විය යුතුය. බණ්ඩාරනායක මහත්මිය හුදකලාව දඬුවම් විඳින්නේ ඔබ ඇතුළු ඇගේ ඇමති මණ්ඩලය සාමූහික වගකීම පිට ගත් ක්‍රියා මාර්ගයක් නිසාය.

මෙයට,

ඔබගේ හිතවත්,

ජේ. ආර්. ජයවර්ධන,

ශ්‍රී ලංකා ජනාධිපති"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම ලිපියේ ඉංග්‍රීසි පිටපතක් හැන්සාඩ් වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා සභාගත කරනවා.*

ගරුතර ජනාධිපති උතුමාණන්ගේ උපදෙස් අනුව බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමා ලුම් මස 1 වැනි දින රාමඤ්ඤ නිකායේ අතිගරු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හමුවුනා. ඒ අවස්ථාවේදී අතිගරු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ලේකම් ස්වාමීන් වහන්සේද එතන සිටියා. ගැටඹේ රාජෝපවනාරාමය පිහිටා ඇති සියලුම ඉඩම් රජය සතු බවත්, එම ඉඩම්වලින් වැඩි කොටසක් නීත්‍යනුකූලව කිසිවෙකුටත් පවරා නොමැති බවත් කොමසාරිස්තුමා විසින් අති පූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට දන්වනු ලැබුවා. දැනට රජය සතු ඇති එම ඉඩම් සියල්ලම රාමඤ්ඤ නිකාය වෙනුවෙන් මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පූජා ඔප්පුවකින් පැවරීමට ගරුතර ජනාධිපති උතුමාණන් කැමැත්තෙන් සිටින බව ද මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට දන්වනු ලැබුවා. එසේ පූජා ඔප්පුවකින් එම ඉඩම් පවරා ගැනීමට මහා නායක ස්වාමීන්ද්‍රයන් කැමැත්ත දක්වන්නේදැ යි බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් තුමා විසින් විමසන ලදුව එසේ ඉඩම් පවරා ගැනීමට කැමති බැව් මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කොමසාරිස්තුමාට දන්වා තිබෙනවා. ඒ අනුව ඉතා ඉක්මණින් මේ ඉඩම් මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පවරා දීමට කටයුතු කරන බැව් දන්වන්නට කැමතියි.

මේ කරුණුවලින් හාරිස්පත්තුව 2 වැනි මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට අවශ්‍ය පිළිතුරු ලැබී ඇතැයි මා හිතනවා.

ගැටඹේ රාජෝපවනාරාමයේ උන්නතිය සඳහා අතිගරු ජනාධිපති උතුමාණන් ගේ අනුග්‍රහය සෑම විටෙකදීම ලබා දී ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය.

මහනුවර ගරු මන්ත්‍රී ඊ. එල්. සේනානායක මැතිතුමා විසින් කර තිබුණු ඉල්ලීමක් අනුව එක් වරක් අතිගරු ජනාධිපති උතුමාණන් ජනාධිපති අරමුදලෙන් රු. 50,000 ක මුදලක් ආධාර වශයෙන් ගැටඹේ ධම්චක්‍ර විද්‍යාපීඨය සඳහා ලබා දුන් බව මතක් කරන්නට කැම තියි. මෙම පරිත්‍යාගය සම්බන්ධයෙන් ගරු ලබුදූවේ සිරි ධම්ම හිමියන් විසින් ගරුතර ජනාධිපති උතුමාණන් වෙත එවන ලද ලිපියක මෙසේ සඳහන් වෙනවා:

"1980. 07. 22.

ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා,
ජනාධිපති මන්දිරය,
කොළඹ 1.

මෙත් සිතිනි.

ශ්‍රීමත් ජනාධිපති තුමනි,

**ගැටඹේ ධම්චක්‍ර විද්‍යාපීඨය සඳහා ජනාධිපති අරමුදලින් කරන ලද පරිත්‍යාගය**

ගරු කාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍ය ඊ. එල්. සේනානායක මැතිතුමන් කරන ලද ඉල්ලීම පරිදි පේරාදෙනියේ ගැටඹේ ධම්චක්‍ර විද්‍යාපීඨ ගොඩනැගිලි කටයුතු සඳහා ජනාධිපති අරමුලෙන් පරිත්‍යාග කරන ලද රුපියල් පනස්දාහ (රු. 50,000) ලැබුණු බවත්, ප්‍රත්‍යානුමෝදනා පූර්වකව පිළිගත් බවත් මෙයින් දන්වා සිටිමි.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය ප්‍රාර්ථනා කරමින් ගරු ඊ. එල්. සේනානායක අමාත්‍යතුමන්ගේ අනුග්‍රහය ඇතිව ඔබතුමන්ගේ ප්‍රධානත්වයෙන් අරඹන ලද ධම්චක්‍ර විද්‍යාපීඨයේ සියලු කටයුතු සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවත්නා බව දන්වා සිටිනු අතර, ඒ සඳහා මෙතෙක් ඔබතුමන්ගෙන් ලද අති විශිෂ්ය අනුග්‍රහය කෘතඥතා පූර්වකව නිතර සිහිපත් කරන බව ද කරුණාවෙන් දන්වා සිටිමි.

මේ බවට,
හිතකාමී,

ආචාර්ය ලබුදූවේ සිරිධම්ම හිමි,
ධම්චක්‍ර විද්‍යාපීඨාධිපති,
පේරාදෙනිය.

පිටපත්—
ගරු ඊ එල්. සේනානායක අමාත්‍යතුමා"

ගැටඹේ රාජෝපවනාරාමයේ භාරකරු වශයෙන් ගරු ලබුදූවේ සිරිධම්ම හිමියන් පත් කිරීමට විරුද්ධව ශ්‍රී සාමග්‍රී ධම්වර්ධන සමිතිය වෙනුවෙන් එම සමිතියේ නීතිඥවරයා වශයෙන් එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව—හෙක්ටර් කොබ්බෑකඩුව—මහතා විසින් 1958 මැයි මස 30 වැනිදා මහා භාරකාරතුමා වෙත යවන ලද ලිපියක් මා දැන් සභාගත කරනවා. එම ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන මෙන් ද මා ඉල්ලා සිටිනවා. මෙම ලිපිය ලියා ඇත්තේ ඉංග්‍රීසියෙනි. ගරු ලබුදූවේ සිරි ධම්ම ස්වාමීන් වහන්සේ රාජෝපවනාරාමයෙහි පදිංචි වී සිටින්නේ නීති විරෝධීව බලහත්කාරයෙන් බව එම ලිපියේ සඳහන් වෙනවා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

කොහොමද?

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
*(திரு. ஈ. எல். பி. ஹூருள்ளே)*
**(Mr. E. L. B. Hurulle)**

එම ස්වාමීන් වහන්සේ රාජෝපවනාරාමයෙහි භාරකරු වශයෙන් පත් කිරීමට විරෝධය පළ කරන බවත්, එම හිමියන් රාජෝපවනාරාමයෙන් පලවා හැරීම සඳහා නඩු මගට බැසීමට සාමාග්‍රී ධම්වර්ධන සමිතිය කටයුතු කරන බවත් එම ලිපියේ වැඩිදුරටත් සඳහන් කර තිබෙනවා. ඔබතුමා දන්නා පරිදි කොබ්බෑකඩුව මහතා පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබල ඇමතිවරයෙකුව සිටි කෙනෙක්. තවද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කෘෂිකර්ම සහ ඉඩම් ඇමතිතුමා වශයෙන් 1970 සිට 1977 දක්වාම පසුගිය රජයේ කටයුතු කළ බව ඔබ දන්නා කරුණකි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදව්ය ගරු ලබුදූවේ සිරි ධම්ම හිමියන් සම්බන්ධයෙන් ඒ අවධියේදී දක්වන ලද ආකල්පය මෙම ලිපියෙන් මනාව පැහැදිලි වෙනවා. ඒ ලිපිය ලියා තිබෙන්නේ ඉංග්‍රීසියෙනුයි. මම එය කියවන්නම්.

---

* කථාව අවසානයේ පළකර ඇත.
*உரையிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**[ඊ. එල්. බී. හුරුල්ලේ මහතා]**

"H. S. R. B. KOBBEKADUWA, M.M.C.
PROCTOR & NOTRY

12, Deva Vidiya,
KANDY 30th, May 1958

------

PRIVATE ADDRESS :
14, AMPITIYA ROAD,
KANDY.

The Public Trustee.
Colombo.

Dear Sir,

RAJOPAWANARAMAYA–GETAMBE–PERADENIYA
Ref. No. BT 194KD

I am instructed by the Trustee of the Sri Samagiri Dharmawardhana Samitiya to inform you that the above premises are under the control of the said Samithiya and that Rev. Labuduwe Sri Dhamma who is now in possession of the said premises in a trespasser. The Samithiya is given to understand that action is been taken by you to appoint the said priest as a Trustee of the said premises but I am instructed to state that the Samithiya is filing action against this priest to have him ejected from the said premises. I shall be much obliged if you will withhold action till the matter is decided by a cqurt of Law ; otherwise it will be prejudicial to the action which the Samithiya proposes to institute.

Yours faithfully,
H. Kobbekaduwa."

නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පිළිතුරෙන් තමුන්නාන්සේටත්, තමුන්නාන්සේගේ මාර්ගයෙන් මුළු රටටත් නියම තතු අවබෝධ වන්නට ඇතයි මා විශ්වාස කරනවා. විශේෂයෙන් කොත්මලේ මන්ත්‍රීතුමාට මේ අවස්ථාවේ දී මතක් කරන්න ඕනෑ ; මොහොතකට කලින් මම කියෙව්වේ එතුමන්ලාගේම ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙක්, එතුමන්ලාගේ වර්තමාන නායකයෙක්, ජනාධිපති තරඟයට ඉදිරිපත් වන එතුමන්ලාගේ අපේක්ෂකයා වන හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ලියූ ලියුමක් බව. ආචාර්ය ලබුදූවේ සිරිධම්ම ස්වාමීන් වහන්සේ ඒ ඉඩමේ පදිංචි වී සිටින්නේ බලහත්කාරයෙන්ය කියා එම ලියුමේ සඳහන් වී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

1958 දී, තමන් පෙනී සිටි කණ්ඩායමේ නීතිඥයා වශයෙනුයි, එතුමා ඒ ලියුම ලියා තිබෙන්නේ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
*(திரு. ஈ. எல். பி. ஹுருள்ளே.)*
(Mr. E. L. B. Hurulle)

එදා කොබ්බෑකඩුව මහතා ඒ ස්වාමින් වහන්සේ හඳුන්වා දී තිබෙන්නේ, "Trespasser" කියායි. එවැනි ලියුම් ලියූ උදවිය තමයි, බුද්ධ ශාසනයේ ආරක්ෂකයන් වශයෙන් පෙනී සිටින්න දැන් උත්සාහ කරන්නේ.

අද අපේ ඡන්දදායකයන් මෝඩයන් නොවෙයි. විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් උදවිය ඔවුන් මෝඩයන් හැටියට කල්පනා කළත් 1977 ජූලි මහා මැතිවරණයේ දී අපේ ඡන්දදායකයන් ඒ උදවියට නියම විධියට පිළිතුරු දුන්නා. ඉදිරියටත් නන්න්වය එසේම බව මතක් කරන අතර අර විධියේ බොළඳ ප්‍රකාශ නොකරන හැටියට ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**සභාමේසය මත තබන ලද ලියවිල්ල :**
*சபாபீடத்து வைக்கப்பட்ட ஆவணம் :*
*Document tabled.*

"2nd July, 1982.

My dear Maithri,

I am replying to your telegram referring to the alleged take over by the State of the Rajopavanaramaya at Getambe, Kandy, as reported in a certain newspaper. You have been misinformed.

No such event has taken place. The State has not taken over any Aramayas or any other lands at Getambe and it does not intend to do so.

I have given two directions.

One to the Secretary to the District Minister, Kandy, who is also the Government Agent to protect State lands at Getambe which are not occupied. The public will be allowed access to them for any purpose they used them earlier worship or otherwise. No illegal occupation or tresspass will be permitted. This direction has been carried out and will be continued until my second direction is accomplished.

My second direction was for the Commissioner of Buddhist Affairs to meet the Venerable Mahanayake Thero of the Ramanna Nikaya and discuss with him how the ownership of these State lands could be vested on behalf of the Maha Sangha in him as Head of the said Nikayas. His views with regard to their future management will also be ascertained. This direction is being carried out.

As you say you are the Chairman of the Ramanna Nikaya Arakshaka (Protection) Society I will direct the Commisioner to discuss with you also.

I note your regret and sorrow about this alleged take over. You can now set your mind at ease.

However, I should mention that these statements come with ill gracerom a Member of the Cabinet of 1970-77 which forcibly took over lands granted by the State to Ven. Malewana Gnanissara, Ven. Devamottawa Amarawansa and Ven. Meetiyagoda Gunaratna among others in Colombo and Gampaha and elsewhere. They were chased out of their temples by force.

When this matter was raised by me in Parliament the Venerable Bhikkus were abused and referred to as 'Malewanaya', 'Devamottaya' by Members of Parliament of your Party. During 1971 several Bhikkus were shot and others were in prison without trial.

The Maha Maluwa the property of the Sacred Dalada Maligawa was taken over to the State by Gazette Notification. One of the first acts of my Government was to return it to the Dalada Maligawa.

The Presidential Commission found Mrs. Sirima R. D. Bandaranaike guilty of similar acts and she was deprived of her civic rights. You should be happy that you escaped a similar fate.

Mrs. Bandaranaike is undergoing punishment in solitude for acts you as a Member of her Cabinet was collectively responsible.

Maithripala Senanayeke Esqr,. M.P.
51, Jawatta Road,
Colombo 5."

Yours Sincerely,
J. R. Jayewardene,
President of Sri Lanka.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා,
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The Hon. Acting Minister of Parliamentary Affairs.

ඩී. ඊ. තිලකරත්න මහතා
(திரு. டீ. ஈ. திலகரத்ன)
(Mr. D. E. Tillekeratne)

On behalf of the Hon. Prime Minister, I wish to reply as follows to the question asked by the hon. Member for Kalawana (Mr. Sarath Muttetuwegama) regarding those employees who failed to report for work in July, 1980 : The Government has mentioned on the Floor of the House on more than one occasion the procedure that has been decided upon to grant redress to them. Many of them have been re-employed and back-wages are also paid to those who are entitled on the basis of the decision of the Government.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The Hon. Minister of Health.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)
(டாக்டர் ரஞ்சித் அத்தபத்து—சுகாதார அமைச்சர்)
(Dr. Ranjith Atapattu—Minister of Health)

With regard to the question raised by the hon. Member for Kalawana, it is correct that some para medical personnel in some institutions in the Department have absented themselves from work on the 6th and 7th of July, 1982. The hon. Member for Kalawana mentioned that they have taken trade union action but in my opinion there is no trade union action because the Government or the Ministry has not been informed of any proposed trade union action before this step was taken.

2. It is not correct that they had written to me on the 17th of June, 1982 regarding this. The joint Council of the Board of Management, the representatives of the Government Radiographers, Physiotherapists, Medical Lab Technicians and Pharmacists have addressed a letter dated 17.6.82 to the Secretary of the Ministry. He has replied to the Joint Council on 28.6.82.

3. Regarding the question whether I would take reasonable steps to effect a settlement, the answer is 'Yes', but I would like to add on this occasion that I would have expected this trade union, having received a communication from the Secretary, if they were not satisfied with the answer that they got from him, to have at least asked for an interview from me. I have never refused in my short time as Minister to meet any representative or any trade union except, of course, Buddhist priests representing nurses, to interview, and if this particular trade union has the decency to follow the norms of trade union practice of writing to me regarding their problems, I would have certainly given them a hearing as I have given several trade unions during the last few days.

I deeply regret therefore this hasty action that has been taken. I have instructed all the institutions, where they have been working, that those who come back to work will have to present proper medical certificates from the Department of Health which only should be acceptable to us. After that, if these unions have any problems they can write to me and after discussion I am willing to look into any of their problems.

Mr. Deputy Speaker, can I also take this opportunity to reply to the hon. Member for Kopay ? I might add, regarding this same issue raised by the hon. Member for Kalawana, that this group of employees of the Health Ministry have very recently been absorbed into the new level called the Middle Level Technical Service which has been agitated for several years and as a result they have got some financial benefit. As a matter of fact, some of them got back wages amounting to Rs. 10,000 and Rs. 15,000. They have got several of their demands earlier and there are a few outstanding demands which they have asked for. As a matter of fact, some of them have been discussed with the Treasury and they were on the verge of giving those things to us when this sudden and hasty action was taken. They have also asked for private practice. I do not know the attitude of the hon. Member for Kalawana on that matter.

Further, on the other question raised by the hon. Member for Kopay about an allegation that a certain individual has assaulted an employee of the Health Department, I am making inquiries into the matter and I can assure this House that prompt action will be taken if such an incident has taken place.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

Mr. Deputy Speaker, the question raised by the hon. Member for Kopay is that whether I am aware that the Department of Irrigation has imposed a fine of Rs. 1,500 an acre on the farmers of Kilinochchi. I wish to answer that by saying categorically that there is no decision of the Department of Irrigation to impose any fine on anybody.

But there has been a decision, I must say, taken by the Government Agent at the last 'Kanna' meeting held that a fine of Rs. 1,500 an acre should be imposed on the farmers at Kilinochchi who cultivate an acreage in excess of the acreage that was authorized. A 'Kanna' meeting is normally held before the commencement of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී දිසානායක මහතා]

the cultivation season as provided for in the Irrigation Ordinance. The Iranamadu Tank, which he referred to, has 24,000 acre feet of water in storage and the area that was recommended was 10,000 acres to be ultivated, but the cultivators after this meeting, having accepted the decision, ignored the advice and the decision that was made and have commenced cultivating 11,725 acres of land. In 1980 Yala a similar decision had been made and a charge of Rs. 1000 an acre was levied for excess acreage cultivated. But, if it is the position of the hon. Member for Kopay that this decision should be reveiwed, I shall certainly give that directive to the Government Agent.

ඒ. සී. එස්. හමීඩ් මහතා (විදේශ කටයුතු ඇමතිතුමා)
(ஜனாப் ஏ. ஸி. எஸ். ஹமீத்—வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(Mr. A. C. S. Hameed—Minister of Foreign Affairs)

Sir, I have two questions about the situation in Lebanon, one raised by the hon. Member for Chavakachcheri and the other by the hon. Member for Gampaha. Though the two questions share a certain degree of similarity, still, I think, they also differ in content and scope. So, I would like to answer them differently.

The hon. Member for Chavakachcheri has asked whether I have been able to ascertain the names of Sri Lankans who are now destitute in Lebanon, what steps we have been able to take to assist them to return to Sri Lanka and how many Sri Lankans have been taken as prisoners of war by Israel and what steps have been taken to get them released. Now especially because there is a situation of war in Lebanon, communication with Lebanon is interrupted and it is very difficult. I have tried several sources for obtaining information about Sri Lankans in Lebanon, but we have met with very little success. I am now exploring the possibility of sending an officer to Cyprus to see whether he could liaise with the authorities there to obtain information about Sri Lankans and also to help them if necessary. I am really appreciative of the feelings of the relations in Sri Lanka who are anxious to obtain information.

With regard to the second question, on a request made by me the British Embassy in Beirut has undertaken to repatriate any Sri Lankan who wants to return. The Government of Sri Lanka will be meeting the full costs of such repatriation. Twelve Sri Lankans who have sought repatariation from the British Embassy in response to this arrangement, have so far returned to Sri Lanka. I would like to thank the British Government for having assisted us in this operation.

Thirdly, I do not know how many Sri Lankans have been taken as prisoners of war. It is very difficult to find out whether, in the first instance, Sri Lankans have been taken as prisoners of war and whether they are being held as prisoners of war. I remember there was only one news item which appeared in the " New York Times " which said that there were Sri Lankans among those who were taken as prisoners of war by Israel. Here again, we are trying to verify whether this news item is correct. I should like to say that the general picture is still not a clear one. I have reason to believe that Sri Lankans in Lebanon know something about our arrangements with the British Government, because some of those who have returned from Lebanon have told my officers that they contacted the British Embassy in Beirut after they heard a news broadcast which advised Sri Lankans seeking to return to Sri Lanka to get in touch with the British Embassy in Beirut.

That is the amount of information that we could obtain with regard to the questions raised by the hon. Member for Chavakachcheri, and if there is any more we shall certainly keep him informed.

The hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) too has raised certain questions. He wants to know whether the Government has condemned the recent invasion of Lebanon by Israel, what action I propose to take to urgently discuss this invasion at the Special Session of the UNO, and whether I would discuss with His Excellency the President to make arrangements to send volunteers from Sinhala, Tamil and Muslim youths in Sri Lanka to fight for the Palestinian cause.

Sir, with regard to condemning the invasion of Lebanon, you know a statement was issued in Colombo expressing our concern over the Israeli invasion of Lebanon. I also spoke on this matter at the United Nations in New York during the Special Sessions on Disarmament.

Sri Lanka co-sponsored a resolution, which was adopted by 127 to 2 votes, at the resumed Special Sessions of the United Nations General Assembly, which was convened on 25th of June to discuss the Israeli invasion in Lebanon. We co-sponsored it. This resolution calls for an immediate ceasefire and withdrawal of all Israeli Forces from Lebanon. It also called on Member States and International Agencies to provide all humanitarian aid possible for the victims of Israel's invasion of Lebanon.

Now, Sir, with regard to the third aspect of the question about making arrangements to send volunteers from this country, I must say no. It is not the intention of the Government to send volunteers from Sinhala, Tamil and Muslim youths in Sri Lanka to fight for the Palestinian cause.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සි. පී. ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු ඇමතිතුමා)**

*(திரு. ஸி. பீ. ஜே. செனெவிரத்ன—தொழில் அமைச்சர்)*

(Mr. C. P. J. Seneviratne—Minister of Labour)

Mr. Deputy Speaker, regarding the question raised by the hon. Member for Kalawana, initially I must remind him that there was no strike on the days mentioned by him. If he first accepts that position, I will reply to his remaining question. On the premise that there was no strike I will point out to the hon. Member concerned that, in his own words in the question asked from me, he points out that the private sector firms have dismissed those who failed to turn up for work following the declaration of an emergency and an Essential Services Order in July, 1980.

Well, if they defied an Essential Services Order and failed to turn up for work – I think they yet continue to fail to turn up for work – and if they defied such an Essential Services Order, they have foregone the right to be re - employed. And in that same question he says that His Excellency has given a directive.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා** (කලවාන)

*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*

(Mr. Sarath Muttetuwegama—Kalawana)

Yes.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මහතා**

*(திரு. ஸி. பீ. ஜே. செனெவிரத்ன)*

(Mr. C. P. J. Seneviratne)

As far as I am aware there was no such directive. Well, however, if he insists that there was one, I will look into it and take appropriate steps. (*Interruption.*) Well, that is what I say, that there was no such directive. Therefore, the next thing that could be done is to look into this matter. But then, even to look into this matter from a labour point of view, there is no industrial dispute here. Nobody has so far made representations to us about any of them having been dismissed. However, if the hon. Member so desires, I will yet look into it and see what could be done.

අ. භා. 7.16

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (වැඩබලන ආහාර හා සමූපකාර ඇමතිතුමා)**

*(திரு. சரத்சந்திர ராஜகருணா — பதில் உணவு, கூட்டுறவு அமைச்சர்)*

(Mr. Sarathchandra Rajakaruna—Acting Minister of Food & Co-operatives)

නියෝජ්‍ය කථානායකතුමනි, රත්තොට ගරු මන්ත්‍රීතුමා (පී. බී. කවිරත්න මහතා) නැගූ ප්‍රශ්නයට අදාළ ප්‍රවෘත්තිය 1982 ජූලි 04 වැනි දා 'දිවයින' ඉරිදා සංග්‍රහයේ පළ වී තිබෙනවා මාත් දැක්කා. ඒ ප්‍රවෘත්තිය එවන්නය කියා අතිගරු ජනාධිපතිතුමා මගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා නැහැ. එම නිසා ප්‍රවෘත්ති පත්‍ර වාර්තාකාර මහතුන්ටත්, ප්‍රවෘත්ති පත්‍ර අයිතිකාර මහතුන්ටත් කියන්න කැමතියි, අපේ ආණ්ඩුව විසින් මේ ගරු සභාවේ කිසිම මන්ත්‍රීවරයෙක් සමූපකාරයක සභාපති කමකට හෝ අධ්‍යක්ෂ තනතුරකට හෝ පත් කොට නැති බව. එහෙම නම් කොහොමද, අපේ මැති-ඇමතිවරුන්ගේ නම් සමූපකාර දූෂණවලට ගෑවෙන්නේ කියා මා අහන්න කැමතියි.

රත්තොට ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එවැනි ප්‍රවෘත්ති පළ කරන්නේ, මහා මැතිවරණය කිට්ටු නිසා එහිදී වාසි ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් මඩ මඩ ගැහීමක් වශයෙන් බව පෙන්වා දෙන්න ඕනෑ. ඒ විධියේ අසත්‍ය ප්‍රවෘත්ති පළ වුණත් මේ දියුණු කාලයේ දී වැඩි දවසක් යන්න කලින් ඒවායේ සත්‍යතාවය දැන ගන්න මහජනතාවට අවස්ථාව ලැබෙන බවත් කියන්න ඕනෑ. පසුගිය ඉරිදා ඒ බොරුව පළ වුණත්. අද-බදාදා සත්‍ය තත්ත්වය මොකක්ද කියා එළි වුණා. දිවයින' පත්‍රයටත් 'ඇත්ත' පත්‍රයටත් නොදෙවෙනි තැනක් ලැබෙනවා, මේ විධියට වැඩ කළොත් නම්.

මෙම වාර්තාවේ කිසිම සත්‍යතාවයක් නැති බව මම නැවත වරක් මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමතියි. ඒ වගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, මේ පත්‍රයේ කර්තෘතුමා තමුන්නාන්සේගේ කාර්යාලයට ගෙන්වා මෙවැනි බොරු ප්‍රවෘත්ති සපයන අපේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙක් සිටිනවා නම් ඒ නිලධාරියා කවුදැයි සොයා බලා කරුණාකර ඒ ගැන අපටත් වාර්තා කරන අතර, මෙවැනි බොරු ප්‍රවෘත්ති පළ නොකරන ලෙස ඒ පත්‍ර කර්තෘවරුන්ට දැනුම් දෙන්න කියා. ඒ වගේම ඒ ප්‍රවෘත්තියේ අසත්‍යතාවය අද මම ප්‍රකාශ කළ විධියට ඒ පත්‍රයේ පළ කරවන්න කටයුතු යොදන ලෙසත් මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.19, ට 1982 ජූලි 8 වන බ්‍රහස්පතින් දා අ. භා. 3 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி, பி. ப. 7.19 மணிக்கு பாராளுமன்றம், 1982 ஜூலை 8, வியாழக்கிழமை பி.ப. 3 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.19 p.m. until 3 p.m. on Thursday, 8th July, 1982.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සැ. යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන ඒවා එහි පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1982 ජූලි මස 21 වන බදාදා**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.**

---

**குறிப்பு**

*அங்கத்தினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு*

***1982 ஜூலை 21, புதன்கிழமைக்குப் பிந்தாமற்***

**கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

---

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

**not later than**

**Wednesday, 21st July 1982**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா: ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions:** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org